# අරුණ

2023 ජුලි 12 බදාදා | හතර වැනි කාණ්ඩය | 242 කලාපය | මිල රු 60.00 | www.aruna.lk



**පුවත්පත**
**නිවසටම ගෙන්වා ගැනීමට**
දැන්ම අමතන්න : 0761 367 623
නැතිනම් මෙම කේතය ස්කෑන් කර තොරතුරු ලබා දෙන්න


## සංක්‍රමණිකයන් 300ක් අත්ලාන්තික් සාගරයේ අතුරුදන්

▸▸09 පිටුවට

## බූස්ස අධි ආරක්ෂිත බන්ධනාගාරයේ සිටි

# කුඩු ජාවාරමුන් 16ක් ඇප අරන් රට පැනලා

## ඇපකරුවන් අත්අඩංගුවට ගැනීමට සූදානමක්

■ තිස්ස රවීන්ද්‍ර පෙරේරා

බූස්ස අධි ආරක්ෂිත බන්ධනාගාරයේ රඳවා සිටි මහා පරිමාණ මත්ද්‍රව්‍ය ජාවාරම්වලට සම්බන්ධ පාතාල ප්‍රබලයන් අතරින් ඇප ලබා ගිය දහසය දෙනකු රටින් පැන ගොස් ඇතැයි බුද්ධි අංශ කළ දීර්ඝ විමර්ශනයකින් අනාවරණය වී ඇත.

▸▸02 පිටුවට



කොටලීයට බැරල් වැටක්..

ඡායාරූපය - නිමල් ජයරත්න-මනම්පිටිය

## පර්මිට් නැති බස්වලට ලක්ෂ 5ක දඩයක්

### හොර බස් පස්සේ CIDය පන්නයි

■ සාලිය කුමාර ගුණසේකර

මගී බලපත්‍ර රහිතව අවිධිමත් හා අයථා ලෙස ධාවනය කෙරෙන උතුරු,නැගෙනහිර සහ උතුරු මැද පළාත්වල බස් රථවලට විරුද්ධව කටයුතු කිරීමට පොලිසිය,අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව සහ බුද්ධි අංශ සමග ඒකාබද්ධ වැඩපිළිවෙළක් සකස් කරන බව කැබිනට් මාධ්‍ය ප්‍රකාශක,ජනමාධ්‍ය, ප්‍රවාහන හා මහා මාර්ග අමාත්‍ය ආචාර්ය බන්දුල ගුණවර්ධන පැවසීය.

▸▸02 පිටුවට

## රිජ්වේ අටේ වාට්ටුව මග හැරිය වෛද්‍යවරුන්ට පරීක්ෂණ

■ වරුණී පෙරමුණ

කොළඹ රිජ්වේ ආර්යා ළමා රෝහලේ අටේ වාට්ටුවේ නේවාසික රෝගී දරුවන්ට ප්‍රතිකාර කිරීමට නොපැමිණ වෛද්‍යවරියක් ඇතුළු වෛද්‍යවරු තිදෙනකු රාජකාරි පැහැර හැරීම සම්බන්ධව අමාත්‍යංශය මට්ටමින් පරීක්ෂණයක් සිදුකරන බව සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් වෛද්‍ය අසේල ගුණවර්ධන පවසයි.

▸▸02 පිටුවට



## කපන්නද ඇහුවම හා කිව්වා

### පඬු කරඳ ගහ ගැන බන්දුල කියයි

■ සාලිය කුමාර ගුණසේකර

දරළුව ප්‍රදේශයේ තිබූ පඬු කරඳ ගස කැපීමට කැබිනට් අනුමැතිය ලබාදෙන ලෙස තමා කැබිනට් මණ්ඩලයට දැනුම් දුන් බවත්, පඬු කරඳ ගස් ඕනෑ තරම් තිබෙන නිසා මෙම ගස කපා දැමීමට කැබිනට් මණ්ඩලයේ අනුමැතිය ලැබුණු බවත් කැබිනට් මාධ්‍ය ප්‍රකාශක, ජනමාධ්‍ය, ප්‍රවාහන හා මහා මාර්ග ඇමැති බන්දුල ගුණවර්ධන පැවසීය.

▸▸02 පිටුවට

## පාසල් ළමයින් දැක හල්දුම්මුල්ල මීහරක් කුලප්පුවෙති

■ සමන් පාලිත - හල්දුම්මුල්ල

හල්දුම්මුල්ල බත්ගොඩ දී ඊයේ (11වැනිදා) අලුයම පාසල් යමින් සිටි සිසුන් පස් දෙනකු පසුපස මීහරක් රංචුවක් පැන්නීමෙන් තුවාල ලැබූ එම දරුවන් හල්දුම්මුල්ල දිසා රෝහලට ඇතුළත් කළ බව පොලිසිය කියයි.

▸▸02 පිටුවට

## PC නෝනයි-සැමියයි-නෑනයි පොලිසියේදී ජල්ලියක් අල්ලලා

■ තිස්ස රවීන්ද්‍ර පෙරේරා

පැමිණිල්ලක් විභාග කරන අතරේ පොලිස් ස්ථානය තුළ කලහකාරී ලෙස හැසිරෙමින් අඩ දබර කරගත් පොලිස් කාන්තාවක් සමග ඇයගේ සැමියා හා සැමියාගේ සහෝදරිය අහංගම පොලිසිය අත්අඩංගුවට ගෙන ඇත.

▸▸02 පිටුවට

## ඩීසල් පැන්නූ ලංගම ලොක්කෙක් ගැන පරීක්ෂණ

■ එෆ්. අස්ලම්

▸▸02 පිටුවට

## පිළියන්දල පොලිසියේ රැඟූ ASPගේ යෙහෙළිය පැමිණිල්ල අස්කරගනී

■ බිමල් ජයසිංහ - බණ්ඩාරගම

රෙදිපිළිවලට අදාළ රුපියල් 10,200 ක ගනුදෙනුවක් සම්බන්ධයෙන් ඉක්මන් විමර්ශනයක් සිදු නොකළ බව පවසමින් පිළියන්දල පොලිසියට පැමිණ එහි නිලධාරීන්ට බලපෑම් කළ සහකාර පොලිස් අධිකාරීවරයාගේ හිතවතිය විසින් සිය පැමිණිල්ල ඉල්ලා අස්කරගෙන ඇති බව ගල්කිස්ස කොට්ඨාසයේ උසස් පොලිස් නිලධාරියෙක් පැවසීය.

▸▸02 පිටුවට


## බස්නාහිර පාසල් 32ක මේස පුටු 6000ක් හෙල්ලෙයි

■ සාලිය කුමාර ගුණසේකර

බස්නාහිර පළාත් සභාව යටතේ පාලනය වන පාසල් 32 ක මේස සහ පුටු 6265ක් අබලන් තත්ත්වයේ පවතින බව අනාවරණය වේ.

▸▸02 පිටුවට

## මෛත්‍රී ගෙවන්න පටන් ගනී



■ කේ.එස්. උදයකුමාර

පාස්කු ඉරුදින ත්‍රස්ත ප්‍රහාරයක් එල්ල කිරීමට සූදනම් වන බවට බුද්ධි තොරතුරු ලැබී තිබියදීත් එම ත්‍රස්ත ප්‍රහාරය වළක්වා ගැනීමට කටයුතු නොකිරීමෙන් මූලික මිනිස් අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම වෙනුවෙන් රුපියල් මිලියන 100ක වන්දියක් ගෙවන ලෙස හිටපු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේනට ශ්‍රේෂ්ඨාධිකරණය කරන ලද නියෝගයට අනුව ඔහු වන්දි වශයෙන් රුපියල් මිලියන 15 ක මුදලක් ගෙවා ඇතැයි ඔහුගේ නීතිඥවරු මෝසමක් ගොනු කරමින් ශ්‍රේෂ්ඨාධිකරණයට දැනුම් දී තිබේ.

▸▸02 පිටුවට

## ගෙදරට ආ ආගන්තුකයා දස හැවිරිදි දරුවාට සිවු මස් බිලිඳෙක් දී යන්න ගිහින්

■ බිමල් ජයසිංහ - බණ්ඩාරගම

හොරණ ගල්ඒදඬුගොඩ ප්‍රදේශයේ නිවසකට පැමිණි පුද්ගලයෙක් සිව් මසක කුඩා බිලිඳෙකු, දස හැවිරිදි දරුවකු වෙත භාරදී පලාගොස් ඇතැයි හොරණ මූලස්ථාන පොලිසිය කියයි.

▸▸02 පිටුවට




## ෂාෆ්ටර්ගේ විද්වත් කමිටුව මහනුවර යයි

■ ඉෂාර රත්නකාර



ආන්දෝලනයට තුඩු දී ඇති ව්‍යාපාරික දිනේෂ් ෂාෆ්ටර්ගේ මරණයට හේතුව අවසන් වශයෙන් නිගමනය කිරීමේ විද්වත් කමිටුවේ විශේෂ සාකච්ඡාවක් මෙම මස 22 සහ 23 යන දිනවල මහනුවරදී පැවැත්වීමට නියමිතය.

▸▸02 පිටුවට

## බොරු මහාප්‍රාණ

යමක් සකු පදයක් නම් එහි මහාප්‍රාණයක්, සංයුක්තාක්ෂරයක් බැරි නම් අඩු ම තරමේ යංශයක්, රේඵයක්, රකාරාංශයක් වත් තිබියැ යුතු යැ යි කෙනෙක් කල්පනා කෙරෙති. මේ මහා මුළාවෙකි. එකී එක දු වර්ගයක අකුරක් ඇතුළත් නොවන පද රැසක් සකුවේ තිබේ. අද බස් දෙස් තීරුවෙන් අප විමසන්නේ එබඳු සකු පද කිහිපයක ලියන බොරු මහාප්‍රාණ ගැන ය.

### 'ප්‍රස්ථාර' ලෙස බොරු මහාප්‍රාණ එපා

ගණිතයේ 'graph' යනුවෙන් හැඳින්වෙන ඇඳීම සිංහලයෙන් හඳුන්වන්නේ 'ප්‍රස්තාර' යනුවෙනි. වැඩි දෙනෙක් මෙහි මහාප්‍රාණ ථා යනු යොදා 'ප්‍රස්ථාර' යනුවෙන් ලියති. ඒ සාවද්‍ය යි. සංස්කෘත භාෂාවේ පැතිරීම් අරුත්හි 'ස්තෘ' ක්‍රියා ප්‍රකෘතියට 'ප්‍ර-' උපසර්ගයත් '-අ' ප්‍රත්‍යයයත් ගැන්වීමෙන් නිපැයෙන කෘදන්ත නාම පදය 'ප්‍රස්තාර' යනු යි. එහි අරුත 'මනා කොට පැතිරෙන දෙය' යනු යි. ප්‍රස්තාරයෙකින් සිදු කැරෙන්නේ යම් දත්ත සංහිතාවෙක පැතිරීම මනා කොට දැක්වීම බැවින් මේ නාමය ඊට අන්වර්ථ යි. මෙහි 'ස්තෘ' ක්‍රියා ප්‍රකෘතියේ ඇත්තේ අල්පප්‍රාණ ත යන්නක් බැවින් 'ප්‍රස්තාර' යන්නෙහි දු යෙදියැ යුත්තේ අල්පප්‍රාණ තා යන්න යි. එබැවින් 'ප්‍රස්ථාර' ලෙස බොරු මහාප්‍රාණ ලිවීම සාවද්‍ය වේ.

### 'චුම්බන' යන්නෙහි දු යෙදියැ යුත්තේ අල්පප්‍රාණ බ යනු ම යි

විද්‍යාවේ 'magnet' යන්න සඳහා සිංහලයෙන් යොදා ඇත්තේ 'චුම්බක' යන්න යි. වැඩි දෙනෙක් මෙහි දු මහාප්‍රාණ භ යනු යොදා 'චුම්භක' යනුවෙන් ලියති. ඒ සාවද්‍ය යි. සංස්කෘත භාෂාවේ සිඹීම් අරුත්හි 'චුම්බ්' ක්‍රියා ප්‍රකෘතියට '-අක' ප්‍රත්‍යයය ගැන්වීමෙන් නිපැයෙන කෘදන්ත නාම පදය 'චුම්බක' යනු යි. එහි අරුත 'සිප ගන්නා; ඇදැගන්නා' යනු යි. චුම්බකයෙකින් කැරෙන්නේ තමා වෙතැ යකඩ ඇදගෙන සිප ගැනීම බැවින් මේ නාමය ඊට අන්වර්ථ වෙයි. 'චුම්බ්' ක්‍රියා ප්‍රකෘතියේ නැති බොරු මහාප්‍රාණ භ යන්නක් යොදා 'චුම්භක' යනුවෙන් ලිවීම ඒ අනුව සාවද්‍ය වෙයි. 'චුම්බක' මතු නො ව 'චුම්බන' යන්නෙහි දු යෙදියැ යුත්තේ අල්පප්‍රාණ බ යනු ම යි.

### හරි විදිහට 'ලම්බක' ලියමු

ගණිතයේ 'perpendicular' යන්න සඳහා සිංහලයෙන් යොදන්නේ 'ලම්බක' යනු යි. වැඩි දෙනෙක් මෙහි දු මහාප්‍රාණ භ යන්නක් යොදා 'ලම්භක' යනුවෙන් ලියති. ඒ සාවද්‍ය යි. සංස්කෘත භාෂාවේ එල්ලීම, එල්ලා වැටීම ආ අරුත්හි 'ලම්බ්' යන ක්‍රියා ප්‍රකෘතියට '-අක' ප්‍රත්‍යයය ගැන්වීමෙන් 'ලම්බක' යන කෘදන්ත නාම පදය සිද්ධ වේ. යමක සිට තවත් මතු පිටක් තෙක් එක එල්ලේ එල්ලා වැටෙන බෙත්මක් හැඳින්වීම සඳහා මේ පදය නිසි වෙයි. එහෙත් එහි මහාප්‍රාණ භ යන්නක් යෙදීමට හේතුවෙක් නො පෙනේ. එහි යෙදියැ යුත්තේ ඊට මුල් වූ ක්‍රියා ප්‍රකෘතියෙහි ඇති අල්පප්‍රාණ භ යන්න බැවිනි. මෙහෙයින් නිවැරැදි වන්නේ අල්පප්‍රාණ බ යනු යොදා ලියන ලම්බ, ලම්බක, ලම්බන, ආලම්බන ආදිය යි. මේ පද කිසිවකට බොරු මහාප්‍රාණ යෙදිය නොහැකි බව අප සිතට ගත යුතු ය.

අදට ඔය ඇති;
නැවත හමු වෙමු.



ganushka@4-drive.com

▼ ක. ක. ගනුෂ්ක රන්දුල

# නවකතා ලිවීම දැන් ගෘහ කර්මාන්තයක් මට්ටමට ම ඇවිත්



මහාචාර්ය
ලියනගේ අමරකීර්ති

■ මේ නවකතාවේ ප්‍රධාන රූපකමය සංකේතය 'කැළල' හැම පාඨකයෙක්ට ම බැඳෙන්න පුළුවන් අදහසක්

**මහාචාර්ය ලියනගේ අමරකීර්ති නවමු සාහිත්‍ය සංකල්පවලින් සිංහල සාහිත්‍යය පෝෂණය කරන සාහිත්‍යකරුවෙකි. නවකතාව, කවිය සහ කෙටිකතාව විෂයයේ පාඨක සහ විචාරක අවධානය දිනාගත් නිර්මාණකරුවෙකි. ඔහු විසින් ලියා පළ කරන ලද ශාස්ත්‍රීය ග්‍රන්ථ මෙරට සාහිත්‍ය කතිකාවට කරන බලපෑම සුවිශේෂීය. 'කැළලිකාරයෝ' (විදර්ශන ප්‍රකාශන) මහාචාර්ය අමරකීර්ති ගේ නවතම ප්‍රබන්ධය යි. මේ ඒ ගැන 'අරුණ - ධාරා' ඔහු සමග කළ සංවාදය යි.**

**කෆ්කා ලිව්වෙ රාත්‍රී කාලයෙ. ෂෝන් පෝල් සාත්‍රෙ කියනව ඔහු එක වැකියක්වත් නොලියූ දවසක් නැති බව. මුරකාමි නවකතාවක් ලියද්දි උදේ හතරට ඇහැරිලා පැය හතරක් ලියනව. ඔබත් බොහෝ ලිවීම් සහ කියවීම්වල ඉන්න අයෙක්. ඔබ ලියන්නෙ මොන වෙලාවට ද? නිර්මාණ ආවේශය ඔබට එන්නෙ කොහොම ද?**

ගොඩක් තරුණ අය ඔය ප්‍රශ්නය මගෙන් අහනව. කියවීම, ලිවීම, ඉගැන්වීම හැර මම වෙන මොනවත් කරන්නෙ නැහැ. වෙනත් සමාජීය වැඩ වුණත් කරන්නෙ අර තුනට මූලිකත්වය දීල. ඒ නිසා තියෙන වෙලාව මම ටිකක් පරිස්සමට කළමනාකරණය කරගන්නව. ලියන වෙලාව කියල ගත්තොත් මම පොතක වැඩ කරන කාලයෙදි මට පොඩි ආවේශයක් තියෙනව. ඒක වැඩක් පටන්ගත්ත ම ඉවර කරන්න ඕන කියන හැඟීමක්. ඒක නිසා මම පාන්දර 4.00ට 4.30ට විතර ඉඳගත්ත ම ලෙක්චර් එහෙම නැත්නම් දවසට පැය හත අට එක දිගට වැඩ කරනව.

ඔබේ ප්‍රශ්නයෙ දෙවැනි කොටසට උත්තර දෙද්දි මට මතක් වෙන්නෙ ඇමරිකානු ලේඛක පිලිප් රොත්. ඔහු කියනව හරි ලස්සන කතාවක්. ඒ තමයි Perspiration නැත්නම් දඩිය දැමීම නිසා තමයි Inspiration - ආවේශය, ආනුභාවය එන්නෙ කියල. මේක තව සරල කරල කියනව නම්, 'වෙහෙස වෙලා වැඩ කිරීම පිටිපස්සෙන් තමයි ආවේශය එන්නෙ.' නවකතාකාරයො සම්බන්ධයෙන් තමයි ඔහු මේ කතාව කියන්නෙ. මම හිතනව ඒක නම් හරියට ම හරි. නිතර ම ඉගැන්වීම, මොනව හෝ ලිවීම, සාහිත්‍ය කලාව ගැන ම වැඩ කරමින් සිටීම තමයි මම දඩිය දන්න කරන වැඩේ. ඒ තමයි මගේ වෙහෙසවීම. ඒක පිටිපස්සෙන් තමයි නිර්මාණ ආවේශය එන්නෙ.

**ඔබේ අභිනව නිර්මාණ ආවේශය තමයි 'කැළලිකාරයෝ'. ඔබ මේ කතාව කියන්නෙ චරිතවල අභ්‍යන්තරයට ම පාඨකයා ගෙන යමින්. දීපිකා, සමන්, සමින්ද, ගිම්හානි, සුරංජන්, දිලිනි, ආදිත්‍ය... ඇත්තට ම කොහොම ද මෙච්චර හොඳට ඔබ ඔවුන්ව හඳුනන්නෙ...?**

මිනිස් පැවැත්ම ගැන හිතන්න මම කැමැති මාන දෙකක් තියෙනව. එකක් තිරස් මානය. ඒ කියන්නෙ සමාජයේ මතුපිට මිනිස් පැවැත්ම. අනෙක් මානය සිරස් පැවැත්ම. ඒ තමයි චරිත අභ්‍යන්තරික මානය. පුද්ගල විඥානය ඇතුළට යන මානය. කතාවක් ගොඩනගද්දි හෝ මනුස්සයන් ගැන කතාකරනකොට අපිට අහුවෙන්නෙ තිරස් මානය විතරක්නම්, ඒ අදාළ පුද්ගලයන් ගැන මතුපිට දේවල් විතරයි අපට හමුවෙන්නෙ. අඳින පළඳින හැටි, වැඩකරන්නෙ කොහෙ ද? ගමන් බිමන් මොනව ද? වගේ දේවල්. හැබැයි සිරස් මානය ගැන හිතනව නම් අභ්‍යන්තරික ලෝකය කොයි වගේ ද කියන එකත් හිතන්න වෙනව. ඔය මාන දෙක නොහිතා හොඳ ප්‍රබන්ධ රචකයෙක් වෙන්න බැහැ.

ඉතින් ඒ වගේ ම තමයි නවකතාව වැනි කලාවකදි සමාජයක සහ යුගයක හරස්කඩක් අල්ලගන්න ඕන. ඒ හරස්කඩ අල්ලගන්න සමහරවිට එක විදිහක චරිතයකින් බැහැ. ඒ හරස්කඩේ විවිධ ස්ථාන නියෝජනය කරන විවිධ චරිතවල අර තිරස් සහ සිරස් මාන දෙක ම එක්ක අල්ලගන්න ඕන. මම සමාජයත් එක්ක ගොඩක් ගනුදෙනු කරන කෙනෙක්. විශ්වවිද්‍යාල ආචාර්යවරු විතරක් ඇසුරු කරන කෙනෙක් නෙමෙයි. සාමාන්‍යයෙන් දවස් කුලියට වැඩකරන කම්කරුවා ගෙ ඉඳන් නොයෙක් ආකාරයේ චරිත ඇසුරු කරනව. එතකොට මම ඒ චරිතවල මතුපිට සහ අභ්‍යන්තර කියන දෙක ම ගැන ටිකක් හිතනව. ඒ නිරීක්ෂණ ශක්තිය අතින් මම තියුණු කෙනෙක්. ඔබ ඔය කිව්ව චරිත, මතුපිට සහ අභ්‍යන්තරය සහිතව අහුවෙලා තියෙනව නම් ඒක තමයි හේතුව.

**කතාව පුරා ම ඉන්න සමන් දයාවංශ, ඔහු කියවද්දි මට දැනුනෙ විරාගයේ අරවින්දව. දීපිකාට තමන් ගෙ ප්‍රේමය ප්‍රකාශ කිරීමෙදි සමන් පසුගාමියි. සමන් දයාවංශ ගොඩනැගීමේදි අරවින්ද අවිඥානිකව හෝ ඔබේ මනසේ හිටිය ද?**

මට ඒක සෘජුව ම කියන්න බැහැ. හැබැයි 'විරාගය' මම කැමැති නවකතාවක්. ඒ වගේ ම ජීවිතයේ තමන්ට ලැබිය යුතුයි කියල හිතන දේවල් පැනල, පොරකාලා නොගන්න චරිත මම ඕන තරම් දැකල තියෙනව. අපේ හැම ගමක ම ඉන්නව විවාහ නොවුණු කෙනෙක්. එක්තරා ආකාරයකට අරවින්ද වගේ චරිත විරාගයෙන් ගමට එනවට වඩා ගමෙන් විරාගයට තමයි එන්න ඇත්තෙ. මට අවිඥනිකව විරාගයෙ බලපෑමක් තිබුණ ද, නැද්ද කියල මම හරියට දන්නෙ නෑ. හැබැයි සවිඥනිකව විරාගයත් එක්ක අන්තර් පඨිතමය සම්බන්ධයක් ගොඩනගල නෑ. කවුරු හරි කෙනෙක් කියනව නම් අරවින්ද ගෙ බලපෑමක් සමන් දයාවංශට තියෙනව කියල, මම ඒක පිළිගන්න අකැමැති නෑ.

■ අරවින්ද වගේ චරිත විරාගයෙන් ගමට එනවට වඩා ගමෙන් විරාගයට තමයි එන්න ඇත්තෙ

**කතාව මුලදි ම සියදිවි නසාගත්තත් ගිම්හානි මේ කතාව පුරා ම ජීවමානයි. ගිම්හානි ගේ සියදිවි නසා ගැනීම අපේ රටේ ගුරු භූමිකාවේ බේදනීය පැතිකඩක්. ගිම්හානි වගේ පාසල් සිසුවියන් සියදිවි හානිකර ගැනීමේ සිදුවීම් නූතන සමාජයේ නිතර නිතර වුණා. ඔබ ගිම්හානිව කතාවට ගේන්නෙ ඒ බේදවාචක දැකල ඒවායින් ඇතිවුණු කම්පනයන් නිසා ද?**

ඔව්, අපේ අධ්‍යාපන ආයතන ඇතුළෙ ප්‍රේමය, ලිංගිකත්වය සම්බන්ධයෙන් ගුරුවරු, විදුහල්පතිවරු, විනය කම්ටු දරන අදහස් නිසා අධ්‍යාපනයෙන් එළියට තල්ලුවෙලා ගිය හෝ දිවි නසාගත් අය මම දැකල තියෙනව. ගිම්හානි ඔස්සේ එක්තරා ආකාරයකට සබුද්ධික දැනුම ගැන කුතුහලයක් තියෙන, තමාගේම ශරීරය ගැන, ජීවිතය ගැන කුතුහලයක් තියෙන කෙල්ලෙක්ට මොකක් ද වෙන්න ඉඩ තියෙන්නෙ කියන එක ගවේෂණය කරන්න මම ටිකක් උත්සාහ කළා.

**යොවුන් ප්‍රේමයේ ජීව විද්‍යාත්මක කැමැත්තයි, සංස්කෘතික කැමැත්තයි අතර ගැටුමක් දීපිකා, ගේ චරිතය ඇසුරින් මා දකිනව. දීපිකා සමින්දව තෝරාගැනීම ගැන කරන පාපොච්චාරණයෙදි ඒක දැනෙනව. ඇත්තට ම ලාංකීය සමාජය ඇතුළෙ යොවුන් ප්‍රේමය සංස්කෘතික සීමාවන් අතර හිරවෙලා ද? එය සමාජ බේදයක් බවට පත්වෙලා ද?**

මම හිතන්නෙ ඔව් කියල. කොහොමටත් 'කල්චර්' සහ 'නේචර්' අතර ගැටුම හුඟක් පරණයි. ඒක ගැන ප්‍රොයිඩ් පොතක් පවා ලිව්ව Civilization and it's discontents කියල. ඒකෙදි ප්‍රොයිඩ් කිව්වෙ ශිෂ්ටාචාරය කියල අපි බාරගන්න දේ ස්වභාවික මනුෂ්‍ය ජීවවිද්‍යාත්මක පැවැත්මට කොතරම් බාධා කරනවද කියල. ඒ බාධා කිරීම නිසා මනුෂ්‍ය ජීවිතය කොයිතරම් දුකට ඇද වැටෙනව ද කියල. ලංකාවෙ මෑත කාලයෙ නව ලිබරල් පරිභෝජනවාදය නිසා පේන්න තියෙන දේ තමයි රූපවාහිනී මාධ්‍යයෙන්, සමාජ මාධ්‍යයෙන් මේ හැම එකකින් ම කායික ආශාව කිතිකවන දේවල් කියන අතරේ තරුණ පරම්පරාවට ජීවත්වෙන්න වෙලා තියෙන්නෙ ඉතා ම ගතානුගතික සංස්කෘතික සීමාවන් ඇතුළෙ. මේ දෙක අතර ගැටුම ලංකාවේ අනෙක් ඒවට වඩා තීව්‍ර කියල මට හිතෙනව. එතනදි සංස්කෘතික සීමාවන් ලිහිල් කළ යුතුයි කියන යෝජනාව මම කරන්නෙ නැහැ. දීපිකා තමන් ගෙ ශරීරය, ශරීරය විදිහට බාරගන්නව. ඒක සංස්කෘතික හිරගෙදර දන්නෙ නැහැ. ඇයට ආදරය කිරීමයි, ඉගෙන ගැනීමයි අතර ගැටුමකුත් නෑ. අමතර බාධා ආවෙ නැත්නම් ඇයට වෛද්‍ය පීඨයට පවා යන්න තිබුණ.

■ 'කල්චර්' සහ 'නේචර්' අතර ගැටුම හුඟක් පරණ යි

**ආදිත්‍ය, කතාවට එන්නෙ අවසානභාගයේ වුණත්, ඔහු මුළු කතාව ම ආක්‍රමණය කරනවා. එතෙක් පාඨක හදවතේ, මනසේ ජීවත්වුණු සමන්, සුරංජන් පවා අමතක කරවනව. ආදිත්‍ය ඔබ හඳුනන සැබෑ චරිතයක් ද?**

නෑ, එහෙම දන්න නිශ්චිත චරිතයක් නෙමෙයි. පරිකල්පිත චරිතයක්. හැබැයි මගේ මිතුරු සමාගමේ පේරාදෙණිය වෛද්‍ය පීඨයේ ආචාර්යවරු, මහාචාර්යවරු, වෛද්‍යවරු ඉන්නව. ඒ වගේ ම විද්‍යාව ගැන, ලෝකයේ සහ ජීවිතයේ රහස් ගැන කල්පනා කරන විද්‍යාඥයොත් මම එදිනෙදා ජීවිතයෙ ඇසුරු කරනව. ඒ හැමෝම ටික ටික ආදිත්‍ය ඇතුළෙ ඇති. ගැඹුරු, පරිණත මනුෂ්‍ය සංවාදයක් පිරිමියෙක් සහ ගැහැනියක් අතර වෙන්න පුළුවන් ද කියන එක, නැත්නම් ස්ත්‍රී පුරුෂ සම්බන්ධය කායික මොහොත ඉක්මවා බුද්ධිමය මොහොතකට යන්නෙ කොහොම ද? ගියොත් මොනවා වෙයි ද? කියන එක තමයි ආදිත්‍ය සහ දීපිකා සම්බන්ධයෙන් ගවේෂණය කරන්නෙ.

**කැළලි ගැන කියන මේ කතාව ආරම්භයෙදි ඔබේ නළලේ තියෙන කැළලක් ගැනත් කියනව. මේ කතාව ඇතුළෙ ඔබේ කැළලිත් තියෙනව ද?**

අනිවාර්යයෙන් ම තියෙනව. මගේ ඇඟේ තියෙනව තුවාල කැළලි විසි දෙකක්. ඒ විසිදෙකට ම කතා විසිදෙකක් තියෙනව. මම ග්‍රාමීය දුප්පත් පවුලක බොහො ම දුෂ්කර පසුබිමක හැදුණ වැඩුණු කෙනෙක්. ඒ නිසා මගෙ ඇඟේ එහෙම තුවාල කැළලි ඇතිවෙන එක පුදුමයක් නෙමෙයි. මේ නවකතාව උපදින්නෙ මගේ ම ඇඟේ තියෙන තුවාල කැළලි ගැන ආවර්ජනයකින්. නවකතාවක් කියවන වැඩිහිටි පාඨකයො කාගෙත් ඇඟේ කොතැනක හරි කැළලක් තියෙනව. අඩු ම තරමේ පෙකණියවත් තියෙනව. ඒ නිසා මම හිතනව මේ නවකතාවේ ප්‍රධාන රූපකමය සංකේතය 'කැළල' හැම පාඨකයෙක්ට ම බැඳෙන්න පුළුවන් අදහසක් කියල.

**"උගත් නවකතාවක් ඔස්සේ ගිම්හානිගේ ජීවිතයේ සංකීර්ණතා දකින්න ඔහුට හැකියාවක් නෑ" මේ දීපිකා සමින්ද ගැන හිතන විදිහ. ඒ විදිහට ජීවිතයක සංකීර්ණතා දකින්න තරම් නවකතා අපිට තියෙනව ද?**

■ ජීවිත අත්දැකීම් තේරුම් ගැනීමේ ආකෘතියක් බවට පත්කරගන්න තරම් නවකතාව අපේ ජීවිතවලට ළංවෙලා නෑ

ඒක ඇත්තට ම හොඳ ප්‍රශ්නයක්. මට එක්වරම උත්තරයක් දෙන්න අමාරුයි. හැබැයි ගොඩක් සිංහලට පරිවර්තනය වෙලා තියෙනවනෙ ගැඹුරු නවකතා. ඒවාගෙන් ජීවිතය දිහා බලන්න එළියක් ලැබෙනව. අපේ නවකතා ගත්තොත් 'විරාගය', 'චරිත තුනක්', 'සුද්දිලාගේ කතාව' වගේ පොත් තියෙනව.

හැබැයි එදිනෙදා ජීවිතය ඇතුළෙ තමන් ගෙ අත්දැකීම් තේරුම් ගැනීමේ ආකෘතියක් බවට පත්කරගන්න තරම් නවකතා අපේ ජීවිතයට ළංවෙලා නෑ. වෙස්සන්තර කතාව අපේ ජීවිතයට කොයි තරම් මුල් ඇදලද කිව්වොත් ඇතැම් සිදුවීම්වලදි අහවලා වෙස්සන්තර වගේ කියල කතාවටත් කියනව. වෙස්සන්තර කතාව දෙයක් තේරුම් ගන්න රාමුවක් බවට පත්කරනව. ඒ තරමට ජන ජීවිතයට නවකතා ළංවෙලා තියෙනව කියල සිංහල සමාජයෙදි දකින්න තියෙන්නෙ අඩුවෙන්. උගත් කෙනෙක් කියන්න පුළුවන් ඔයා නිකං විරාගයෙ අරවින්ද වගේ කියල. දෙවුන්දරා වගේ කියල. එහෙම මුල් බැහැපු නවකතා කිහිපයක් තියෙනව. ඒ වුණත් දීපිකා, සමින්ද, ආදිත්‍ය, සමන් මුහුණ දෙන අත්දැකීම් වටහාගන්න ඒ අයට උදව් කරන්න තරම් සිංහල නවකතාවක් නෑ.

**ඔබ ඔය කියන අදහසත් එක්ක මතක් වුණේ පුවත්පතකට එරික් ඉලයප්ආරච්චි ලියූ ලිපියක කොටසක්. ඒක සමාජ මාධ්‍යයේ සංසරණය වුණා. "අධි ප්‍රකාශනය සහ අධිප්‍රචාරණය නිසා ඇතිවී තිබෙන්නේ අඩුකියවීමයි. ප්‍රශ්නය වී තිබෙන්නේ නවකතා සංඛ්‍යාව පාඨකයන් සුළු පිරිසක් පසුපස හඹායෑම නොවේ. නවකතා විශාල සංඛ්‍යාවක් ඇවිත් පාඨකයන් පන්නා දැමීමයි." ඔබ මොකක්ද මේ ගැන කියන්නේ...?**

ඔය කතාව ඔය විදිහට කියද්දි ඇත්තක් තියෙනව. නවකතා ලිවීම දැන් ගෘහ කර්මාන්තයක් මට්ටමට ම ඇවිත් තියෙනවනෙ. හැබැයි ලියන්න ආස අයට, කතා කියන්න ආස අයට ඒවා ලියන්න එපා කියන එක හරි නෑ. නවකතා පළවිය යුත්තෙ කොච්චරක්ද කියල බැහැරින් නීති රීති පැනවීම හොඳ නෑ.

එරික් කියන දේට හේතුව තමයි අපිට සක්‍රිය විචාර සංස්කෘතියක් නැතිවීම. පළවෙන විශාල නවකතා අතරින් තීරණාත්මක නවකතා මතුකරල, බර දේ මොනවද කියල විශේෂයෙන් මතුකරගන්න තියෙන ක්‍රමය මදි අපේ රටේ. පාඨකයත් එක්ක සංවාදයක් ඇතිකිරීමේ විචාර සංස්කෘතියක් අපිට ඕන. ඉස්සර 'ලක්බිම' පත්තරේ හිටිය තිස්ස ප්‍රේමසිරි කියල මහත්මයෙක්. ඔහු ජනප්‍රිය, සරල චිත්‍රපට ගැන පවා ලිව්ව. උදාහරණයකට සරල ආදර කතාවක් තියෙන රොමැන්ටික් නවල්ස් සමහර වෙලාවට ඒවා මල්කතා කියලත් හඳුන්වනව. ඒවා උපශානරයක් විදිහට අරගෙන ඒවා අතරින් හොඳ දේවල් තියෙනව නම්, ඒ ගැන විශේෂයෙන් ලියන විචාරකයො අපට නෑ. ඒක ලොකු අඩුවක්.






▼ සංවාදය - ලක්මාල් බෝගහවත්ත

## 'ගිනිපිග් කළේ ඇයි නුඹ මා කොරෝනා' එළිදැක්වීම අද

ආචාර්ය උපුල් ප්‍රියන්ත ගමගේ විසින් රචිත 'ගිනිපිග් කළේ ඇයි නුඹ මා කොරෝනා' කෘතිය එළිදැක්වීම අද (12ද) සවස 2.30ට හෝමාගම, පිටිපන පිහිටි බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයීය පුස්තකාලයේදී පැවැත්වේ. බීජිංහි හිටපු ශ්‍රී ලංකා තානාපති යෝගනාදන් කන්දසාමි සහ ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ උපකුලපති මහාචාර්ය නෙලුවේ සුමනවංස හිමියන් ගේ ප්‍රධානත්වයෙන් පැවැත්වෙන මෙම උත්සවයේ දේශන චින්තන රණසිංහ සහ කපුගොල්ලෑවේ ආනන්දකිත්ති හිමියන් විසින් පැවැත්වීමට නියමිතය. උපුල් ප්‍රියන්ත විසින් රචනා කරන ලද 'වාග්විද්‍යා ප්‍රවේශය' කෘතියද එදින එළිදැක්වීමට නියමිතය.




## සඳ එළිය දිගේ

### කර්තෘ - මහගම සීලානන්ද හිමි

ශාස්ත්‍රපති පූජ්‍ය මහගම සීලානන්ද හිමියන් ගේ නවතම කාව්‍ය වෑයම 'සඳ එළිය දිගේ' පසුගියදා එළිදැක්විණි. 'මෙම කාව්‍ය සංග්‍රහය විවිධාකාර ඉසව්වලින් මානව හිතවාදීව මනුෂ්‍යත්වය දෙස බැලූ තියුණු ගවේෂණාත්මක දෘෂ්ටියක් නිරූපණය කරන කෘතියක් බැව් පෙනී යයි. එසේම සොබාදහම ඇසුරුකොට කරන ලද නිර්මාණ බොහෝමයක් ද මෙහි වෙයි. (යමුනා මාලනී පෙරේරා). එමෙන්ම මෙම කෘතියට පසු වදනක් සපයන කිවියර මහින්ද ප්‍රසාද් මස්ඉඹුල "අපූරු භාෂා වියමනක් සහිත කවි පෙතක් වන මෙහි භාවිත ගුණ කැපී පෙනෙයි' යනුවෙන් සඳහන් කරයි. මෙය සූරිය ප්‍රකාශනයකි.



# අප්‍රිකාවෙන් ආ ජිරාෆ්ලා බිම ඉඳගෙන ගිමන් හරී


බිම ඉඳගෙන සිටින ජිරාෆ්ලා


■ අනීෂා මානගේ

අප්‍රිකාව නිජබිම කරගත් ජිරාෆ් සතුන් ලංකාවේදී අපට දැකගන්නට හැකි වනුයේ දෙහිවල සතුන්වත්තේදී පමණය. ඒ ජිරාෆ් සතුන් බිම හිඳගෙන සිටින ආකාරයයි.

දෙහිවල සත්වෝද්‍යානයේ සේවකයන් පවසන්නේ ඉතා දිගු පාද හා දිගු ගෙලක් හිමිවීම නිසාම ජිරාෆ් සතුන් බොහෝ විට උත්සාහ කරන්නේ බිම හිඳගැනීමෙන් වැළකී සිටීමටයි. බිම හිඳගතහොත් නැවත නැගිටීමට අපහසු වීමද උන් බිම හිඳනොගෙන සිටීමට හේතුවකි.

එහෙත් පසුගිය දිනෙකදී දෙහිවල සතුන්වත්තේ සිටින ජිරාෆ් සතුන් දෙදෙනා බිම හිඳගෙන සිටි ආකාරය දැක ගන්නට හැකිවිණි.






නාට්‍යවල කොටස්

# රුපියල් 150ට නාට්‍ය හතරක් එකම වේදිකාවක


ඇන්ටනි විජේරත්න

■ විජේරත්න හල්බලුව - හාරිස්පත්තුව

රුපියල් එකසිය පනහක් වැනි සුළු මුදලකට එකවර වේදිකා නාට්‍ය හතරක් පෙන්වන නාට්‍යවේදියකු සොයා කටුගස්තොට ශාන්ත අන්තෝනි රඟහල වෙත ගියේ ලද තොරතුරකට අනුවය. රඟහල වෙත යන අවස්ථාවේද මෙම නාට්‍යවේදියා තම ගෝල බාලයන් සමග දහවල් දෙළහට පැවත්වෙන නාට්‍ය ප්‍රදර්ශනය කිරීමට ඇවසි වේදිකාව සකසමින් සිටියේය. ඔහු රාජ්‍ය සම්මාන දිනූ නාට්‍යවේදී ඇන්ටනි විජේරත්නය.

"මම මේ කරන්නේ අප රටේ පාසල්වල නාට්‍ය හා රංග කලාව හදාරන සිසුන්ට යම්කිසි දැනුමක් ලබාදීමේ වෑයමක්. අද පාසල්වල නාට්‍ය හා රංග කලාව විෂයක් හැටියට උගන්වනවා. නමුත් එම විෂය හදාරන සිසුන් අතර වේදිකා නාට්‍යක් නොබැලූ සිසුන් ඕනෑ තරම් ඉන්නවා. මොකද අද වේදිකා නාට්‍යයක් බලන්න ටිකට් එකකට රුපියල් දෙදහක් විතර වියදම් කරන්න ඕනෑ. ඒක පවතින ආර්ථික තත්ත්වයත් එක්ක ළමයින්ට


නළු නිළි කැළ

දරාගන්න බැහැ. ඒකයි මම මේ වෑයමේ නිරත වෙලා ඉන්නේ. මම දරුවෙකුගෙන් රුපියල් එකසිය පනහක් ගන්නෙත් මේ වැඩේට වැයවන වියදම පියවා ගන්න. යැයි

මෙම කලාකරුවා කතාබහට එක්වුණේ එලෙසින්ය. වැඩිදුරටත් අදහස් දැක්වූ ඇන්ටනි විජේරත්නයන්,

"දෙදිනක් වේදිකා නාට්‍ය හතරක් පාසල් සිසුන් වෙනුවෙන් පෙන්වනවා. මේ නාට්‍ය හතර රීතින් හතරකට අයත්. ඒවා මෙසේ වෙන්කර දක්වන්න පුළුවන්. සිත හා කය (අසම්මත) ප්‍රේමවන්තයෝ (යථාර්ථවාදී) මදුරුවාගේ විලාපය (ජන නාට්‍ය) කතුවරයාගේ මරණය (වාර්තා). මගේ ගෝලයෙක් තමයි දැන් සිංහබාහු නාට්‍යයේ සිංහබාහුට රඟපාන්නේ. මම විශ්‍රාම ගිහින් ශාන්ත අන්තෝනි නාට්‍ය ඇකඩමිය පටන් ගත්තා. මේක නොමිලේ කරන්නේ. මම මේකෙන් ලබන තෘප්තිය වචනයෙනක් කියන්න බැරි තරම්.

කුඩා කාලේ පටන්ම නාට්‍ය හා රංගකලාවට කැමැත්තක් දැක්වූ ඇන්ටනී කැලණිය සරසවියෙන් ලලිත කලා විශේෂවේදී උපාධිය ලබාගෙන ඇත්තේය. ඉන්පසු නාට්‍ය හා රංග කලාව පිළිබඳ පශ්චාත් උපාධිය ලබාගෙන ඔහු ගුරුසේවයට එක වී තිබිණි. ගුරු සේවයේ වසර තිස්පහක කාලයක් නිරත වී සිටි ඔහු අවසාන වරට ඉගෙනීමේ කටයුතු කර ඇත්තේ කටුගස්තොට ශාන්ත අන්තෝනි විද්‍යාලෙනි.

ඉන්පසු ඇන්ටනි විජේරත්නයන් විසින් ආරම්භ කළ ශාන්ත අන්තෝනි නාට්‍ය ඇකඩමිය පිළිබඳ කරුණු දැක්වූවේය. අද වන විට එහි දරුවෝ තිස් දෙනකු පමණ සිටින බව ඔහු කීවේය. එම දරුවෝ මෙම නාට්‍ය හතරෙහිම රඟපාති. එලෙසම මධ්‍යම පළාතේ නාට්‍ය හා රංග කලාව හදාරන දරුවන්ට ප්‍රායෝගික දැනුම ලබාදීම ඔහුගේ අවසාන බලාපොරොත්තුව බව ඇන්ටනි සඳහන් කළේය.

# ඌවේ රජයේ සේවකයෝ මන බඳිනා විලාසිතාවෙන් හැඩ වෙති



■ අමිල ක්‍රිෂාන්ත - පස්සර

ඌව පළාත් සභාවේ කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි අත්යන්ත්‍ර රෙදිපිළි කර්මාන්තයේ නියැළී සිටින කාර්මිකයන් අතින් නිමවූ නිර්මාණ ඇතුළත් "විලාසිතා දැක්මක්" බදුල්ල පුරහලේදී පැවැත්විණි.

මෙහි විශේෂත්වය වූයේ පළමු වරට ඌව පළාත් සභාවේ නිලධාරීන් දසදෙනෙකු මේ සඳහා ඉදිරිපත් වීමයි.

විලාසිතා දැක්ම සඳහා රෙදි පිළි නිෂ්පාදනය කර තිබුණේ ඌව පළාතට ආවේණික අමුද්‍රව්‍ය යොදා ගනිමිනි.

පළාත් කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව ආරම්භ කර ඇති ඌව පළාතේ නිෂ්පාදනය කරන සාරි වර්ග ඇතුළු රෙදි පිළි දේශීය විදේශීය වෙළෙඳපොළට හඳුන්වා දීමක් මෙම වැඩසටහනට සමගාමීව පවත්වා තිබිණි.

ඌව පළාත් කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම් නිහාල් ගුණරත්නගේ උපදෙස් පරිදි සිදුකෙරුණු විලාසිතා දැක්ම සඳහා කර්මාන්ත අධ්‍යක්ෂ සම්පත් නිශ්ශංක ඇතුළු නිලධාරීන්ගේ සහයද ලැබී ඇත.



විලාසිතා දැක්මේ විශේෂ අවස්ථා




සිල් සමාදන් වෙන දරු දැරියෝ

# කොස්ගුලනේ දරුවෝ දසසිල් සමාදන් වෙති

ඇසළ පොහොය නිමිත්තෙන් මතුගම කොස්ගුලන කනිෂ්ඨ විද්‍යාලය මගින් සංවිධානය කළ සීල සමාදන පින්කමක් කොස්ගුලන ගංගාරාම විහාරස්ථානයේදී පැවැත්විණි.







# ෆිෆා ඉල්ලීම් තුනකට එකඟව ලෝක කුසලාන කඩුල්ල විවරකර ගැනීමේ තැතක්

ජාත්‍යන්තර පාපන්දු සම්මේලනය විසින් ශ්‍රී ලංකාවට පනවා ඇති තහනම ලිහිල් කිරීම සම්බන්ධයෙන් ජාත්‍යන්තර පාපන්දු සම්මේලනය හා ක්‍රීඩා අමාත්‍ය රොෂාන් රණසිංහ අතර පැවැති සාකච්ඡාවේදී කරුණු තුනක් ඔස්සේ ඉදිරියට සාකච්ඡා දියත් කිරීමට නියමිත බවට වාර්තා විය.

ක්‍රීඩා අමාත්‍ය රොෂාන් රණසිංහ සහ ජාත්‍යන්තර පාපන්දු සම්මේලනයේ 'සාමාජික කමිටුව' අතර මෙම සාකච්ඡාව පැවැත්විණි.

එහිදී ජාත්‍යන්තර කමිටුව පාර්ශ්වයෙන් කරුණු තුනක් ඉදිරිපත් කර ඇතැයි වාර්තා වේ. එම කරුණු අතරින් එක් නිලධාරී මඩුල්ලකගේ නිල කාලය සිව් වසරක් දක්වා දීර්ඝ කිරීම සම්බන්ධයෙන් අමාත්‍යවරයා එකඟතාව පළකර ඇතැයි පැවසේ. තවද ශ්‍රී ලංකා පාපන්දු සම්මේලනයට ඡන්දයකින් තොරව ප්‍රධාන විධායක නිලධාරී තනතුර පත්කිරීම වෙනුවෙන් ද එකඟතාව පළව තිබේ.

තවද නිලධාරී මණ්ඩල තෝරා ගැනෙන සෑම නිලවරණයක්ම රහසිගතව පැවැත්වීම ද මෙම කරුණු තුනට අන්තර්ගතව ඇති බව සඳහන් වේ. මෙම සංශෝධන ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් නීතිපතිවරයා සිය එකඟතාව පළකර ඇති අතර එය ක්‍රියාත්මක කිරීමේ හැකියාවක් ඇති බවටද මෙම සාකච්ඡාවේදී සඳහන්ව ඇත.

මෙම කරුණු තුනට අමතරව එළැඹෙන ලෝක කුසලාන සහ ආසියානු කුසලාන සුදුසුකම් ලැබීමේ තරගාවලි සඳහා ශ්‍රී ලංකා කණ්ඩායමට සහභාගි විය හැකි ආකාරයේ විසඳුමක් ලබාදීමට කටයුතු කරන මෙන්ද අමාත්‍යවරයා සාමාජික කමිටුවෙන් ඉල්ලා තිබේ. මේ සම්බන්ධයෙන් අදාළ කමිටුව විසින් ජාත්‍යන්තර සම්මේලනය වෙත ලිඛිතව දැනුම් දෙන ලෙස අමාත්‍යවරයාට දන්වා ඇති අතර එය ඉහළ විශේෂ කමිටුවට ඉදිරිපත් කරමින් සලකා බැලීමට කටයුතු කරන බවටද අමාත්‍යවරයාට පොරොන්දු වී තිබේ.

ඒ අනුව ඉදිරි සාකච්ඡා වටවලදී ඉහළ කමිටුවේ තීන්දු තීරණ ද අමාත්‍යවරයාට දැනුම් දීමට ජාත්‍යන්තර පාපන්දු සම්මේලනය කටයුතු කරනු ඇතැයි පැවසේ. එළැඹෙන ලෝක කුසලාන සුදුසුකම් ලැබීමේ තරග වට ලබන සැප්තැම්බර් මාසයේදී ආරම්භ වීමට නියමිතව පවතී.

ඉකුත් ජනවාරි මාසයේදී ශ්‍රී ලංකා කණ්ඩායමට ජාත්‍යන්තර පාපන්දු තහනමක් පැනවුණු අතර ඒ හේතුවෙන් ශ්‍රී ලංකාවට දකුණු ආසියානු පාපන්දු සම්මේලන කුසලානය සඳහා සහභාගී වීමේ අවස්ථාවද අහිමි විය.

මෙම තීරණය ලැබෙන විටද ශ්‍රී ලාංකේය සම්භවයක් ඇති ක්‍රීඩකයන් රැසක් ශ්‍රී ලංකාව නියෝජනය කිරීමට කැමැත්ත පළ කර තිබීමද විශේෂත්වයකි.

# ජූනි මාසය වනිඳුගේ නමින් ලියැවෙයි

■ ගයාශාන් විතානආරච්චි

අන්තර්ජාතික ක්‍රිකට් කවුන්සිලය (අයි.සී.සී.) මගින් තෝරනු ලබන ජූනි මාසයේ විශිෂ්ටතම ක්‍රිකට් ක්‍රීඩකයාට හිමි සම්මානය දිනා ගැනීමට ශ්‍රී ලංකාවේ දඟ පන්දු යවන ක්‍රීඩක වනිඳු හසරංග සමත් විය.

ශ්‍රී ලංකා ක්‍රීඩකයකු මෙම සම්මානයට හිමිකම් කීවේ දෙවැනි වතාවටය. මීට පෙර ඉකුත් 2022 වසරේ ජූලි මාසයේදී දඟ පන්දු යවන ක්‍රීඩක ප්‍රභාත් ජයසූරිය විසින් පළමු වරට එම සම්මානය දිනා ගත්තේය.

අදාළ සම්මානය සඳහා වනිඳුට අමතරව සිම්බාබ්වේ ක්‍රීඩක ශෝන් විලියම්ස් සහ ඔස්ට්‍රේලියානු ක්‍රීඩක ට්‍රැවිස් හෙඩ් නිර්දේශ වී සිටියේය. කෙසේ වෙතත් ලොව පුරා විසිරී සිටින ක්‍රිකට් ලෝලීන්ගේ ඡන්දය මත වනිඳුට මෙම සම්මානය හිමි වූයේය.

සිම්බාබ්වේහිදී පැවැති ලෝක කුසලාන සුදුසුකම් ලැබීමේ වටයේ දැක්වූ විශේෂ දක්ෂතා හමුවේ වනිඳු එම සම්මානයට නිර්දේශ විය. එහිදී පිට පිට කඩුලු පහ බැගින් දවාගත් අවස්ථාවන් තුනක්ද ඇතුළුව මුළු තරග හතකදී වනිඳු විසින් කඩුලු 22ක් දවාගනු ලැබීය. ඒ අනුව ගෙවුණු ජූනි මාසයේදී වනිඳු දවාගෙන තිබුණු මුළු කඩුලු සංඛ්‍යාව 26කි.

'මෙම සම්මානය ලැබීම සම්බන්ධයෙන් මම අතිශය සතුටට පත්වෙනවා. ඉන්දියාවේ පැවැත්වීමට නියමිත එක්දින ලෝක කුසලාන ක්‍රිකට් තරගාවලියට පිවිසීමෙන් පසුව අයි.සී.සී. මාසයේ ක්‍රීඩකයා ලෙස තේරී පත්වීමට ලැබීම මට භාග්‍යයක් සහ ගෞරවයක්' යැයි සම්මානය ලැබීමෙන් පසුව වනිඳු ප්‍රකාශකර තිබේ.

එම ක්‍රීඩිකාවට හිමි සම්මානය දිනාගනු ලැබුවේ ඔස්ට්‍රේලියාවේ තුන් ඉරියව් ක්‍රීඩිකා ඈෂ්ලි ගාර්ඩ්නර් විසිනි. ඇය මීට පෙර 2022 වසරේ දෙසැම්බර් සහ 2023 වසරේ පෙබරවාරි මාසයන්හි එම සම්මානයට හිමිකම් කියා ඇති අතර තුන්වරක් එය දිනාගත් එකම ක්‍රීඩිකාව වන්නේද ඇයයි.

# පාකිස්තානය සාර්ථක පෙර පුහුණුවක

ශ්‍රී ලංකා ක්‍රිකට් සභාපතිගේ කණ්ඩායම සමග පැවැත්වෙන දෙදින පුහුණු ක්‍රිකට් තරගයේ ඊයේ (11 වැනිද) පළමු දිනට තරගය අවසන් කරන විට සිය පළමු ඉනිම ක්‍රීඩා කරමින් සිටි සංචාරක පාකිස්තාන කණ්ඩායම කඩුලු 03ක් දැවී ලකුණු 160ක් රැස්කරගෙන සිටියේය.

ඒ අනුව ශ්‍රී ලංකා පළමු ඉනිමට වඩා පකිස්තානය තවත් ලකුණු 36ක් පිටපසින් වේ. හම්බන්තොට මහින්ද රාජපක්ෂ ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාංගණයේ පැවැත්වෙන තරගයේ පළමුවෙන් පන්දුවට පහරදුන් ශ්‍රී ලංකා ක්‍රිකට් සභාපතිගේ කණ්ඩායමට සියළුදෙනා දැවී රැස්කරගත හැකි වූයේ ලකුණු 196ක් පමණි.

එහිදී එක් අන්තයකින් ශ්‍රී ලංකා ඉනිම ගොඩනැගූ ඕෂධ ප්‍රනාන්දු ආරම්භක පිතිකරුවා ලෙස පිටියට පිවිස ලකුණු 113ක් රැස්කර ගැණින. ඒ හැරුණු විට ශ්‍රී ලංකා කණ්ඩායම වෙනුවෙන් ලකුණු 20 සීමාවට පැමිණිය හැකි වූයේ කමිඳු මෙන්ඩිස්ට පමණි. ඔහු ලකුණු 21ක් රැස්කර ගත්තේය.

පාකිස්තානය වෙනුවෙන් පන්දු යැවීමේදී ෂහීන් ෂා අෆ්රිඩි සහ හසන් අලි අතරේ කඩුලු තුන බැගින් බෙදී ගියේය.

පාකිස්තානය වෙනුවෙන් දිනයේ සාර්ථකම පිතිකරුවා වූ ශාන් මසූඩ් ලකුණු 83ක් රැස්කර ගැනීමට සමත් විය.




25 වැනි ආසියානු මලල ක්‍රීඩා ශූරතා තරගාවලිය

# අරුණ, රාජිත සහ නදීෂා තරග බිමට

තායිලන්තයේදී අද (12 වැනිද) ආරම්භ වීමට නියමිත 25 වැනි ආසියානු මලල ක්‍රීඩා ශූරතා තරගාවලියේ ශ්‍රී ලංකා ක්‍රීඩක ක්‍රීඩිකාවන් කිහිපදෙනකු තරග බිමට පිවිසීමට නියමිතය.

තරගාවලියේ පළමු දිනය වන අද දිනයේදී මීටර 400 පිරිමි සහ කාන්තා ඉසව්වල මූලික තරග ආරම්භ වීමට නියමිතව පවතී. ඒ අනුව මීටර 400 පිරිමි ඉසව්ව සඳහා අරුණ දර්ශන සහ රාජිත රාජකරුණා තරග බිමට පිවිසෙනු ඇත. එමෙන්ම කාන්තා මීටර 400 ඉසව්වේ මූලික වටය සඳහා නදීෂා රාමනායක තරග වැදීමට නියමිතව සිටී.

ඒ අනුව මීටර 400 පිරිමි ඉසව්ව ශ්‍රී ලංකා වේලාවෙන් පෙ.ව. 7.45ට ක්‍රියාත්මක වන අතර කාන්තා මීටර 400 ඉසව්ව ශ්‍රී ලංකා වේලාවෙන් 8.15ට ක්‍රියාත්මක වේ. එම ඉසව් දෙකෙහි අවසන් පූර්ව වටයේ තරගද අද දිනයේදීම ක්‍රියාත්මක වන අතර පිරිමි තරගය ප.ව. 4.45ට සහ කාන්තා තරගය ප.ව. 5.10ට පැවැත්වේ.

මෙවර ආසියානු ශූරතාව සඳහා ශ්‍රී ලංකාව නියෝජනය කරමින් ක්‍රීඩක ක්‍රීඩිකාවන් 13 දෙනකුගෙන් යුත් සංචිතයක් සහභාගී වේ. එහි ප්‍රධාන වශයෙන් සහය දිවීමේ තරග ඉසව් ඉලක්ක කර ඇති අතර ඊට අමතරව මීටර 400 පිරිමි, මීටර 800 කාන්තා, මීටර1500 කාන්තා, මීටර 400 කාන්තා, දුර පැනීම සහ තුන් පිම්ම කාන්තා යන ඉසව් සඳහා ක්‍රීඩක ක්‍රීඩිකාවන් සහභාගී වීමට නියමිතය.





ජායාරූප - සිලෝන් ඇත්ලටික්ස්

### ශ්‍රී ලංකා සංචිතය

**පිරිමි** - අරුණ දර්ශන (මීටර් 400, මීටර් 4x400, මීටර් 4x400 මිශ්‍ර), රජිත රාජකරුණා (මීටර් 400, මීටර් 4x400, මීටර් 4○400 මිශ්‍ර), කාලිංග කුමාරගේ (මීටර් 4○400, මීටර් 4x400 මිශ්‍ර), පසිඳු කොඩිකාර (මීටර් 4x400, මීටර් 4x400 මිශ්‍ර), පබසර නිකු (මීටර් 4x400, මීටර් 4x400 මිශ්‍ර)

**කාන්තා** - ගයන්තිකා අබේරත්න (මීටර් 800, මීටර් 1500), නදීෂා ලේකම්ගේ (හෙල්ල විසිකිරීම), රන්දි කුරේ (තුන් පිම්ම), සාරංගි සිල්වා (දුර පැනීම), නදීෂා රාමනායක (මීටර් 400, මීටර් 4○400, මීටර් 4x400 මිශ්‍ර), තරුෂි කරුණාරත්න (මීටර් 800, මීටර් 4x400, මීටර් 4x400 මිශ්‍ර), නිශේන්ද්‍රා ප්‍රනාන්දු (මීටර් 4x400, මීටර් 4x400 මිශ්‍ර), සයුරි මෙන්ඩිස් (මීටර් 4x400, මීටර් 4x400 මිශ්‍ර)

# සතුට පොදි බැඳන් අන්ධ විද්‍යාලයට ගිය රාජකීයයෝ ඇස් බැඳන් ක්‍රිකට් ගසති

කොළඹ රාජකීය විද්‍යාලයීය බෞද්ධ ශිෂ්‍ය සහෝදර සංගමය මගින් සංවිධාන කළ විශේෂ ක්‍රීඩා වැඩසටහනක් ඇතුළු සද්කාරයන් රැසක් පසුගියද රත්මලාන අන්ධ විද්‍යාල පරිශ්‍රයේදී පැවැත්විණ.

රාජකීය බෞද්ධ ශිෂ්‍ය සහෝදර සංගමය විසින් 'අරුණාලෝකය'නමින් මෙම සුහද හමුව නම් කොට තිබිණ. රත්මලාන අන්ධ විද්‍යාලයේ ඉගෙනුම ලබන දෘශ්‍යාබාධිත දූදරුවන් හට කලාතුරකින් හිමිවන සොඳුරු හෝරා කිහිපයක් එදින ගෙවිණි.

මෙම දිනය පුරා රාජකීය බෞද්ධ ශිෂ්‍ය සහෝදරයන් විසින් එම දෘශ්‍යාබාධිත දරුවන් සමගින් ක්‍රීඩා කරමින් සොම්නසින් කාලය ගතකර තිබිණි. ඒ අතරින් පැවැති ක්‍රිකට් තරගයේදී කොළඹ රාජකීය ක්‍රීඩකයන්ද සිය දෑස් ආවරණයකර ගනිමින් අදාළ තරගයට පෙනී සිටීම කාගෙත් අවධානය දිනා ගන්නා සිදුවීමක් විය.



සතිමත්බව පිළිබඳ වැඩසටහනකින් පසුව ඇරඹුණු එම ක්‍රීඩා තරගවලින් අනතුරුව එනම් මෙම වැඩසටහන අවසානයේ රාත්‍රී භෝජන සංග්‍රහයක් සහ මෙම දෘශ්‍යාබාධිත දරුවන් වෙනුවෙන් පිළියෙල කරන්නට රාජකීය සහෝදරත්වය කටයුතු කර තිබීම විශේෂත්වයකි. එහිදී එම දෘශ්‍යාබාධිත දරුවන් වෙනුවෙන් තිළිණ ප්‍රදානයක්ද රාජකීය විද්‍යාලයේ දරුවන් විසින් මෙම අන්ධ විද්‍යාලයේ දරුවන් උදෙසා සිදුකෙරිණි.

මානුෂික සුහදත්වය, සමතැන සම ලෙස සැලකීම සහ සහෝදරත්වය උතුම් ගුණාංග ආදර්ශයක් කොට ගනිමින් කොළඹ රාජකීය විද්‍යාලයීය බෞද්ධ ශිෂ්‍ය සහෝදර සංගමය මගින් දිවයින පුරා මෙලෙස විවිධ වැඩසටහන් සංවිධාන කරයි.

කොළඹ 7 විජේරාම මාවත අංක 91 හි පිහිටි ලිබර්ටි පබ්ලිෂර්ස් (පෞද්ගලික) සමාගම විසින් මල්වාන කළුකොඳයාවේ පිහිටි සිය මුද්‍රණාලයේ මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.

# අලුත් පර්මිට් දුන්නොත් බස් වර්ජනයක්

■ එෆ්. අස්ලම්

පෞද්ගලික බස්රථ සඳහා මාර්ග බලපත්‍ර 140 ක් ලබා දීමට පියවර ගන්නේ නම් දීපව්‍යාප්ත බස් වර්ජනයක් සිදුකරන බව සමස්ත ලංකා පෞද්ගලික බස් හිමියන්ගේ සංගමයේ ප්‍රධාන ලේකම් අංජන ප්‍රියන්ජිත් පැවසීය.

දැනට ධාවනය වන බස්රථවලින් බස්රථ දහසක් පමණ කාලසටහන් නොමැතිව දෛනිකව ධාවනයෙන් ඉවත් වන බවත් එසේ තිබියදී නව මාර්ග බලපත්‍ර ලබා දීමෙන් පෞද්ගලික බස් හිමියන්ට බරපතළ තර්ජනයක් එල්ල වන බවත් ඔහු කීවේය.

ඒකාබද්ධ කාලසටහනකට අනුව දැනට ඇති බස්රථ ධාවනය කරවීමෙන් මගීන්ට අපහසුතාවකින් තොර ප්‍රවාහන පහසුකමක් සැලසිය හැකි බවත් කී හෙතෙම මාර්ග බලපත්‍ර 140 ක් අලුතින් ලබාදීම පිටුපස රුපියල් කෝටි ගණනක ගනුදෙනුවක්ද පවතින බවත් කීවේය.

නව බස්රථ 140 කට මාර්ග බලපත්‍ර පිරිනැමීමේ උත්සහය හකුළා ගන්නේ නම් දැනට ක්‍රියාත්මක බස් ගාස්තුව සියයට දහයකින් අඩුකිරීමේ හැකියාවක්ද පවතින බවත් ඒ සඳහා සියලුම බස් සංගම්ද එකඟ බවත් අංජන ප්‍රියන්ජිත් කියා සිටියේය.

ඔහු මේ බව සඳහන් කළේ ඊයේ නාරාහේන්පිට දී පැවැති මාධ්‍ය හමුවකට එක්වෙමිනි.

## ▶▶ 01 වැනි පිටුවෙන්...

## පර්මිට් නැති බස්වලට...

උතුරු,නැගෙනහිර සහ උතුරු මැද යන පළාත්වල ඉතා විශාල බස් රථ ප්‍රමාණයක් මගී ප්‍රවාහන බලපත්‍ර රහිතව ධාවනය කෙරෙන බවද ඔහු කීවේය.

රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ ඊයේ (11 වැනිදා) පැවැති කැබිනට් තීරණ දැනුම්දීමේ මාධ්‍ය හමුවේදී ඇමැතිවරයා මේ බව කියා සිටියේය.

මනම්පිටිය බස් අනතුරට සම්පූර්ණ හේතුව රියැදුරුගේ නොසැලකිලිමත්කම බව අනාවරණයවී ඇති බවද,බස් රථය අනතුරට ලක්වූ ස්ථානය පිළිබඳව පූර්ණ පරීක්ෂණයක් සිදුකර වාර්තාවක් ලබාදෙන ලෙස ජාතික ප්‍රවාහන කොමිෂන් සභාවේ සභාපතිවරයා ඇතුළු නිලධාරීන්ට උපදෙස් දුන් බවද ඇමැතිවරයා කීවේය.

දැනට ලබාදී තිබෙන වාර්තා අනුව අනතුරට ලක්වූ බස් රථය ජාතික ගමනා ගමන කොමිසමෙන් නිසි බලපත්‍රයක් ලබා නොගෙන ධාවනය කර තිබෙන බවද, බස් රථයට නැගෙනහිර පළාත් සභාව විසින් 2018 වසරේදී බලපත්‍රයක් නිකුත් කර තිබෙන බවද ඔහු පැවසුවේය.

අදාළ බලපත්‍ර හිමියාට 2019 වසරේදී අධිකරණයෙන් රුපියල් දස දහසක දඩ මුදලක් නියම කර තිබෙන බවද ඇමැතිවරයා සඳහන් කළේය.

මගී ප්‍රවාහන බලපත්‍රයක් රහිතව මගීන් ප්‍රවාහනය කරන්නේ නම් රුපියල් ලක්ෂ පහ දක්වා දඩ නියම කළහැකි පරිදි ජාතික ගමනා ගමන කොමිෂන් සභා පනත සංශෝධනය කර නීතිපතිවරයාට යවා තිබෙන බවද ඇමැතිවරයා කීවේය.

## පිළියන්දල පොලිසියේ රැඟූ...

එසේ වුවද වගඋත්තරකාර පාර්ශ්වය විසින් එකී මුදල ලබාදීමට එකඟතාව පළකළද පැමිණිලිකාර හිතවතිය විසින් එය ප්‍රතික්ෂේප කිරීම හේතුවෙන් අන් සතු මුදල් තම ව්‍යාපාරවලට යෙදීමට අකැමැත්ත පළ කළ වගඋත්තරකාර පාර්ශ්වය විසින් එකී මුදලින් පිළියන්දල බටකැත්තර ප්‍රදේශයේ දුගී පවුලකට වියළි ආහාර ප්‍රදානය කිරීමට කටයුතු කර තිබූ බවද එම නිලධාරියා කීය.

ඉකුත් 03 වැනිද ඇසළ පොහෝ දින පැමිණිලිකාර කාන්තාව සමග පොලිසියට බස්නාහිර පළාත් ප්‍රජා පොලිස් ඒකකයේ ස්ථානාධිපතිවරයාට අයත් නිල ජීප් රථයෙන් පිළියන්දල පොලිසිය වෙත පැමිණ තිබූ සහකාර පොලිස් අධිකාරිවරයා පෙර දින කරන ලද පැමිණිල්ලට අදාළව වගඋත්තර පාර්ශ්වය පොලිසියට නොකැඳවීම සම්බන්ධයෙන් විවිධ පැමිණිලි අංශය වෙත පැමිණ වැඩ බලන ස්ථානාධිපති ඇතුළු සෙසු නිලධාරීන්ට මහජනයා ඉදිරියේ දී අවමන් සහගත ලෙස බැණ වැදී හැසිරී තිබිණි.

සහකාර පොලිස් අධිකාරිවරයාගේ මෙම හැසිරීම සම්බන්ධයෙන් පොලිස් මූලස්ථානයේ විශේෂ විමර්ශන ඒකකය මගින් විමර්ශනයක් ද ආරම්භ කර තිබිණි.

ඒ අනුව පිළියන්දල පොලිසියේ නිලධාරීන්ට බැණ වැදුණු සහකාර පොලිස් අධිකාරිවරයා ගෙන් මෙන්ම, පිළියන්දල පොලිස් ස්ථානාධිපතිවරයාගෙන් ඇතුළු 15 දෙනකුගෙන් පමණ ප්‍රකාශ සටහන් කරගෙන තිබිණි .

## PC නෝනයි-සැමියයි...

හම්බන්තොට වරාය පොලිසියේ සේවය කරන අහංගම මැලියගොඩ පදිංචි පොලිස් කාන්තාව අහංගම පොලිසියට සැමියා හා ඔහුගේ සහෝදරියට එරෙහිව පැමිණිල්ලක් කර තිබී ඇත.

එම පැමිණිල්ලට අනුව එය විභාග කිරීම සඳහා පෙරේද (10 වැනිදා) තිදෙනාම අහංගම පොලිසියට කැඳවා තිබේ. පොලිසියේ විවිධ පැමිණිලි අංශයේ දී ප්‍රසිද්ධියේම ගැටුමක් ඇතිකරගත් තිදෙනාව අත්අඩංගුවට ගෙන ගාල්ල මහෙස්ත්‍රාත් උසාවියට ඉදිරිපත් කළ පසුව ලක්ෂය බැගින් වූ ශරීර ඇප මත මුදාහැර තිබේ.

## රිජ්වේ අටේ වාට්ටුව...

මෙම ගැටලුවට අදාළව විමර්ශන කමිටුවක් පත් කර ඇති බවත් එහි වාර්තාව මෙම සතිය තුළදී තමාට ලැබෙන බවත් සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරයා ඊයේ (11වැනිදා) ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේදී පැවති මාධ්‍ය හමුවේදී ප්‍රකාශ කළේය.

අදාළ වෛද්‍යවරු තිදෙනාගේ නොපැමිණීම සම්බන්ධයෙන් රෝහල් බලධාරීන් සෞඛ්‍ය අමාත්‍යාංශයටද දැනුම් දීමෙන් පසු මෙම විමර්ශනය ආරම්භ කර තිබේ.

මේ වනවිට එම වාට්ටුවේ ප්‍රතිකාර කටයුතු සිදුකරනු ලබන්නේ සීමාවාසික වෛද්‍යවරුන් බවත් එය දරුවන්ගේ ජීවිතවලට අවධානමක් ඇතිකරන බවත් රෝහල් බලධාරීන් පවසයි.

කොළඹ රිජ්වේ ආර්යා ළමා රෝහලේ අටේ වාට්ටුවේ රෝගී දරුවන් පනස් දෙනකු පමණ ප්‍රතිකාර ගනු ලබන අතර රෝහල් සේවයේ නියුතු විශේෂඥ වෛද්‍යවරියක් සැරපරුෂ බව පවසමින් පසුගිය මස විසි එක්වැනිද (21) සිට ළමා රෝගීන් බැලීමට මෙම වෛද්‍යවරු තිදෙනා රෝහලේ අටේ වාට්ටුවට පැමිණ නැත.

## බස්නාහිර පාසල් 32ක...

කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ඊයේ (11 වැනිද) පැවැති දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීමේදී මේ බව අනාවරණය විය.

බස්නාහිර පළාත් සභාවට අයත් පාසල්වල ඩෙස් සහ පුටු පළාත් සභා ප්‍රතිපාදන යටතේ අලුත් වැඩියා කිරීමට දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවෙන් අනුමැතිය ඉල්ලා තිබුණි.

ඒ අනුව, හෝමාගම, පිළියන්දල, ජයවර්ධනපුර සහ කොළඹ යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල පිහිටා තිබෙන පාසල් 32 ක මේස හා පුටු 6265 ක් පිළිසකර කිරීම සඳහා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව විසින් අනුමැතිය ලබා දුන්නේය.




## ▶▶ 01 වැනි පිටුවෙන්...

## කපන්නද ඇහුවම ...

රජයේ ප්‍රතිපත්තිමය තීරණයක් මත ගස ඉවත්කළ බවද ඔහු කීවේය.

රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ ඊයේ (11 වැනිද) පැවැති කැබිනට් තීරණ දැනුම්දීමේ මාධ්‍ය හමුවේදී ඇමැතිවරයා මේ බව කීවේය.

පඩු කරඳ ගස වෙනුවට එම ගස් 200 ක් පැළ කිරීමට සැලසුම් කර ඇතැයිද ඔහු පැවසුවේය.

විෂය භාර ඇමැතිවරයා ලෙස පඩු කරඳ ගහ සම්බන්ධයෙන් තමා දැනුවත් බවද ඔහු කීවේය.

අධිවේගී මාර්ග ව්‍යාපෘති කඩිනමින් නිම කළේ නම් රුපියල් කෝටි ග ණනක මුදලක් ඉතිරි වන බවද, නමුත්, අවාසනාවකට පඩු කරඳ ගසක් නිසා උද්ඝෝෂණ සිදුකළ බවද, මෙම ගස බේරා සැලසුම වෙනස් කළහොත් රුපියල් බිලියන 15 ක පාඩුවක් සිදුවන බවද ඇමැතිවරයා කීවේය.


පඩු කරඳ ගස කැපීමට පෙර

තමා මේ සම්බන්ධයෙන් පුළුල් අධ්‍යයනයක් කළ බවත්, අධිවේගී මාර්ග ව්‍යාපෘතිය අවට වසර 40 ට වඩා පැරණි පඩු කරඳ ගස් 15 ක් තිබෙන බවත් එම අධ්‍යයනයේදී තහවුරුවූ බවද ඔහු පැවසුවේය.

උස අඩි 12 ත් 15 ත් අතර පඩු කරඳ ගස් 25 ක් තිබෙන බවද, මෙම පඩු කරඳ ගස පමණක් තිබෙන බවට පතුරා ඇත්තේ මිත්‍යාවක් බවට කැබිනට් මණ්ඩලයට තමා දැනුම්දුන් බවද ඇමැතිවරයා සඳහන් කළේය.

ගම්පහ, දරළුව ප්‍රදේශයේ පිහිටි මෙරටට ආවේණික විශාලතම හා දුර්ලභ පඩු කරඳ ශාකය විනාශ කිරීමට මාර්ග සංවර්ධන අධිකාරිය විසින් බැකෝ යන්ත්‍ර 4 ක් භාවිත කර ඇතැයි ඉඩම් හා කෘෂිකර්ම ප්‍රතිසංස්කරණ ව්‍යාපාරයේ පරිසරවේදී සජීව චාමිකර පවසයි.

මධ්‍යම අධිවේගී මාර්ගයේ කඩවත සිට මීරිගම දක්වා ඇති පළමු කොටසට අයත් වන භූමියක පිහිටි මෙම ශාකය ක්‍රමවත්ව සංරක්ෂණය කිරීමේ ක්‍රමවේදයක් ක්‍රියාත්මක නොකර අනීතිකව හා බලහත්කාරය භාවිත කර මෙසේ විනාශ කර දමා තිබෙන බවද, ශාකය කපා ඉවත් කර, මුල් කොටස් ගළවා ඉවත් කිරීම හා වලවල් හාරා ශාකයේ කොටස්වල දමා පස් ඇතිරීම ඇතුළු සියලු ක්‍රියා ඉතාම සංවිධානාත්මකව සිදු කර ඇති බවද සජීව චාමිකර කියන්නේය.

ෆැබේසියේ (Fabaceae) කුලයට අයත් පඩු කරඳ ශාකය ඉංග්‍රිසියෙන් Sri Lanka Legume ලෙසත් විද්‍යාත්මකව Crudia zelanica ලෙසත් හැඳින් වේ. මෙම ශාකය විද්‍යාත්මකව නාමකරණය කිරීමෙන් අනතුරුව 1911 වසරෙන් පසු මෙරටින් වාර්තා වූ බවට විද්‍යාත්මක සාධක නොතිබුණි. නමුත් 2019 වසරේ දී ගම්පහ දිස්ත්‍රික්කයේ දරළුව ග්‍රාම නිලධාරී වසමට අයත් මධ්‍යම අධිවේගී මාර්ගයට යටත් වන එච්. අයි. එම්. ඒ. මුණසිංහට අයත්ව තිබූ වන්දි ගෙවීමෙන් පසු පවරාගන්නා ලද ඉඩමෙන් වසර 108 කට පසුව හිමේෂ් ජයසිංහ ඇතුළු පර්යේෂණ කණ්ඩායම විසින් පළමු වරට මෙම ශාකය නැවත සොයා ගන්නා ලදී. ඉන් පසු ව ගම්පහ දිස්ත්‍රික්කය තුළ ස්ථාන කිහිපයකින් මෙම ශාක විශේෂය වාර්තා කිරීමට ද හැකි වී ඇත.

2021 වසරේ දී පරිසර අමාත්‍යාංශය විසින් ප්‍රකාශයට පත් කළ ජාතික රතු දත්ත ලේඛනයේ මෙම ශාකය දැඩි ලෙස වඳවීමේ තර්ජනයට ලක් වූ (Critically Endangered - CR) ශාකයක් ලෙස නම් කර තිබේ. ඊට හේතුව පළමුව වඳවී ගොස් ඇතැයි විශ්වාස කළ මෙම ශාකය 2019 වසරේ දී නැවත වාර්තා කිරීම හා ස්ථාන කීපයකින් පමණක් ස්වාභාවිකව මෙම ශාකය වාර්තා වී තිබීම ය.

## මෛත්‍රී ගෙවන්න...

ඒ අනුව ශ්‍රේෂ්ඨාධිකරණය විසින් නියම කරනු ලැබූ රුපියල් මිලියන 100 ක වන්දි මුදල අතුරින් ඉකුත් ජුනි මස 28 වැනිද රුපියල් මිලියන 10 ක් සහ රුපියල් මිලියන 5 ක් බැගින් රුපියල් මිලියන 15 ක මුදලක් වන්දි වශයෙන් හානිපූර්ණ කාර්යාලයේ පවත්වාගෙන යන පාස්කු ප්‍රහාරයෙන් වින්දිතයන් බවට පත්වූවන්ගේ අරමුදලට ගෙවා ඇති බවත් එම මෝසමේ සඳහන් වේ. ඉතිරි වන්දි මුදල් රුපියල් ලක්ෂ 85 බැගින් වාරික 10 කින් 2024 වසරේ ජුනි මස 30 වැනිද සිට 2033 වසරේ ජුනි මස 30 වැනිද දක්වා කාලය තුළ වාර්ෂිකව ගෙවා අවසන් කිරීමට අවසර දෙන ලෙසත් හිටපු ජනාධිපතිවරයා සිය මෝසම මාර්ගයෙන් අවසර අයැද තිබේ.

මෛත්‍රීපාල සිරිසේන සිය නීතිඥවරුන් මාර්ගයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයට ඉදිරිපත් කර තිබෙන මෝසමේ සඳහන් කර තිබෙන්නේ තමන්ට හිටපු ජනාධිපතිවරයා වශයෙන් විශ්‍රාම වැටුප් වශයෙන් මාසිකව රුපියල් 97500/- ක්ද පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වශයෙන් දීමනා හැර රුපියල් 54,285ක මුදලක්ද ආදයම වශයෙන් ලැබෙන බවයි.

ඒ අනුව ඉහත සඳහන් ආකාරයට වන්දි මුදල් ගෙවීමට අවසර දෙන ලෙසත් ඔහු සිය මෝසමින් ඉල්ලීමක් කර තිබේ.

පසුගිය ජනවාරි මස 12 වැනිද අගවිනිසුරු ජයන්ත ජයසූරිය ප්‍රමුඛ සත්පුද්ගල ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු මඩුල්ලක් විසින් පාස්කු ප්‍රහාරය වළක්වා ගැනීමට කටයුතු නොකිරීම සම්බන්ධයෙන් ඉදිරිපත් කර තිබූ මූලික අයිතිවාසිකම් පෙත්සම් දෙළහකට අදාළ තීන්දු ප්‍රකාශයට පත්කර තිබිණි.

එම තීන්දුවට අනුව අදාළ පෙත්සම්වල වගඋත්තරකරුවන් ලෙස නම්කර තිබූ හිටපු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේනට රුපියල් මිලියන 100 ක්ද, හිටපු පොලිස්පති පූජිත් ජයසුන්දර සහ රාජ්‍ය බුද්ධි සේවයේ හිටපු ප්‍රධානී නිලන්ත ජයවර්ධන විසින් රුපියල් මිලියන 75 බැගින්ද, හිටපු ආරක්ෂක ලේකම් හේමසිරි ප්‍රනාන්දු විසින් රුපියල් මිලියන 50 ක්ද, හිටපු ජාතික බුද්ධි ප්‍රධානී සිසිර මෙන්ඩිස් විසින් රුපියල් මිලියන දහයක්ද වන්දි වශයෙන් ගෙවිය යුතු බව නියෝග කළ අතර එම වන්දි මුදල් ගෙවීම සඳහා එදින පටන් මාස හයක කාලයක්ද වගඋත්තරකරුවන් වෙත ලබාදී තිබිණි.

ඒ අනුව හිටපු ආරක්ෂක ලේකම් හේමසිරි ප්‍රනාන්දු විසින් රුපියල් මිලියනයක්ද, හිටපු පොලිස්පති පූජිත් ජයසුන්දර විසින් රුපියල් 1,725,588 ක්ද, හිටපු ජාතික බුද්ධි ප්‍රධානී සිසිර මෙන්ඩිස් විසින් රුපියල් මිලියන 05 ක මුදලක්ද වන්දි වශයෙන් ගෙවා තිබෙන බව එම ආරංචි මාර්ග සඳහන් කරයි. රාජ්‍ය බුද්ධි සේවයේ හිටපු ප්‍රධානී නිලන්ත ජයවර්ධන විසින් පෙරේද වන තෙක් වන්දි මුදල් ගෙවූ බවක් වාර්තා නොවන බවද එම ආරංචි මාර්ග වැඩිදුරටත් සඳහන් කරයි.

ඊට අමතරව රජය වෙනුවෙන් මහා භාණ්ඩාගාරය විසින් රුපියල් මිලියනයක වන්දියක්ද ගෙවා තිබේ. මෙම සියලු වන්දි මුදල් හානිපූරණය සඳහා වන කාර්යාලය වෙත ගෙවා තිබෙන බවද වාර්තා වේ.

## පාසල් ළමුන් දැක...

මෙසේ රෝහල් ගතකර ඇත්තේ හල්දුම්මුල්ල කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයට අයත් බත්ගොඩ විපුලානන්ද දෙමළ මහ විදුහලේ සිසුන් පස් දෙනෙකි. එම සිසුන් වයස අවුරුදු 10 සහ11 වියේ පසුවන අය බව පොලිසිය කියයි.

බත්ගොඩ මංසන්ධියේ සිට විදුහලට පාගමනින් එමින් සිටියදී පුද්ගලයකු විසින් දක්කාගෙන ආ මීහරක් කුලප්පු වී දරුවන් පසුපස පන්නා ඇති බවද පොලිසිය කියයි.

තුවාල ලැබූ දරුවන්ගේ තත්ත්වය එතරම් බරපතළ නොවන බව රෝහල් ආරංචි මාර්ග සඳහන් කරයි. හපුතලේ පොලිසිය පරීක්ෂණ පවත්වයි.

# ජනවාරි සිට මේ දක්වා කොළඹ දිසාවෙන් ලාදුරු රෝගීන් 100ක්

■ සාලිය කුමාර ගුණසේකර

මේ වසරේ ආරම්භයේ සිට මේ දක්වා වූ කාලය තුළදී කොළඹ දිස්ත්‍රික්කයෙන් ලාදුරු රෝගීන් 100 ක් වාර්තාවන බව කොළඹ ප්‍රාදේශීය සේවා සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය සඳහන් කරයි.

රටේ වැඩිම ලාදුරු රෝගීන් සංඛ්‍යාවක් වාර්තා වන්නේ කොළඹ දිස්ත්‍රික්කයෙන් බව කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ඊයේ (11 වැනිද) පැවැති දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීමේදී අනාවරණය විය.

එමෙන්ම, ක්ෂය රෝගීන්ද ලංකාවේ වැඩිම ප්‍රමාණයක් වාර්තා වන්නේ කොළඹ නගර සීමාවෙන් බව සෞඛ්‍ය අංශ අනාවරණය කළේය.

ක්ෂය රෝගීන් ගණන 15 - 20 අතර සංඛ්‍යාවක් කොළඹ නගර සීමාවෙන් මාසයකට වාර්තා වේ.

ලාදුරු සහ ක්ෂය රෝගීන් හඳුනා නොගතහොත් එය තවත් අයකුට බෝවීමේ අවදානමක් පවතින බවද සෞඛ්‍ය අංශ කියයි.

ලාදුරු රෝගය මාස 18 කින් සුවකළ හැකි වුවද, ආරක්ෂාකාරී නොවුණහොත් නැවත සංකූලතා ඇතිවීමේ අවදානමක් පවතින බව සෞඛ්‍ය නිලධාරීහු කියා සිටිති.

කොළඹ සහ මඩකලපුව යන දිස්ත්‍රික්කවලින් ලාදුරු රෝගය මර්දනය කළහොත් එය ලංකාවෙන්ම මර්දනය කළා වැනි යැයිද සෞඛ්‍ය නිලධාරීහු කොළඹ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේදී කියා සිටියහ.

## ▶▶ 01 වැනි පිටුවෙන්...

## බූස්ස අධි ආරක්ෂිත...

බූස්ස අධි ආරක්ෂිත බන්ධනාගාරයේ රඳවා සිටි මත්ද්‍රව්‍ය ජාවාරම්වලට චෝදනා ලැබූ විසිපස් දෙනකු මේ වනවිට ඇප ලබා පිටතට ගොස් තිබේ. ඉන් දහසය දෙනකු මෙසේ රටින් පලාගොස් ඇති බව හෙළිවී ඇත. මෙම ජාවාරමුන් අදාළ නඩු වාරවලට ඉදිරිපත් නොවීම නිසා නඩු පවත්වාගෙන යාමේ ගැටලුවක් පැන නැගී ඇති බවත් විමර්ශන නිලධාරීහු පෙන්වා දෙති. වසර දෙකක් වැනි කාලයක් තුළ මෙම පිරිස් ඇප ලබාගෙන ඇති අතර ඇප ලබාගත් පසුව බහුතරයක් ව්‍යාජ ගුවන් ගමන් බලපත්‍ර මගින් හා බෝට්ටු මගින් රටින් පලා ගොස් ඇතැයි හෙළිවී තිබේ.

ඇප ලබාගැනීමෙන් පසුව රටින් පලා ගිය මෙම පිරිස අතර ගනේමුල්ලේ සංජීව, කැවුමා, කන්ජිපානි ඉම්රාන්, ආමි සම්පත් වැනි ප්‍රධාන පෙළේ පිරිසක්ද සිටිති.

මෙම ඇප ලබාගත් අයගෙන් බහුතරයක් වෙනුවෙන් පෙනී සිට ඇත්තේ ජනාධිපති නීතිඥවරුන් බව විමර්ශන නිලධාරීහු පෙන්වා දෙති. මෙම පිරිසට ඇප ලබාදීමට ඉදිරිපත් වූ ඇපකරුවන් සොයා බලා අත්අඩංගුවට ගැනීමට පොලිසියට උපදෙස් දීමට පියවර ගන්නා බව ජ්‍යෙෂ්ඨ නිලධාරියකු සඳහන් කළේය. මෙම පිරිස් ඇප ලබා රටින් පැනගිය පසුව ඩුබායි ඇතුළු රටවල්වල සැඟවී මත්ද්‍රව්‍ය ජාවාරම් හා අපරාධ රැල්ල නිදහසේ කරගෙන යන බවද විමර්ශන නිලධාරීහු පවසති. බූස්ස අධි ආරක්ෂිත බන්ධනාගාරය ඇතුළු බන්ධනාගාරවල නීතිගරුක නිලධාරීන්ටද රටින් පැනගත් මෙම පිරිස්වලින් තර්ජන පිට තර්ජන එන බව මේ සම්බන්ධව කළ විමසුමකදී බන්ධනාගාර ප්‍රධානීහු 'අරුණ' ට පෙන්වා දුන්හ. ඇතැම් බන්ධනාගාර නිලධාරීන්ගේ නිවෙස්වලට තම ගෝල බාලයන් යවා එම පවුල්වලට තර්ජනය කරන තත්ත්වයක් පැන නැගී ඇතැයිද අනාවරණය විය.

## ඩීසල් පැන්නූ ...

ගම්පහට නුදුරු ඩිපෝවකින් කලක පටන් ඩීසල් බූලි 05 බැගින් සොරකම් කළැයි කියන ලංකා ගමනාගමන මණ්ඩලයේ ප්‍රාදේශීය කළමනාකාරවරයකු සම්බන්ධයෙන් එම මණ්ඩලයේ පාලනාධිකාරිය විමර්ශනයක් ආරම්භ කර තිබේ.

මෙකී ප්‍රාදේශීය කළමනාකාරවරයා යටතේ ඩිපෝ දහයකට ආසන්න සංඛ්‍යාවක් පාලනය වන අතර එයින් එක් ඩිපෝවකින් කලක පටන් මෙම ඩීසල් සොරකම සිදුව ඇතැයි තොරතුරු අනාවරණය වී තිබේ.

මෙම ප්‍රාදේශීය කළමනාකාරවරයා ගම්පහ දිස්ත්‍රික්කයේ ප්‍රධාන පෙළේ දේශපාලකයකු මෙන්ම වත්මන් රජයේ ප්‍රබල ඇමැතිවරයකුගේ අනුහසින් මෙම තනතුරට පත්වූ අයකු බවත් ලංකා ගමනා ගමන මණ්ඩලයේ ආරංචි මාර්ග සඳහන් කරයි.

මෙම ප්‍රාදේශීය කළමනාකාරවරයා විසින් තමන් යටතේ පාලනය වන ඉහත කී ඩිපෝවේ බස් රථ සඳහා ලබාදෙන ඩීසල් ගණන් වැඩි කර සටහන් දමාගනිමින් දිනකට ඩීසල් ලීටර් විස්සක් පමණ බූලි පහකට එක්රැස් කරගනිමින් තම නිල කැබ් රථයෙන් රැගෙන යන බවද මූලික සොයාබැලීම්වලදී හෙළිවී ඇත.

මොහු පෞද්ගලික බස් හිමියන් කිහිප දෙනෙකු සමගින් මනා සම්බන්ධයක් ඇතිකරගත් අයෙකු බවත් ඔවුන්ට මෙම ඩීසල් අලෙවි කර තිබෙන බවත් වාර්තා වී ඇත.

මෙකී ප්‍රාදේශීය කළමනාකාරවරයා සිය නිල කැබ් රථයද විශාල අනතුරකට ලක්කර ඊට දැඩි අලාභ හානි කළේ යැයි කියන සිද්ධියකට අදාළ විමර්ශනයකටද ලක්වූ අයකු බවත් ලංකා ගමනා ගමන මණ්ඩලයේ ප්‍රකාශකයකු සඳහන් කළේය.

## ෂාෆ්ටර්ගේ ...

අධිකරණ නියෝග පරිදි දිනේෂ් ෂාෆ්ටර්ගේ මරණයට හේතුව සෙවීම සඳහා පත්කර තිබෙන ජ්‍යෙෂ්ඨතම අධිකරණ හා වෝහාරික වෛද්‍ය විශේෂඥයන්ගෙන් සමන්විත පංච පුද්ගල විද්වත් කමිටුව විසින් ගාල්ල කරාපිටිය ශික්ෂණ රෝහලේදී පැවැත්වූ දෙවැනි පශ්චාත් මරණ පරීක්ෂණය මේ වන විට අවසන් වී ඇතැයි ද කොළඹ ප්‍රධාන මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ඊයේ (11 වැනිද) අනාවරණය විය. බොරැල්ල සුසාන භූමියේ භූමදානය කර තිබූ දිනේෂ් ෂාෆ්ටර්ගේ දේහය ඉකුත් මැයි 25 වැනිද ගොඩ ගෙන එහි දෙවැනි පශ්චාත් මරණ පරීක්ෂණය පැවැත්වීමට ගාල්ල කරාපිටිය ශික්ෂණ රෝහල වෙත යොමු කර තිබිණි.

අදාළ මරණය සම්බන්ධයෙන් වන නිගමනවලට එළැඹීම සඳහා මහනුවර දී පැවැත්වීමට නියමිත සාකච්ඡාවලට විද්වත් කමිටුවට ගාල්ලේ සිට ඒමට සිදුවන බැවින් ඊට අදාළ ප්‍රවාහන, ආහාර පාන සහ නවාතැන් පහසුකම් ලබාදිය යුතු බවටද අධිකරණයේදී අනාවරණය විය. එම විද්වත් කමිටුවට නවාතැන් සහ ආහාර පාන පේරාදෙණිය තානායම මගින් සූදනම් කරන ලෙසත් ඒ පිළිබඳව ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයා දැනුවත් කර අවශ්‍ය ආරක්ෂාව ලබාදෙන බවත් අධිකරණය සඳහන් කළේය. එම විද්වත් කමිටුවේ විශේෂ සාකච්ඡාවක් පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය තුළදී ද පැවැත්වීමට නියමිත බවත් ඊට අවශ්‍ය පහසුකම් සපයන ආකාරය පිළිබඳවත් මෙහිදී අධිකරණයේ අවධානය යොමු විය. එම විද්වත් කමිටුවේ සාකච්ඡාවලින් අනතුරුව එහිදී එළැඹුණු නිගමන අධිකරණයට දැනුම් දීම සඳහා අදාළ නඩුව ලබන 25 වැනිද කැඳවන ලෙස අධිකරණය නියම කළේය.

## ගෙදරට ආ ආගන්තුකයා...

තම පුතු නිවසේ තනිවම සිටි අවස්ථාවේදී කුඩා දරුවකු රැගෙන පැමිණි පුද්ගලයකු ඔහු ඉක්මනට පැමිණෙන බවට පවසා තම පුතු වෙත කුඩා බිළිඳෙක් ලබාදී පිටව ගොස් ඇතැයි ද පැය දෙකකට අධික කාලයක් ගත වුවද එම පුද්ගලයා පැමිණ නැති බැවින් කාන්තාවක් හොරණ මූලස්ථාන ප්‍රධාන පොලිස් පරීක්ෂකවරයා හමුවී ඊයේ (11වැනිද) සවස පවසා තිබූ බව පොලිසිය කියයි.

වහා ක්‍රියාත්මක වූ මූලස්ථාන ප්‍රධාන පොලිස් පරීක්ෂකවරයා ළමා හා කාන්තා කාර්යාංශයේ ස්ථානාධිපතිනි උප පොලිස් පරීක්ෂක එල්. ඩී. ලියනගේ ඇතුළු නිලධාරීන් කණ්ඩායමක් නිවස වෙත පිටත් කර යවා බිළිඳා පොලිසිය වෙත රැගෙන ඒමට කටයුතු කළ බව පොලිස් නිලධාරිනියක් පැවසුවාය.

බිළිඳා දමා ගිය පුද්ගලයා සම්බන්ධයෙන් තොරතුරු සෙවීමේදී එම පුද්ගලයාගේ මිත්තණිය ඊට මදක් ඈතින් පිහිටා තිබෙන නිවසක වෙසෙන බවත් අනාවරණ වූ බව පොලිසිය කියයි.

ඒ අනුව මිත්තණිය පොලිසිය වෙත කැඳවා සිදු කළ ප්‍රශ්න කිරීමේදී මෙම දරුවා තම දියණියගේ පුතාගේ පුතා බවට සැක කරන බවත් නමුත් කිසිම දවසක දරුවා දැක නොතිබූ බවත් ඔවුන් අඟුරුවාතොට නාර්තුපාන ප්‍රදේශයේ පදිංචිව සිටින බවත් ඇය පොලිසියට ප්‍රකාශයක් ලබාදෙමින් පවසා ඇත. දරුවාගේ මව හොරණ ප්‍රදේශයේ ඇඟලුම් කර්මාන්ත ශාලාවක සේවය කරන්නියක් බවට ද තොරතුරු අනාවරණය වූ බවත් ඇය සොයා ගැනීමට ද පොලිසිය කටයුතු කරමින් සිටින බව උසස් පොලිස් නිලධාරියෙක් පැවැසීය.

හොඳින් වැඩී තිබූ බිළිඳා ඒ මොහොතේම හොරණ මූලික රෝහල වෙත යොමු කිරීමට කටයුතු කළ බව එම පොලිස් නිලධාරිනිය වැඩිදුරටත් පැවසුවාය.

බිළිඳා දස හැවිරිදි දරුවා භාරයේ තබා පලාගිය පුද්ගලයා තදින් මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වූවකු බවට තොරතුරු ලැබී ඇතැයි පවසන පොලිසිය ඔහු අත්අඩංගුවට ගැනීම සඳහා විශේෂ පොලිස් කණ්ඩායමක් යොදා පරීක්ෂණ ආරම්භ කළ බව පොලිසිය කියයි.

## විරේක බී කතක් මියගිය බව කියන සිද්ධිය

# මාමාගේ දුව මැරුණේ මගේ බෙහෙතෙන් නම් මම වැරැද්ද පිළිගන්නවා

### දේවාලයේ හිමිකාරිණිය කියයි


මියගිය සඳුනිකා

විවාහ වී වසර තුනකට ආසන්න වෙමින් තිබුණද දිල්මි සඳුනිකා විජේරත්නගේ හිතේ තිබූ ලොකුම හීනය පමාවෙමින් තිබුණි. වයස අවුරුදු විස්සේදී යුග දිවියට පිවිසි සඳුනිකා විසිතුන් හැවිරිදි විය පසුකරමින් සිටියදී ඇය මෙන්ම ඥතීහු ද ඇගේ දරු එල පමාවට පිළියම් සොයන්නට පටන් ගත්හ.

විවාහ වනතුරුම විවාහ වන්නේ කවදදැයි අසන්නාක් මෙන් විවාහ වූ පසු සැවොම අසන්නේ තවමත් දරුවකු නැද්ද යනුවෙනි. විවාහ වී වසරක්, දෙකක් ගතවන විට සඳුනිකාට ද එම අත්දැකීමට මුහුණදීමට සිදු වූවාය. වසර කිහිපයක් ගතවුවත් තම හිතේ වූ පැතුම ඉටුවන බවක් පෙනෙන්නට නොවූ තැන ඇය විවිධ වෛද්‍ය ප්‍රතිකාර වෙත යොමු වූවාය. ඒවායින් ද පලක් නොවූ බැවින් පවුලේ ඥතීන් ඇතුළු පිරිස කල්පනා කළේ නොපෙනෙන බලවේගයක හෝ පිහිට පතන්නටය. දියණිය දරුවන් නැතිකම ගැන සිතමින් දුක් වෙද්දී ඇගේ මවටද ඕනෑ වූයේ තම දියණියගේ කිරි සිහිනය ඉක්මනින් සැබෑ කිරීමටය.

විවාහයෙන් පසු සැමියාගේ ගම වන සීගිරියේ පදිංචියට ගිය සඳුනිකා අම්මාත්, තාත්තාත්, අයියාත් බලන්නට අත්තනකඩවල, ජම්බුරේගමට නිතර ආවා ගියාය. ඒ අතර ඉකුත්ද සඳුනිකාගේ අම්මා ගිරිතලේ තම ඥති සොයුරියක විසින් පවත්වාගෙන යන දේවාලයක් ගැන තොරතුරු සඳුනිකාට පැවැසුවාය. ඇය සැමියා සමග එහි ගියේ ඒ අනුවය.

ඇයට දරුඵල නොමැත්තේ සිරුරේ උෂ්ණාධික බව හේතුවෙන් බවත්, බඩ විරේක කර ඇඟ නිවා ගැනීම හොඳ යැයි කියද්දී ඔවුන් තීරණය කළේ එම ස්ථානයට යන්නටය.

ගම්ඉමේ ගෙදර 'ශාන්ති' නම් කාන්තාවක විසින් මෙම දේවාලය පවත්වාගෙන ගිය අතර ඇය නෑකමින් සඳුනිකාට අක්කා කෙනකුද වූවාය.

''දවස් තුනක් නැවතිලා ප්‍රතිකාර කරන්න ඕනෑ කිව්ව නිසා බිරිඳයි, ඇයගේ අම්මයි දේවාලේ නතර කරලා මම ආපහු සීගිරි ගියා. අපිට දරුවෝ නැති නිසා තමයි අපි මෙම ස්ථානයට ප්‍රතිකාර ගන්න ආවේ. දේශීය ඖෂධ ප්‍රතිකාර තමයි කරනවා කිව්වේ. ඒකට ඕනෑ කරන අඩුම කුඩුම අපිම ගිහින් දුන්නා'' යනුවෙන් පැවැසුවේ සඳුනිකාගේ සැමියායි.

## මෙහෙම වෙයි කියලා හීනෙකින්වත් හිතුවේ නෑ

**- මියගිය සඳුනිකාගේ මව**

මෙම දේවාලය පිහිටියේ ගිරිතලේ යාය 1, ප්‍රගති මාවත, සිසිල් සෙවණ නම් ස්ථානයේය. එම දේවාලයේ කපුවා ලෙස කටයුතු කරන්නේ ශාන්ති නමැති කාන්තාවගේ සැමියාය. සඳුනිකාට විරේකය සඳහා බොන්න දීමට ඇඹුල් පානයක් එහිදී සකසා තිබුණි. ඊට යොදගෙන තිබුණේ ඇඹුල් දෙඩම්, දෙහි, දිවුල්, කාමරංකා, සියඹලා, ඇඹරැල්ලා හා අරළුය. පානය බොන්නට දීමෙන් පසු සඳුනිකාට මළපහ හා වමනය යාමට පටන් ගැනිණි.

''මම දූවත් එක්කමයි මේ ගෙදර නැවතුණේ. දවස් දෙකක් ඒ විදිහට ඖෂධ ප්‍රතිකාර කළා. තුන්වැනි දවසේ උදේ වරුව වෙනකොට දූව කිව්වා ඇඟට පණ නෑ කියලා. බත් කන්න කිව්වම කන්න බෑ කියලත් කිව්වා. ඒ පාර කිරි වීදුරුවක් හදලා දුන්නා. ඊට ටිකකට පස්සේ විරේකය බොන්න දුන්නම දූවට අමාරු වුණා. ඇයට මළ මුත්‍රා ඇගේම පිටවුණා. මුල් දවස් දෙකේ එහෙම අමාරුවක් වුණේ නෑ. ඒත් තුන්වැනි දවසේ දූවට අමාරුයි කියලා කිව්වා. එයාට ටික වේලාවකදී සිහිය නැතිවුණා. පිටි එක හැදුණා වගේ එයා හෙල්ලෙන්නෙවත් නැතුව හිටිද්දී මම මගේ දූවගේ මූණට වතුර ටිකක් ඉස්සා. එයා එක සැරයක් ඇස් ඇරලා බැලුවා. එච්චරයි. අපි දූව ත්‍රීවීල් එකක දගෙන ඉස්පිරිතාලෙට ගියා. මගේ මල් කැකුළ ඒ වෙනකොටත් මාව දලා ගිහින්. මෙහෙම දෙයක් වෙයි කියලා මම හීනෙකින්වත් හිතුවේ නෑ දෙයියනේ. එහෙම නම් දූව මෙහෙම එක්කරගෙන එන්නේ නැහැ'' යැයි සඳුනිකාගේ අම්මා විලාප දෙමින් කීවාය.

සඳුනිකා ජයන්තිපුර රෝහලට ඇතුළත් කරන විටද මියගොස් සිටි බව පැවැසේ. එම රෝහල් භූමියේදී සඳුනිකාට ප්‍රතිකාර කළ ගම්ඉමේගෙදර ශාන්ති 'අරුණ' ට පැවසුවේ මෙවැන්නකි.

''මම දරුවෝ නැති ගොඩක් අයට මේ වගේ විරේක ප්‍රතිකාර කරලා තියෙනවා. ඒ අයට පසුකාලෙක දරුවෝ ලැබිලත් තියෙනවා. මේ මියගියේ මගේ මාමගේ දූව. මම කිසිම අහිතකින් මේ වගේ දෙයක් කළේ නැහැ. මේ නංගිට පිටි එක හැදෙනවා කියලා කිව්ව නිසා අපි ටික වෙලාවක් බැලුවා. ඒත් සිහිය ආවේ නැති නිසා රෝහලට ගෙනාවා. එයා මිය ගියේ මගේ බෙහෙත් නිසා නම් මම ඒ වරද පිළිගන්නවා. මම ඒකට දඬුවම් විඳින්නත් ලෑස්තියි.''

ශාන්ති එසේ කීවද දිල්මි සඳුනිකාට යළි ජීවිතය ලැබෙන්නේ නැත. ඇයගේ දරු සිහිනයට යළි පණ පොවන්නටද බැරිය. මිථ්‍යා විශ්වාස පසුපස ගොස් ජීවිතය පවා අහිමිකර ගත්තවුන් අතරට අලුතින්ම එක්වී සිටින්නේ සඳුනිකාය.


දේවාලය

## අපිට දරුවෝ නැති නිසා තමයි දේවාලයට ගියේ

**-මියගිය සඳුනිකාගේ සැමියා**


සඳුනිකා සහ සැමියා

සඳුනිකාගේ දේහය පිළිබඳ මරණ පරීක්ෂණය ඊයේ (11 වැනිද) පොළොන්නරුව මහ රෝහලේ අධිකරණ වෛද්‍ය නිලධාරී එල්. එන්. ජී. පෙරේරා විසින් සිදුකළ අතර එහිදී ලබාදුන්නේ විවෘත තීන්දුවකි. ඒ අනුව ඇයගේ සිරුරු කොටස් රජයේ රස පරීක්ෂකවරයා වෙත යවා පශ්චාත් මරණ පරීක්ෂණයක් සිදු කිරීමට නියමිතය.

ඊයේ (11 වැනිද) වනවිට සඳුනිකාගේ දේහය එම ඥතීන් වෙත බාරදී ඇති අතර, ඔවුනට උපදෙස් ලැබී ඇත්තේ ඕනෑම අවස්ථාවක මෘතදේහය ගොඩ ගැනීමට හැකි පරිදි භූමදානය කිරීමටය.

දේවාලය පවත්වාගෙන ගිය කාන්තාව මෙතෙක් අත්අඩංගුවට ගෙන නොමැති අතර, ඇයගෙන් දීර්ඝ වශයෙන් ප්‍රකාශ සටහන් කරගත් බව මින්නේරිය පොලිසිය පැවැසීය.

## මළසිරුර ගැන විවෘත තීන්දුවක්

## සිරුරු කොටස් රස පරීක්ෂකට


විරේකය සෑදීමට ගත් ද්‍රව්‍ය

මීට මාසයකට පමණ පෙර කාන්තාවකගේ සිරුරේ ඇති වශියක් ඉවත් කරන්නට කියා තැඹිලි ගෙඩි 21ක් සහ කහ දියර බෝතල් තුනක් බොන්නට දීමෙන් පසු ලග්ගලදී කාන්තාවක මිය ගිය පුවතේ උණුසුම මැකී යන්නටත් පෙර මෙවැනි සිදුවීම් ගැන පුන පුනා කතා කරන්නට වීමම කනගාටුවට කරුණකි.

සඳුනිකාට ලබාදුන් පානය හේතුවෙන් මරණය සිදුවූවාද නැතහොත් වෙනත් හේතුවක් ඊට බලපෑවේද යන්න පිළිබඳ පශ්චාත් මරණ පරීක්ෂණයෙන් පසු කරුණු අනාවරණය කරගත හැකිවනු ඇත.

■ දීපා වසන්ති එදිරිසිංහ

■ රසංග නිරෝෂන් - පොළොන්නරුව


### යතුරු පැදි රිය පොළ - අනුරාධපුර

| වාහන අංකය | නිෂ්පාදන ආ. | මාදිලිය |
|---|---|---|
| NC BES-79xx | හොන්ඩා | DIO |
| NC BHN-56xx | හොන්ඩා | DIO |
| NC BGE-36xx | හොන්ඩා | DIO SCV 110 |
| NC BBE-03xx | හොන්ඩා | DIO SCV 110 |
| NC BGN-52xx | හොන්ඩා | DIO SCV 110 |
| NC BDQ-18xx | හොන්ඩා | DIO SCV 110 |
| NW BGJ-77xx | හොන්ඩා | DIO SCV 110 |
| NW BAO-61xx | හොන්ඩා | DIO SCV 110 |
| NW BHH-40xx | හොන්ඩා | DIO SCV 110 |
| NW BHJ-42xx | හොන්ඩා | DIO SCV 110 |
| NW BIK-14xx | හොන්ඩා | DIO SCV 110 |
| NW BGV-50xx | හොන්ඩා | DIO SCV 110 |
| NW BGH-36xx | හොන්ඩා | DIO SCV 110 |
| NW BHX-84xx | හොන්ඩා | DIO SCV 110 |
| NW BIF-84xx | හොන්ඩා | DIO SCV 110 |
| NW BDB-94xx | හොන්ඩා | DIO SCV 110 |
| NC BEZ-21xx | හොන්ඩා | DIO SCV 110 |
| NC BCI-60xx | හොන්ඩා | DIO SCV 110 |
| WP- BDT-49xx | හොන්ඩා | DIO SCV 110 |
| WP BEW-24xx | හොන්ඩා | DIO SCV 110 |
| WP BIG-15xx | හොන්ඩා | DIO SCV 110 |
| NW BHR-31xx | හොන්ඩා | DIO SCV 110 |
| NW BFZ-80xx | හොන්ඩා | DIO SCV 110 |
| NC BEC-92xx | හොන්ඩා | DIO SCV 110 |
| NC BFA-77xx | හොන්ඩා | DIO SCV 110 |
| NC BIB-01xx | බජාජ් | PLATINA |
| NW BHV-84xx | බජාජ් | PULSAR 150 |
| NC BFE-30xx | බජාජ් | PLATINA |
| NC BAM-72xx | බජාජ් | CT 100 |
| NC BFJ-25xx | බජාජ් | PLATINA |
| NC BEW-45xx | බජාජ් | PULSAR 135 LS |
| NC BEG-42xx | බජාජ් | PULSAR 150 UG 4.5 |
| NC BHG-94xx | TVS | NTORQ |
| NC BEA-60xx | TVS | WEGO |
| NC BFK-54xx | TVS | WEGO |
| NW BFW-13xx | TVS | XL SUPER HD |
| NW BHX-51xx | TVS | NTORQ |
| NC BHI-50xx | TVS | NTORQ |
| NC BHK-04xx | TVS | METRO |
| NC BIP-34xx | යමහා | RAY-ZR |
| NW BGN-88xx | යමහා | RAY-ZR |
| NWBIR-83xx | යමහා | RAY ZR |
| NW BIW-54xx | යමහා | RAY ZR |
| NW BGH-91xx | යමහා | RAY ZR |
| NC BGZ-66xx | යමහා | RAY ZR |
| NW BIK-86xx | යමහා | RAY ZR |
| NC BCA-58xx | යමහා | FZ |
| NW BEW-74xx | හීරෝ | PLEASURE |

යාපනය හන්දිය, අනුරාධපුර. (යුනයිටඩ් මෝටර්ස් ඉදිරිපිට)

රිය පොළ පැවැත්වෙන දිනය - 14 - 07 - 2023 (10.30 පෙ.ව. සිට)
වාහන පරීක්ෂාව - 14 - 07 - 2023 (8.30 පෙ.ව. සිට 10.30 පෙ.ව.)

තරිඳු - 0773147609 විශ්ව - 0774787096

Hotline - 0117308080 Whatsapp - 071 0356125

පෙර දැනුම් දීමකින් තොරව ඕනෑම වාහනයක් ඉවත්කර ගැනීමේ බලය සමාගම සතුය.
*කොන්දේසි සහිතයි

AMF ඇසෝසියේටඩ් මෝටර් ෆිනෑන්ස් කම්පැනි පීඑල්සී
ප්‍රධාන කාර්යාලය
නො.146, හැව්ලොක් පාර, තිඹිරිගස්යාය.
දුරකථන: 0115 553663





කතුවැකිය

ලිබර්ටි පබ්ලිෂර්ස් ප්‍රයිවට් ලිමිටඩ්
අංක 91, විජේරාම මාවත, කොළඹ 7.
දුරකතන : 0115 200 900
ෆැක්ස් : 0112 673 451
ඊ මේල් : aruna.editor@liberty.lk

කර්තෘමණ්ඩලය : 0115978982, 0115978985 ෆැක්ස් : 0112 673451
දැන්වීම් : 0112 672601, 0112 672603 ෆැක්ස් : 0112 672648
බෙදාහැරීම් : 0112 127204, 0112 127210 ෆැක්ස් : 0112 455134
වෙබ් : www.aruna.lk

Follows us on https://www.facebook.com/aruna.lk.official
Follow us on https://twitter.com/arunapuwath
Follow us on https://www.instagram.com/aruna.lk

# පරිසරවේදීන් 'සාදු' කියපු සෙලනිකාට 'බායි' කිව්වා...

ජය ශ්‍රී මහ බෝධීන්වහන්සේගෙන් පසු, අෂ්ටඵල, දෙතිස්ඵල බෝධීන්වහන්සේලාගෙන් පසු මේ රටේ වැඩියෙන්ම කියැවුණු ගසක් වේ නම් ඒ 'කෲඩියා සෙලනිකා'ය.

මධ්‍යම අධිවේගී මාර්ගය ඉදිවෙමින් පැවතෙන අතරතුර එහි කඩවත- මීරිගම අතර කොටස වැටී ඇති දරළුවේදී මේ අමුතු නමක් සහිත වෘක්ෂයාණෝ එක්වනම ඒ මග අහුරාගෙන නැගී සිටියහ. එපමණක් නොව එතැන් පටන් 'කෲඩියා සෙලනිකා' නමින් පුවත් මවන්නට පටන් ගත්හ. මේ වනාහී ලොවෙන් සඳහටම සමුගෙන ගිය වෘක්ෂ පරම්පරාවක උච්ඡාන වීමක් ලෙසින් පරිසරවේදීහු කරුණු දැක්වූහ. පරිසරය විෂයෙහි ගල් ද මල් ද එකසේ උරුම කරගත් දේවානි නමද මෙහි ලා ඈඳුණු විට 'සෙලනිකා වාදය' තවදුරටත් උච්ච විය. ඒ සමගින්ම පරිසරවේදීන්ට අලුත් සටන් පාඨයක්ද හිමිවිය. 'ලොවෙත් නැති' මේ ගස අධිවේගී මගට බිලිදිය නොහැකි යැයි පරිසරවේදීහු ගස වෙනුවෙන් සටන ඇරඹූහ. මේ අතර මේ වෘක්ෂයාණන් නිරුපද්‍රිත කිරීම වෙනුවෙන් අධිවේගී මග එහා මෙහා කිරීමට සිදුවුවහොත් ඒ වෙනුවෙන් බිලියන 15ක අතිරේක වැයක් දරන්නට සිදුවන බව රජය පැවසීය. ඒ අයුරින් මේ 'කෲඩියා සෙලනිකා' ශාකය පරිසර ගැටලුවකින් ඔබ්බට ගොස් දේශපාලනික ප්‍රශ්නයක් බවටද පත්විය. ගසක් වෙනුවෙන් රටක සංවර්ධන කාර්යයක් හෝ රටට මුදල් බිලියන ගණනක් වැය කළ යුතු නැතැයි යන මතයේ එක් පිරිසක් කරුණු දැක්වූහ. රටක් වටින ගසක් ලෙසින් මෙය මෙම ස්ථානයේම නිරුපද්‍රිත කළ නොහැකි නම් ආරක්ෂිතව වෙනත් තැනක ප්‍රතිස්ථාපනය කළ යුතුයැයි තවත් පිරිසක් කරුණු දැක්වූහ. මේ ආකාරයෙන් 'සෙලනිකා ප්‍රේමීන්' සහ 'සෙලනිකා නාශකයන්' ලෙස පෙරමුණු දෙකක් දෙපසින් සටන් පාඨ දක්වන අතරවාරයේ 'සෙලනිකා ප්‍රේමීන්' විසින් ගසේ ආරක්ෂාව වෙනුවෙන් යැයි එයට සිවුරක් පෙරවා ගස මහණ කිරීමටද යෙදුණි.

මේ අල්ලපනල්ලේ 'මේ මොන විහිළුවක්ද? මේ වගේ ගස් අපේ ඉඩම්වල තව ඕනි තරම් තියෙනවා අපි මේවට කියන්නේ 'පණු කරඳ' කියලා. මොකට මේ පණු කරඳ ගහක් අල්ලගෙන මැරෙන්න හදනවාද' යි සමහරෙක් කියන්නට ගත්හ. කෙසේ අවසානයේ මේ කියන්නාවූ 'කෲඩියා සෙලනිකා' රැකගත යුතු යැයි කියන පිරිස්වලට එය 'පඬු කරඳ' වූ අතර මේ 'වෘක්ෂ ප්‍රේමය' විහිළුවක් ලෙසින් ගත් අයට මෙය 'පණු කරඳ' විය.

කොහොමින් කොහොමින් හෝ අද වන විට දරළුවේ 'පඬු කරඳ' ගසක් හෝ 'පණු කරඳ ගසක්' නැත. පෙරේද හෙවත් 10 වැනිද සැන්දෑවේ මේ ගස නොඑන ගමන් ගොස් තිබිණි (ගස මහණ කර තිබූ නිසා එය අපවත් කළා යැයිද යමකුට කිව හැකිය) රටක් රාජ්‍යයකට යටත් නොවූ ගසක් 'සුටුස් ගා' අතුරුදන් වූයේ කෙසේ දැයි රට්ටු මුහුණු පොත් ආදිය පීරමින් සොයද්දී බන්දුල ගුණවර්ධන විසින් ඊයේ එහි වගකීම භාරගනු ලැබිණි. අධිවේගී මාර්ග ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන අවට පමණක් වසර හතළිහටත් වඩා පැරණි මෙම ගස් 15ක් පමණ තිබෙන බවද අඩි 12ත් 15ත් අතර උසින් යුත් තවත් පඬු කරඳ ගස් විසිපහක් පමණ ඇති බවද පවසන හෙතෙම ඒ අනුව දරළුවේ පඬු කරඳ ගස පිළිබඳ කතාව මිථ්‍යාවක් යැයි පවසයි. එබැවින් මෙම ගස කපා ඉවත් කිරීමට ඔහු කළ යෝජනාව කැබිනට් මණ්ඩලයේ අනුමැතිය ලැබුණු බවත් රජයේ ප්‍රතිපත්තිමය තීරණයක් මත ගස කපා ඉවත් කිරීමට යෙදුණු බවත් බන්දුල ගුණවර්ධන ඇමැතිවරයා පවසා ඇත්තේය. මේ කැපූ ගස වෙනුවට එම ගස් 200ක් පැළ කිරීමට සූදනම් බවද ඔහු වැඩිදුරටත් පවසා තිබිණි. එයින් ගම්‍ය කිරීමට හදනුයේ මෙය දුලබ නොවන මෙන්ම බෝකර ගැනීමට අපහසු ශාකයක් නොවන බව විය යුතුය.

බන්දුල ගුණවර්ධන ඇමැතිවරයා පවසන අන්දමට රජය මෙම තීරණය ගෙන ඇත්තේ මනා අධ්‍යයනයකින් පසුවය. ඔහුට අනුව දරළුවේ පඬු කරඳ ගස යනු පරිසරවේදීන්ගේ අතිශෝක්තියකි. අතිශෝක්තිය යනු බොරුවේ මල්ලීය. මෙයට පෙරද මෙරට පරිසරවේදීන් යැයි කියන්නාවූ සමහරකු විසින් විශේෂයෙන්ම රටේ සංවර්ධන ව්‍යාපෘති හමුවේ පැවසූ සමහරක් දේ අතිශෝක්තීන් බව කාලයාගේ ඇවෑමෙන් ඔප්පු වී ඇත්තේය. මේ අතර පඬු කරඳ ගස ගැන බන්දුල ඇමැතිගේ අධ්‍යයනය දෙස් රහිත බව ඔප්පු වුවහොත් මෙරට පරිසරවේදීන් යන කොට්ඨාසය විසින් මත්තෙහි කරනු ලබන ප්‍රකාශද බොරුම නොවුණත්, බොරුවේ මල්ලිලා ලෙසින් රට්ටු දකිනු ඇත. එය එතරම් ගුණ නැත. මන්ද රටේ සැබෑම පරිසර ප්‍රශ්නයක් මතුකරන වෙලාවකදී වුව ඔවුන්ව විශ්වාස කරමින් ඔවුන් වටා ජනමතය එකතු නොවීමට ඉඩ ඇති බැවිනි. (අපි 'කොටි ආවෝ' කථාව උගත්තේ ප්‍රංචිම වයසේදීය)

කෙසේ නමුත් හොඳින් හෝ නරකින් මධ්‍යම අධිවේගය කඩවත සිට මීරිගමට ඇදෙන්නට තිබූ විශාල අවහිරයක් කැබිනෙට්ටුවේ අනුහසින් දැන් දුරීභූත වී ඇත. එම අවහිරය දුරීභූත වූ පමණින් මධ්‍යම අධිවේගයේ එම කොටසේ ඉදිකිරීම් වෙනුවෙන් ඇති ආර්ථික බාධා ඇතුළු සෙසු සියලු බාධා ඉවත් වන්නේද? කඩවත සිට මීරිගම අතර තැනින් තැන භාගෙට ඉදිව දිරායන අධිවේගයේ පාලම්, වැස්සෙන් හේදී පදස පිටින් ගැලවී යන පස් පිරවුම් ආදිය නෂ්ටව ඇති ජාතික අපරාධ මෙන් දිස්වන්නේය. එම අපරාධය තවදුරටත් සිදුවිය යුතු නැත. රටේ අනෙක් මොන අධිවේගී මාර්ගයෙන් පැමිණියත් කඩවතින් නික්මී සාමාන්‍ය මාර්ගය ඔස්සේ මීරිගම දක්වා කර්කශ ගමනක යෙදී මධ්‍යම අධිවේගී මාර්ගයට ගොඩවීමට සිදුව ඇති 'කරුමය' ඉක්මනින්ම ඉවත්වන්නේ නම් දරළුවේ කෲඩියා සෙලනිකා ඒ වෙනුවෙන් දිව පිදුවේ යැයි සිතා රට්ටු හිත හදගනු ඇත.

එපමණක් නොව රටේ සංවර්ධන වැඩසටහනක් ක්‍රියාත්මකවීමේදී පරිසර ඇගයුම් වාර්තාවට අනුව එකකුත්, අනතුරුව පරිසරවේදීන්ගේ වාර්තාවට අනුව එකකුත් ලෙසින් ඒවා කරන්නට ගියහොත් සිදුවන්නේ තාත්තත් පුතත් බූරුවා කරගහගෙන ගිය කතාවමය.

---

**ශ්‍රී ලංකා කොමියුනිස්ට් පක්ෂයේ 80 වැනි සංවත්සරය පසුගියදා බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාවේදී පැවැත්වුණි. වම සහ දකුණේ සීමා මායිම් සොයා ගත නොහැකි සමයක එම සැමරීම ගැන බොහෝ කතාබහට ලක්ව ඇත. වාසුදේව නානායක්කාර මෙරට වාමාංශික දේශපාලනයේ පැරැණිතම පුරුකකි. මේ සංවාදය ඔහු සමගය.**

# පොඩි මිනිහගේ ඊපීඑෆ් පොලිය 9%ට අඩුකරලා මහබැංකුවේ අය 29% ගන්නවා



**ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට් පක්ෂයේ 80 වැනි සංවත්සරය පසුගියදා පැවැත්වුණා. අවුරුදු 80කට පස්සෙ පැරණි වමේ දේශපාලන පක්ෂවල ක්‍රියාකාරීත්වය ගැන ඔබට සෑහීමකට පත් වෙන්න පුළුවන්ද?**

අපේ පැරණි වමේ දේශපාලන පක්ෂ අලුතින් බිහි වූ සමාජවාදී පක්ෂ සමග එකට බද්ධවෙලා අලුත් ගැම්මකින් කටයුතු කර ගෙන යනවා. අද අපි නියෝජනය කරන උත්තර ලංකා සභාගයට දේශපාලන පක්ෂ අටක් එකතු වී සිටිනවා. අපි හැමෝම නියෝජනය කරන්නේ වමේ කඳවුරයි. අපේ රටේ වමේ දේශපාලන කඳවුරු වෙන් කරන අලුත්ම රේඛාව තමයි ජාත්‍යන්තර මූල්‍ය අරමුදල. මේ අරමුදල එක්ක එකතුව කටයුතු කරන්නෙ මේ රටේ වමට එරෙහි දේශපාලන කණ්ඩායම් කියල අපි පැහැදිලිව කියන්න ඕනේ. ඔවුන්ගේ අරමුණ අධිරාජ්‍යවාදී කුමන්ත්‍රණකරුවන් හරහා මේ රට පවා දීමයි. ඊට එරෙහිව අපි වමේ දේශපාලන පක්ෂ විදියට පාර්ලිමේන්තුවේදීත් ඉන් පිටතදීත් දැඩිව ක්‍රියා කරනවා. අපි විශ්වාස කරනවා දැන් රටේ ජනතාව සැබෑ වාමාංශික කඳවුරු විදියට අපිව හඳුනාගෙන අපත් සමග දිගු ගමනක් යන්න සූදනමින් ඉන්නවා කියල.

**කතා කළොත් අධිරාජ්‍යවාදී කුමන්ත්‍රණ. හැබැයි මේ දක්වා එක කුමන්ත්‍රණයක්වත් හෙළිදරව් කර ගන්න බැරි වුණා නේද?**

අපේ රටේ රජ්ජුරුවන්ගේ පාලන කාලයේ ඉඳලම නොයෙක් ආකාරයෙන් කුමන්ත්‍රණ ක්‍රියාත්මක වී තිබෙනවා. ඒවාගේ ප්‍රතිඵලයක් විදියට තමයි ඉංග්‍රීසින් අපේ රට යටත් කර ගත්තෙ. එවැනි කුමන්ත්‍රණ දැනුත් ක්‍රියාත්මක නොවෙනවා කියන්න බෑ. ඔබ දන්නවා පසුගිය දවස්වල ඇමරිකාවේ රහස් ඔත්තු සේවයේ ලොක්කො අපේ රටට ඇවිත් ජනාධිපති රනිල් වික්‍රමසිංහ එක්ක කතා කරල ගියා. ඒ අය ආවේ ඇයි? ජනාධිපති එක්ක මොනවද කතා කළේ කියල මේ දක්වා රටට හෙළි කරලා නෑ. අපි මේ ගැන පාර්ලිමේන්තුවේදී දීර්ඝ වශයෙන් කරුණු හෙළි කරලා ආණ්ඩුවෙන් ප්‍රශ්න කළා. නමුත් එද මේ ගැන ආණ්ඩුවට උත්තර නැතිව නිහඬව හිටියා. මේවා කුමන්ත්‍රණ නොවෙයි කියන්න පුළුවන්ද? එද පාර්ලිමේන්තුවේදී මේ ගැන කතා කරන විට ජනතා විමුක්ති පෙරමුණ නිහඬව හිටියා. අපිට අදටත් ප්‍රශ්නයක් තියෙනවා වමේ බලවේගයක් කියා ගන්නා ජවිපෙ එද ඇමරිකානු අධිරාජ්‍යවාදී කුමන්ත්‍රණ ගැන කතා කරන අවස්ථාවේ නිහඬව හිටියේ ඇයි කියල. ඒකෙන් අපි තේරුම් ගත්තෙ ජවිපෙ දෙබිඩි පිළිවෙතක් තිබෙන දේශපාලන පක්ෂයක් විදියටයි. මොකද ඒ අය ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ආණ්ඩුවේ යෝජනාවට විරුද්ධ වුණා. ඒ වුණාට අධිරාජ්‍යවාදී කුමන්ත්‍රණ ගැන කතා කරන කොට නිහඬව හිටියා. ජවිපෙ ශ්‍රී ලංකාවේ ඇමරිකානු තානාපතිනිය ඔවුන්ගේ කාර්යාලයට ගෙන්වා ගෙන කතා කළා. ඒ ගැන ප්‍රශ්නයක් නෑ. අපි තවමත් විශ්වාස කරනවා ජවිපෙ නිවැරදි වමේ කඳවුර නියෝජනය කරමින් ඉදිරියේදී කටයුතු කරයි කියල.

**අධිරාජ්‍යවාදී කඳවුරට එරෙහි කඳවුර වමේ කඳවුර කියල ඔබ කීවත් සමාජවාදි කියන සමහර අය සජබය එක්ක සන්ධානගත වෙන්න සාකච්ඡා කරමින් ඉන්න බවත් වාර්තා වෙනවා නේද?**

අපේ උත්තර ලංකා සභාගයේ කිසිම කෙනෙක් සජබය එක්ක හෝ ආණ්ඩුව එක්ක සන්ධානගත වෙන්නෙ හෝ ඒ අයට මුක්කු ගහන්න යන්නෙ නෑ. නිදහසේ ජනතා සභාවේ සමහර අය සජබය එක්ක සන්ධාන ගත වෙන්න සාකච්ඡා කරන බව අපිටත් ආරංචි වෙලා තිබෙනවා. සජබයට ගියත් ආණ්ඩුවට ගියත් ඔය දෙකම එකයි කියලයි අපිට කියන්න තියෙන්නෙ. නිදහසේ ජනතා සභාව සජිත් හෝ රනිල් එක්ක සන්ධානගත වුව හොත් ඔවුන්ට අනාගතයේදී න්‍යායාත්මකව වෙනම ඉන්න බැරි තත්ත්වයට පත් වේවි.

**පළාත් පාලන මැතිවරණයට ඔබ සියලුදෙනාම එකතුවෙලා හෙලිකොප්ටරයට නැංගා නේද? ඔබලා හෙලිකොප්ටරයට බර වැඩි වුණාද?**

උත්තර ලංකා සභාගයේ අපි නිදහසේ ජනතා සභාව එක්ක එකතුව හෙලිකොප්ටරයක් හද ගත්තෙ පළාත් පාලන මැතිවරණය සඳහා පමණමයි. එද අපිත් එක්ක ජනජය පෙරමුණත් එකතු වුණා. නමුත් දැන් අපිට පෙනෙනවා ජන ජය පෙරමුණේ අයත් ආණ්ඩුව එක්ක එකට ඉන්නෙ කියල. ඒ අතර නිදහසේ ජනතා සභාවේ සමහර අය එක්කරා විදියක විචිකිච්චාවකින් ඉන්නෙ කියලත් අපිට පේනවා.

**ඔබ හැමදාම කීවේ ඔබ නියෝජනය කරන්නෙ නිර්ධන පන්තිය කියලා. නමුත් සමෘද්ධි සහනාධාර ලබන පවුල්වලට රජයේ අස්වැසුම වැඩපිළිවෙළින් හානිය සිදු වන බව කියමින් රට පුරා උද්ඝෝෂණ සිදු වුණා. ඒ තැන්වල ඔබ දකින්න හිටියේ නෑ නේද?**

අපි පාර්ලිමේන්තුව තුළ මේ සම්බන්ධයෙන් දිගින් දිගටම කතා කරලා අස්වැසුම අකුලා ගන්න කියල රජයට බලපෑම් කරමින් ඉන්නෙ. මේ රටේ අඩු අදායම්ලාභී පවුල් නිවැරදිව හඳුනාගෙන ඒ සහනාධාර ලබා දිය යුතුයි කියන ස්ථාවරයේ අපි ඉන්නවා. ආණ්ඩුව එය ඉටු නොකළොත් අපිත් ජනතාව එක්ක පාරට බහින්න සූදනම්.

**මෙරටේ වැඩ කරන ජනතාව නියෝජනය කරන්නෙත් ඔබලා කියලයි ඔබලාම කියන්නෙ. නමුත් රජය දේශීය ණය ප්‍රශස්ථකරණය කිරීමේදී සේවක අර්ථසාධක අරමුදලට හා විශ්‍රාම වැටුප් අරමුදල්වලට දැඩි බලපෑමක් සිදු වන බවට ආන්දෝලනයක් තිබෙන පසුබිමක ඔබලා මොනවද කරන්නෙ?**

මේ යෝජනාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ අවස්ථාවේදී අපි ඊට විරුද්ධව ඡන්දය ප්‍රකාශ කරල තිබෙනවා. ඊට අමතරව අපි රජය මේ කරන්න හදන මගඩිය ගැන වැඩ කරන ජනතාව දැනුම්වත් කරමින් ඉන්නවා. ඔවුන් දන්නෙ නෑ ඔවුන්ගේ අරමුදලේ වටිනාකම ට්‍රිලියන හතරකින් අඩු වෙනවා කියලා.ඒ විතරක් නොවෙයි සේවක අර්ථසාධක අරමුදලේ තැන්පත්කරුවන්ට ගෙවන පොලියත් 9% ට සීමා කරලා. නමුත් මහ බැංකු අධිපති නන්දලාල් මහත්තයාගේ සේවක අර්ථසාධක අරමුදලේ පොලිය 29% ක් කර ගෙන තිබෙනවා. මේ තත්ත්වයට එරෙහිව අපි දිගින් දිගටම සටන් කරනවා ඒ සටන ජයග්‍රහණය කරලා වැඩ කරන ජනතාවගේ අරමුදල් රැක දෙන්න අපි පියවර ගන්නවා.

**ආණ්ඩුව කරන හැම දේටම විරෝධය දැක්වීම වමේ කඳවුරේ ප්‍රතිපත්තියද?**

නෑ. අපි ආණ්ඩුව කරන හැම දේටම විරෝධය දැක්විය යුතුයි කියන ස්ථාවරයක නෑ. නමුත් දැන් ආණ්ඩුව කරන හැම දෙයක්ම පොදුජන විරෝධී බවක් තිබෙනවා. ජනතාව අපිට ඡන්දයක් දීලා මෙතැනට එවලා තිබෙන්නෙ පොදුජන විරෝධී වැඩවලට අනුමැතිය දෙන්න නොවෙයි කියල අපි කල්පනාවෙන් ඉන්නෙ. ජනතාවාදී මෙන්ම ප්‍රගතිශීලී වැඩ රජය යෝජනා කරලා ඒවා ක්‍රියාත්මක කරනවා නම් ඒවාට අපි සහාය දෙන්න සූදනම් කියලත් කියන්න ඕනේ.

**පළාත් පාලන මැතිවරණය කල් දැමූ ආණ්ඩුව දැන් ජනාධිපතිවරණයකට සූදානම් බවටත් කතා පැතිරෙනවා. ජනාධිපතිවරණයකට උත්තර ලංකා සභාය සූදානම්ද?**

පළාත් පාලන මැතිවරණය කියන්නේ මෙරටේ ජනතා පරමාධිපත්‍යයේ එක් කොටසක්. ඒක වෙනස් කරන්න රජයට පුළුවන්කමක් නෑ. දැන් ආණ්ඩුව කියන විදියට රටේ ආර්ථිකය සාධනීය මට්ටමකට දියුණු වී තිබෙනවා නම් පළාත් පාලන මැතිවරණය සඳහා මුදල් වෙන් කරන්න පුළුවන්. පළාත් පාලන මැතිවරණයට නැති සල්ලි වෙනත් මැතිවරණයකට කොහෙන්ද? ඇත්තටම මේ පිළිබඳව අධිකරණයේ අවධානය යොමු කරලා මුදල් අමාත්‍යවරයා විදියට ජනාධිපතිවරයාට නියෝග කළ යුතුව තිබෙනවා පළාත්පාලන මැතිවරණයට මුදල් වෙන් කරලා දෙන්න කියල.

**මම ඔබෙන් ඇහුවේ ජනාධිපතිවරණයට ඔබලාගේ සූදානම කොහොමද කියලයි?**

අපි උත්තර ලංකා සභාගය විදියට මෙරටේ පැවැත්වෙන ඕනෑම මැතිවරණයකට මුහුණ දෙන්න සූදනම්වයි ඉන්නෙ. ජනාධිපති වෙන්න පුළුවන් ඊට සුදුසු අයත් අපේ සභාගයේ ඉන්නවා.

**ඔබ හිතනවාද මැතිවරණ ජයග්‍රහණයක් සඳහා ජනතාව ඔබේ පාර්ශ්වට සහාය දක්වයි කියල?**

මැතිවරණයක ජයග්‍රහණය හෝ පරාජය නොවෙයි අපි අපේක්ෂා කරන්නෙ. මැතිවරණ ප්‍රතිලවලට කළහැකි බලපෑම කොතෙක්ද කියලයි අපි තක්සේරු කරන්නෙ. මොකද මේ රටේ ඒකාධිපති බලයක් ලබා ගන්න ඉඩ නොදිය යුතුයි. අධි බහුතර බලයක් ලබා ගැනීම වළක්වා ගන්න අපේ සභාගයට හැකියාව තිබෙනවා.

**ඔබ පසුගිය දිනක සඳහන් කර තිබුණා මහින්ද රාජපක්ෂගේ කාලය ඉවරයි කියල. ඔබත් ඔහුගේ දේශපාලන සමකාලීනයෙක් නිසා ඔබේ කාලයත් ඉවරයි කියලද කියන්නෙ?**

මම කීවේ එතුමාගේ මැද මාවතේ දේශපාලනය අවසන් කියලයි. මේ රටේ තවදුරටත් මැද මාවතේ දේශපාලනයක් නැති නිසා එතුමාගේ නායකත්වයේ වලංගුභාවය අවසන් වී තිබෙනවා.


**රටේ ආර්ථික අර්බුදයට හේතු වූ කරුණු අධ්‍යයනය කරන්න ඉදිරිපත් කළ පාර්ලිමේන්තු තේරීම් කාරක සභාවට විරුද්ධව පාර්ලිමේන්තුව තුළ ස්වාධීන කමිටුවක් පත් කරන්න සජිත් සූදානම් වෙනවා. මේ ගැන මොනවද කියන්නෙ?**

ඇත්ත වශයෙන්ම රටේ ආර්ථික අර්බුදය හේතු හොයන කමිටුව ස්වාධීන විය යුතුයි. නමුත් කතානායකවරයා පත් තිබෙන කමිටුවට පත් කර ඇති මන්ත්‍රීවරු සම්බන්ධයෙන් වැඩි පිරිසකගේ අප්‍රසාදයක් පළවී තිබෙනවා. මේ නිසා විපක්ෂයේ පක්ෂ එකතුව ස්වාධීන කමිටුවකින් ඒ කාර්ය කරන්න සාකච්ඡා කෙරෙමින් පවතිනවා. සජිත් ප්‍රේමදාස මහතා සමග පැවති එම සාච්ඡාවට අපේ උත්තර ලංකා සභාගයෙන් උදය ගම්මන්පිල සහෝදරයා සහභාගි වුණා. නමුත් අපි තවම අවසන් තීරණයක් අරගෙන නෑ අපි කටයුතු කළ යුත්තේ කෙසේද කියල. දැනටමත් සමහර මන්ත්‍රීවරු කතායකවරයා පත් කළ කමිටුවෙන් ඉවත් වී තිබෙනවා.

**ශ්‍රීලනිපය සර්වපාක්ෂික ආණ්ඩුවක් යෝජනා කරලා ඒ වෙනුවෙන් පෙනී සිටින බවක් පේනවා.මේ අවස්ථාව සර්වපාක්ෂික ආණ්ඩුවක් හදන්න පුළුවන් වාතාවරණයක් තිබෙනවාද?**

අපිත් මුලදී සර්වපාක්ෂික ආණ්ඩුවක් පිහිටුවා ගන්න යෝජනා ඉදිරිපත් කළා. නමුත් ඒ වෙලාවේ ඊට කාගෙන්වත් සහයක් ලැබුණෙ නෑ. දැන් සර්වපාක්ෂික ආණ්ඩුවක් කියන කාරණය වලංගු නෑ. ශ්‍රීලනිප දැන් ඒ කාරණය ඉස්මතු කරන්නෙ ඒ අයට ආණ්ඩුවට රිංගා ගැනීමේ ක්‍රමයක් සඳහා පමණයි කියලයි මම හිතන්නෙ.

■ සංවාදය - ජයසූරිය උඩුකුඹුර




## ගපිරිගේ කවිය

### රියදුරු මහතුනේ...

නොසැලකිල්ල හින්ද වුණු විනාසෙකි
පවුලේ අයට ජීවිත නැතිවුණා සකි
සල්ලිවලින් නම් පියවා ගනු නොහැකි
අනතුරු මෙවැනි දැන් දැන් ළඟ ළඟ ම දකී

දහක් ගැටලු ඔළුවේ ගොඩ ගසාගෙන
සමහරු සිහිය නැතිවෙන දේ ගසාගෙන
තව අය වෙන දෙයක් වෙද්දෙන් කියාගෙන
රියදුරු මහතුනේ, මාවත හරිද යන?



# යල කන්නයේ වී මණ්ඩලය මිල දී ගනියි

■ සාලිය කුමාර ගුණසේකර

මෙවර යල කන්නයේ වී අස්වැන්න වී අලෙවි මණ්ඩලය හරහා මිලදී ගැනීමට රජය සැලසුම් කර ඇත.

නාඩු සහ රතු කැකුළු වී කිලෝවක් රුපියල් 95 කට ද,සම්බා වී කිලෝවක් රුපියල් 100 කට ද,කීරි සම්බා වී කිලෝවක් රුපියල් 110 කට ද ගොවීන්ගෙන් මිලදී ගැනීමට නියමිතය.

ඒ අනුව,වී මිලදී ගැනීම සඳහා රජය ලබාදෙන මුදල් ප්‍රමාණය අනුව වී මිලදී ගැනීම සිදු කරන බව කෘෂිකර්ම ඇමැති මහින්ද අමරවීර කීවේය.

ඉකුත් මහ කන්නයේදී (2022/23) රජය දිස්ත්‍රික් ලේකම්වරු හරහා රුපියල් බිලියන 13 ක වී මිලදී ගත්තේය.එලෙස මිලදී ගත් වී තොග අඩු ආදයම්ලාභී පවුල් ලක්ෂ 29 ක් අතර බෙදදීමට කටයුතු කෙරිණි.

# ජරාව කන නිලධාරීන් කොළඹ කුඹුරු තරගෙට ගොඩ කරලා

■ සාලිය කුමාර ගුණසේකර

කුඹුරු ගොඩ කිරීමට සහාය දෙන නිලධාරීන්ට විරුද්ධව නිසි ක්‍රියාමාර්ග නොගැනීම නිසා කොළඹ දිස්ත්‍රික්කයේ කුඹුරු ගොඩ කිරීම ඉහළ ගොස් ඇතැයි කොළඹ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේදී ඊයේ (11 වැනිද) සාකච්ඡා කෙරිණි.

කොළඹ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව එහි සම සභාපතිවරුන් වන බස්නාහිර පළාත් ආණ්ඩුකාර මාර්ෂල් ඔෆ් ද ෆීල්ඩ් රොෂාන් ගුණතිලක, පාර්ලිමේන්තු මන්ත්‍රී ප්‍රදීප් උඳුගොඩගේ ප්‍රධානත්වයෙන් කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේදී පැවැත්වුණි. මෙම අවස්ථාවට පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වන මධුර විතානගේ,ගාමිණී ලොකුගේ, එරාන් වික්‍රමරත්න, සරත් වීරසේකර සහභාගි විය.

මෙහිදී ඇතැම් නිලධාරීන් රැකියාවක් ලෙස කුඹුරු ගොඩ කරන බවද, මෙලෙස වැඩිපුර ගොඩ කරනු ලබන්නේ ඇළ මාර්ග ආශ්‍රිත කුඹුරු ඉඩම් බවද, මෙම තත්ත්වය ගංවතුර තත්ත්වයන් ඇතිවීමට සෘජුව බලපාන බව පාර්ලිමේන්තු මන්ත්‍රී ප්‍රදීප් උඳුගොඩ කීවේය. පාර්ලිමේන්තු මන්ත්‍රී සරත් වීරසේකර කියා සිටියේ පන්නිපිටිය ප්‍රදේශයේ මහා පරිමාණයෙන් කුඹුරු ඉඩමක් ගොඩ කෙරෙන බවද, ඊට ගොවිජන සේවා නිලධාරිනියක්ද සහාය දක්වන බවය.



## ඉන්දීය විදේශ ලේකම්-ජනපති හමුවෙයි

නිල සංචාරයක් සඳහා මෙරටට පැමිණි ඉන්දීය විදේශ ලේකම් විනේ මෝහන් ක්වාත්‍රා සහ ජනාධිපති රනිල් වික්‍රමසිංහ අතර හමුවක් ආරක්ෂක අමාත්‍යාංශයේ දී ඊයේ (11 වැනිදා) සිදු විය.

දෙරට අතර ද්විපාර්ශ්වික සබඳතා තවදුරටත් වැඩිදියුණු කර ගනිමින්, දෙරටේම ජනතාවට ප්‍රතිලාභ සැලසෙන අයුරින් ඉදිරි ආර්ථික සහ සමාජයීය අරමුණු ජය ගැනීම පිළිබඳ මෙහිදී දීර්ඝ ලෙස සාකච්ඡා කෙරිණි.

මෙරට ආර්ථිකය ගොඩනැංවීමට රජය ගෙන යන ප්‍රතිසංස්කරණමය වැඩපිළිවෙළ පිළිබඳ මෙහිදී ජනාධිපතිවරයා ඉන්දීය විදේශ ලේකම්වරයාව දැනුවත් කළ අතර පසුගිය ආර්ථික අර්බුදය හමුවේ අසල්වැසි මිත්‍ර රාජ්‍යය ලෙස ඉන්දීයාව ශ්‍රී ලංකාවට ලබාදුන් අඛණ්ඩ සහායද ඇගයීමට ලක් කළේය.ශ්‍රී ලංකාවේ ඉන්දීය මහකොමසාරිස් ගෝපාල් බග්ලේද මෙම අවස්ථාවට එක්ව සිටියේය.

මේ අතර ඉන්දීය විදේශ ලේකම් විනේ මෝහන් ක්වාත්‍රා ජාතික ආරක්ෂාව පිළිබඳව ජනාධිපති ජ්‍යෙෂ්ඨ උපදේශක හා ජනාධිපති කාර්ය මණ්ඩල ප්‍රධානී සාගල රත්නායකද හමු වී සාකච්ඡා පැවැත්විය.

# විදෙස් ගතවූ: සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය නිලධාරීන් නව දෙනකු නැවත සේවයට ඇවිත් නෑ

අධ්‍යයන හෝ රාජකාරී කටයුතු සඳහා විදෙස් ගතවූ සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ නිලධාරීන් නව දෙනෙකු නැවත සේවයට වාර්තා කර නොමැති බව රාජ්‍ය ගිණුම් කාරක සභාවේ දී අනාවරණය වී ඇත.

මේ බව අනාවරණය වී ඇත්තේ ඉකුත් 6 වැනිද එම දෙපාර්තමේන්තුව ගිණුම් කාරක සභාව හමුවට කැඳවූ අවස්ථාවේදීය.

මෙම නිලධාරීන්ගෙන් දඩ වශයෙන් ලැබිය යුතු රුපියල් එක් කෝටි හැත්තෑ තුන් ලක්ෂයකට ආසන්න මුදල අය කර ගැනීමට මේ වන විටත් නීතිමය පියවර ගෙන තිබෙන බව කාරක සභාවට එක්ව සිටි දෙපාර්තමේන්තු නිලධාරීන් පවසා ඇත.

මින් ඉදිරියට කරඳගොල්ල සත්ත්ව පාලන මධ්‍යස්ථානයේ ඩිප්ලෝමා පාඨමාලාවට සිසුන් බඳවා ගැනීමේ දී ගිවිසුමකට එක් කර ගැනීමේ වැඩපිළිවෙළක් සකස් කරන ලෙස ද කාරක සභාව දෙපාර්තමේන්තුවට දැනුම් දී තිබේ. ලියාපදිංචි වන සිසුන්ගෙන් සියයට විසි පහක් පමණ අතරමගදී පාඨමාලාවෙන් ඉවත් වීම සැලකිල්ලට ගනිමින් මෙම දැනුම් දීම කර තිබෙන අතර පාඨමාලාව සඳහා එක් සිසුවකු වෙනුවෙන් රුපියල් විසිහය ලක්ෂයක් වැය වන බවත් නිලධාරීන් සඳහන් කර ඇත.

# තාක්ෂණික දෝෂයක්: හිටපු ගුවන් සේවා ඇමැති ප්‍රියංකරට නිදහස දෙයි

■ ඉෂාර රත්නකාර

හිටපු ගුවන් සේවා ඇමැති ප්‍රියංකර ජයරත්න සහ ඔහුගේ පෞද්ගලික ලේකම්වරයාට එරෙහිව පවරා තිබූ නඩුවේදී ඇති වූ තාක්ෂණික දෝසයක් මත ඔවුන් නඩුවෙන් නිදහස් කිරීමට අධිකරණය ඊයේ (11 වැනිද) තීන්දු කළේය.

මෙම නඩුව කොළඹ ප්‍රධාන මහෙස්ත්‍රාත් අධිකරණය හමුවේ ඊයේ යළි කැඳවූ අවස්ථාවේ දී අල්ලස් කොමිසමේ නිලධාරීන් කරුණු ඉදිරිපත් කරමින් විත්තිකරුවන්ට එරෙහිව නඩුව තාක්ෂණික දෝෂයක් හේතුවෙන් ඉල්ලා අස් කර ගැනීමට අවසර ඉල්ලා සිටියේය.

ඒ අනුව නඩුව ඉල්ලා අස්කර ගැනීමට අවසර දුන් අධිකරණය විත්තිකරුවන් දෙදෙනා නඩුවෙන් නිදහස් කිරීමට තීරණය කළේය.

2011 අගෝස්තු 10 වැනිද සිට 2022 දෙසැම්බර් 31 වැනිද දක්වා වූ කාලය තුළදී රජයේ සේවකයින් වූ එනම් සිවිල් ගුවන් සේවා අමාත්‍යවරයා වූ පළමු විත්තිකරු සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යවරයාගේ පෞද්ගලික ලේකම් ලෙස සේවයේ යෙදී සිටි බාලමානගේ දයාවංශ නමැති දෙවැනි විත්තිකරුට අයුතු සහගත ලෙස හෝ නීතිවිරෝධී ලෙස ස්වකීය ධුරය කෙලින්ම හෝ අන්‍යාකාරයෙන් භාවිතා කරමින් අල්ලස් පනතේ 70 වැනි වගන්තිය යටතේ දූෂණය නමැති වරද සිදු කර ඇතැයි චෝදනා 05ක් යටතේ විත්තිකරුවන්ට එරෙහිව මෙම නඩුව අල්ලස් කොමිසම විසින් පවරා තිබුණි. පළමු විත්තිකරුගේ පෞද්ගලික ලේකම් ලෙස සේවයේ යෙදී සිටි දෙවැනි විත්තිකරුට සිවිල් ගුවන් සේවා අධිකාරියේ ස්ථාපිත කර නොමැති තනතුරක් වන ''සංවර්ධන සැලසුම් සම්බන්ධීකරණ නිලධාරී'' යනුවෙන් නව තනතුරක් පත් කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කිරීමට සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ මණ්ඩල නිලධාරීන් පොලඹවා අල්ලස් පනත යටතේ දූෂණය වරද කර ඇතැයි ද අල්ලස් කොමිසම විසින් විත්තිකරුවන්ට එරෙහිව පවරා තිබූ නඩුවේ චෝදනාවල සඳහන් විය.

# සැප රියකින් ආ දෙන්නෙක් 44 හැවිරිදි අයකුට කඩුවෙන් කොටලා

■ නුවන් ජයසේකර - මීගහජඳුර

පරණ කෝන්තරයක් මත හම්බන්තොට බදගිරිය ප්‍රදේශයේදී සුඛෝපභෝගී කාර් රථයකින් පැමිණි පුද්ගලයන් දෙදෙනෙකු විසින් ඊයේ (11ද) පෙරවරුවේ 44 හැවිරිදි පුද්ගලයකුට වෙඩි තැබීමට උත්සාහ කර ඇති අතර එය ව්‍යර්ථවීමෙන් පසු කඩුවකින් කපා කොටා පලාගොස් ඇතැයි හම්බන්තොට පොලිසිය පවසයි.

ඊයේ (11ද) පෙරවරුවේ හම්බන්තොට බදගිරිය ගෙවල් 18 ප්‍රදේශයේදී සුදු පැහැති කාර් රථයකින් පැමිණි පුද්ගලයන් දෙදෙනෙකු විසින් හම්බන්තොට පදිංචි 44 හැවිරිදි රත්නායක මනම්පේරි චමින්ද යන අයට ගල්කටස් වර්ගයේ ගිනි අවියකින් වෙඩි තැබීමට උත්සාහ කර ඇතත් එය ක්‍රියාත්මක නොවීම නිසා සැකකරුවන් සිය කාර් රථයෙන් තුවාලකරු හප්පා කඩුවකින් හිස ප්‍රදේශයට පහර දී තිබේ. පහරකෑමෙන් බරපතළ තුවාල ලැබූ පුද්ගලයා හම්බන්තොට මහ රෝහලට ඇතුළත් කර ඇත.



පොලිස් භාරයට ගත් කාර් රථය

සිද්ධියට සම්බන්ධ කාර් රථය ලුණුගම්වෙහෙර ප්‍රදේශයේදී පොලිස් භාරයට ගෙන ඇති අතර සැකකරුවන් හඳුනාගෙන තිබේ. තංගල්ල කොට්ඨාශභාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි කේ.බී.කීර්තිරත්නගේ උපදෙස් පරිදි හම්බන්තොට මූලස්ථාන පොලිස් පරීක්ෂක ජගත් විජේගුණරත්න ඇතුළු නිලධාරීන් විසින් වැඩිදුර විමර්ශන පවත්වයි.

# ඖෂධවේදී තනතුරු දුන්නේ සුදුසුකම් ලැබූ අයටයි

## විශේෂඥ වෛද්‍ය විජිත් ගුණසේකර

■ වරුණී පෙරමුණ

ජාතික ඖෂධ නියාමන අධිකාරියේ පුරප්පාඩු වී තිබූ ඖෂධවේදී තනතුරු සඳහා බඳවා ගැනීම් සිදුකළ බව එම නියාමන අධිකාරියේ ප්‍රධාන විධායක නිලධාරි විශේෂඥ වෛද්‍ය විජිත් ගුණසේකර පැවසීය.

ඖෂධවේදී තනතුරු සඳහා සුදුසුකම් ලැබූ පුද්ගලයින් සම්මුඛ පරීක්ෂණයකින් අනතුරුව මෙසේ බඳවා ගැනීම් සිදුකළ බව ඊයේ (11) රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේදි පැවති මාධ්‍ය හමුවේදි හෙතෙම සඳහන් කළේය .

පසුගියද සෞඛ්‍ය අමාත්‍යංශයෙන් ජාතික ඖෂධ නියාමන අධිකාරියට අනුයුක්ත කර සිටි බව පැවසු ඖෂධවේදින් විසි තුන්දෙනා යළි සෞඛ්‍ය අමාත්‍යංශයේ සේවයට මුදා හැරීමට ජාතික ඖෂධ නියමාන අධිකාරිය කටයුතු කර ඇත.

එම මුදා හළ ඖෂධවේදින් අතුරින්ද අටදෙනෙකු යළි සුදුසුකම් මත ජාතික ඖෂධ නියාමන අධිකාරියේ ඖෂධවේදින් ලෙස බඳවා ගත් බව එහි ප්‍රධාන විධායක නිලධාරි විශේෂඥ වෛද්‍ය විජිත් ගුණසේකර මෙහිදී ප්‍රකාශ කළේය .

මීට අමතරව නවක ඖෂධවේදින් විසි දෙනකු පමණ ජාතික ඖෂධ නියාමන අධිකාරියට බඳවා ගැනීමට එම අධිකාරිය කටයුතු කර ඇත.

# පළමු ශ්‍රේණියට දරුවන් ඇතුළත් කිරීමේ චක්‍රලේඛය 14 එයි

ලබන වසරේ පළමු ශ්‍රේණියට දරුවන් ඇතුළත් කිරීමේ චක්‍රලේඛය මෙම මස 14 වැනිදා නිකුත් කෙරේ.

විශේෂ අවශ්‍යතා සහිත දරුවන් පළමු ශ්‍රේණියට ඇතුළත් කිරීමේ විධිවිධාන ප්‍රථම වරට මෙවර චක්‍ර ලේඛයට අන්තර්ගත කර තිබෙන බව අධ්‍යාපන අමාත්‍යාංශය පවසයි.

# විද්‍යාපීඨවලට නවක සිසුන් බඳවා ගැනීම තවත් කල් යයි

■ නිලන්ත මදුරාවල

ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවලට නවක සිසුන් බඳවා ගැනීම තවදුරටත් කල් ගත වන තත්ත්වයක් ඇති වී තිබේ.

ඉල්ලීම් කිහිපයක් මුල් කර ගනිමින් නවක සිසුන් බඳවා ගැනීමෙන් ගුරු අධ්‍යාපනඥයන් ඉවත්ව සිටීම මෙන් ම විද්‍යාපීඨවල පවතින අඩුපාඩු සපුරාලීමට මෙතෙක් නොහැකි වීම මෙම තත්ත්වයට හේතු වී ඇත.

කලින් සැලසුම් කර තිබූ ආකාරයට ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ විශ්වවිද්‍යාල තත්ත්වයට උසස් කිරීමට අදළ ක්‍රියාමාර්ග ගැනීම , ගුරු සේවයේ වැටුප් වැඩි කිරීමට සාපේක්ෂව ඇති වී තිබෙන වැටුප් විෂමතාව ඉවත් කිරීම සඳහා වැටුප් වර්ධක දෙළහක් ලබා දීම මෙන් ම පීඨවලට අවශ්‍ය පහසුකම් ලබා දීම ද සමස්ත ලංකා ගුරු අධ්‍යාපනඥ සේවා වෘත්තිකයන්ගේ සංගමය අමාත්‍යාංශයට ඉදිරිපත් කර තිබෙන ඉල්ලීම් අතර වෙයි. මෙවර ශිෂ්‍ය කණ්ඩායම් දෙකක් බඳවා ගැනෙන හෙයින් දැනට පවතින පහසුකම් කිසිදු ආකාරයකින් ප්‍රමාණවත් නොවන බව එම සංගමයේ ලේකම් ධම්මික මිරිහාන පැවසීය. පවතින ආර්ථික අර්බුදය මත පීඨවලට අවශ්‍ය සියලු යටිතලපහසුකම් ලබා දීම සඳහා මුදල් වෙන් කළ නොහැකි හෙයින් හදිසි පහසුකම් ලබා දීම සඳහා පමණක් ලෝක බැංකුවෙන් ආධාර ලබා ගැනීමට සාකච්ඡා කරමින් සිටින බව මේ සම්බන්ධයෙන් අප කළ විමසුමකට පිළිතුරු දුන් අමාත්‍යාංශයේ උසස් නිලධාරියෙක් කීවේය.

# ඉදිරි මාස පහේ ඖෂධ මිලට ගන්න අමාත්‍යාංශයෙන් මිලියන 76ක්

■ වරුණී පෙරමුණ

ඉදිරි මාස පහක කාලය සඳහා ඖෂධ ලබා ගැනීමට රුපියල් මිලියන හැත්තෑ හයක මුදලක් අවශ්‍ය බවත් එම මුදල අමාත්‍යංශයෙන් ලබා දීමට එකඟතාව පල කර ඇති බවත් සෞඛ්‍ය ඇමති කොහෙළිය රඹුක්වැල්ල පවසයි.

ඊයේ (11) රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේදි පැවති මාධ්‍ය හමුවේදි සෞඛ්‍ය ඇමති කොහෙළිය රඹුක්වැල්ල මේ බව ප්‍රකාශ කළේය.

මෙම මුදලින් කොටසක් මේ වනවිටත් ලැබී ඇති බව සෞඛ්‍ය ඇමතිවරයා මෙහිදි පැවසීය. එසේම මේවනවිට අත්‍යාවශ්‍ය ඖෂධ වර්ග දෙසිය හැත්තෑවක් පමණ හිඟ බව සෞඛ්‍ය අමාතංශයේ අතිරේක ලේකම් විශේෂඥ වෛද්‍ය සමන් රත්නායක ප්‍රකාශ කළේය. එසේ ඖෂධ හිඟ වුවවද සායනවලට අවශ්‍ය ඖෂධ සහ බෝ නොවන රෝගවලට අවශ්‍ය ඖෂද තොග රෝහල් වෙත බෙද හැර ඇති බවද හෙතෙම සඳහන් කළේය.

# සරත් වීරසේකර පාර්ලිමේන්තුවේ කළ ප්‍රකාශය පදනම් විරහිතයි

## ශ්‍රී ලංකා නීතිඥ සංගමය

■ ඉෂාර රත්නකාර

පාර්ලිමේන්තු මන්ත්‍රිවරුන් විසින් අධිකරණ කටයුතු පිළිබඳව පාර්ලිමේන්තුවේ ප්‍රකාශ කරමින්, පාර්ලිමේන්තු වරප්‍රසාද ගසාකෑමේ ප්‍රවණතාවක් වර්ධනය වෙමින් පවතින බව ශ්‍රී ලංකා නීතිඥ සංගමය සඳහන් කරයි.

අධිකරණයේ ස්වාධීනත්වයට ගරු කිරීම සහ ඒවා පිළිපැදීම රජයේ සහ විපක්ෂයේ යුතුකම බවත්, අධිකරණ ක්‍රියාවලියට යම් මැදිහත්වීමක් සිදු කිරීම තරයේ හෙළා දැකිය යුතු භයානක පූර්වාදර්ශයක් බවද ශ්‍රී ලංකා නීතිඥ සංගමය පෙන්වා දෙයි.

ඉකුත් 07 වැනිද පාර්ලිමේන්තු මන්ත්‍රී සරත් වීරසේකර විසින් පාර්ලිමේන්තුවේ දී කළ ප්‍රකාශය රටේ අධිකරණයට සහ සමාජයට පදනම් විරහිතව නිර්ලජ්ජිතව එල්ල කළ ප්‍රහාරයක් ලෙස දකින බවද ශ්‍රී ලංකා නීතිඥ සංගමය සඳහන් කරයි.

# උසස් පෙළ විභාගය නොවැම්බර් 27 සිට දෙසැම්බර් 21 දක්වා

උසස් පෙළ විභාගය ලබන නොවැම්බර් මස 27වැනිද සිට දෙසැම්බර් මස 21 වැනිද දක්වා පැවැත්වෙන බව අධ්‍යාපන ඇමැති ආචාර්ය සුසිල් ප්‍රේමජයන්ත පැවසීය.

ඇමැතිවරයා මේ බව සඳහන් කළේ කුරුණෑගල ඊයේ ( 11 වැනිද) පැවති උත්සවයක දී ය.

# ග්‍රහචාරය

2023 ජූලි
12 වැනිදා බදාදා

රාහු කාලය
මධ්‍යහ්න 12.16 - සවස 1.50
මැදියම 12.16 - රාත්‍රි 1.42

සුබ දිශාව - නැගෙනහිර

### මේෂ
කැපී පෙනෙයි

අන්‍යයන් අතරේ වඩාත් කැපී පෙනෙන පිළිගැනීමට ලක්වීමේ හැකියාව කෙරේ අහිතකර බලපෑම් ඇතත් එය බොහෝ දුරට පාලනය කරගත හැකි වේ. තරගකාරී මානසිකත්වයක් පවතිනු ඇත.

### වෘෂභ
නිවාස වාසි

වේගවත් සිතිවිලි නිසා වැඩ කටයුතු ඉක්මන් කිරීමේ උනන්දුවක් ඇතද කල්පනාකාරීව කටයුතු කරන්න. හිතට දැනෙනා අයුරින් වැඩ සිදුකළ හැකිය. නිවාස කටයුතු සම්බන්ධව විශේෂයි.

### මිථුන
මිශ්‍ර ඵල

බොහෝ දුරට මිශ්‍ර ඵල ගෙනදේ. එහෙත් කතාබහේ මනා පාලනයක් ඇතිකර ගන්න. තරගකාරී කටයුතුවලට වුව පෙලඹවීම් ඇතිකළ හැකිය. අන්‍යයන් අතරේ ජනප්‍රියතාව ප්‍රයෝජනවත් වේ.

### කටක
වෙළෙඳ කටයුතු සුභයි

එදිනෙද වැඩවලදී වැඩි ක්‍රියාකාරී බවක් ඇතිකරවන අතර, ජලය හෝ ද්‍රව මෙන්ම යුක්තිය, වෙළෙඳ කටයුතු ගැනද සම්බන්ධ වන අයට වඩාත් සුභපල ගෙනේ. පුද්ගලික ව්‍යාපාරවල අයට විශේෂයි.

### සිංහ
බාධක මග හැරේ

සුපුරුදු ලෙස තම හැකියාවන් කෙරේ විශ්වාසය තබා වැඩ කිරීමට ඉඩ ලැබෙනු ඇත. බාධක මගහැරවීමට හැකි වේ. ආගමික කටයුත්තකට සම්බන්ධ වීමට ඉඩ පෙනේ. අන්‍යයන් අතරේ පිළිගැනීමකට වුව ලක්විය හැකිය.

### කන්‍යා
උත්සාහයෙන් ජයගනී

තම උත්සාහයන් යම් පමණකට සපුරා ගැනීමේ හැකියාව පවතී. පොත්පත්, මුද්‍රණ, ප්‍රකාශන ක්ෂේත්‍රයන්ට විශේෂයි. මෙහෙයුම් ශක්තිය යහපත් වනු ඇත. මිල මුදල් පරිහරණය ගැන සැලකිලිමත් වන්න.

### තුලා
භූමි ලාභ

බාධක ඇතත් යම් ප්‍රමාණයකට සාර්ථකත්වයක් ලබාගැනීමට හැකිවේ. භූමි ලාභ ප්‍රයෝජන අත්කර ගැනීමට ඉඩ ලැබෙනු ඇත. පොදු එකඟතාවන්ට ඉඩ ඇතත් පරිසර බාධක ගැන සැලකිලිමත් වන්න.

### වෘශ්චික
වත්කම්වලට බාධා

ක්‍රීඩා වැනි කටයුතුවලදී වැඩි තරගකාරී බවක් මෙන්ම උද්‍යෝගිමත් බවක් ඇති කරනු ඇත. එහෙත් සිතිවිලි පාලනය ගැනත් උනන්දු විය යුතු වේ. මිල මුදල් වත්කම් ගැන සුළු වශයෙන් හෝ කරදර, විරෝධතා ඇතිකළ හැකිය.

### ධනු
පොදුකටයුතු සුභයි

අන්‍යයන් ඔබගේ වැඩ කටයුතු පිළිබඳව වැඩි අවධානයක් යොමු කරනු ඇත. පොදු කටයුතුවලදී විශේෂයි. එහෙත් පොදු එකඟතාවන් තරමක් අසීරු වනු ඇත. පොතපත හෝ නීතිමය කටයුතු ගැන සැලකිලිමත් වන්න.

### මකර
සුළු බාධා

අන්‍යයන් හා වැඩ කරන විට කතාබහ හැකි තරම් පාලනය කරගන්න. පැටලිලි ස්වභාවයක් ඇතිකළ හැකි බැවිනි. උසස්, දුර දිග දක්නා අදහස් ඇතත් ඊට බාධා සුළු වශයෙන් පවතිනු ඇත.

### කුම්භ
මූල්‍ය ගැටලු

පිරිස් පාලනය සම්බන්ධව මනා විනයක් ඇතිව කටයුතු කරන්න. ඔබේ අදහස් අන්‍යයන්ට ඒත්තු ගැන්වීම තරමක් කරදර විය හැකිය. අන්‍යයන් එකඟ කරගැනීම අපහසු නොවේ. මුදල් ප්‍රශ්න ඇතිවීමට පුළුවන. වියදම් පාලනය කරගන්න.

### මීන
සෞඛ්‍යයට අහිතකරයි

මිල මුදල් පරිහරණය හෝ වත්කම් ස්ථාවරයකට සුභ වුවත් සිතිවිලි හෝ අදහස් ප්‍රකාශනයන් වරින් වර වෙනස්වීම් ඇතිකළ හැකිය. දැඩි සිතිවිලි ස්වභාවයන් පාලනය කරගන්න. හදිසි තුවාල, රුධිර සීනි මට්ටම් ගැන කල්පනාකාරී වන්න.

# මනම්පිටිය අනතුරේ වගකීම භාරගෙන

# ප්‍රවාහන ඇමැති හා ගමනාගමන කොමිසමේ සභාපති ඉල්ලා අස්විය යුතුයි

## - පෞද්ගලික බස් සංගම් කියයි



■ එෆ්. අස්ලම්

මනම්පිටිය බස් අනතුරේ වගකීමෙන් සියයට පනහක් භාරගත යුතු ප්‍රවාහන ඇමැතිවරයාත් ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ සභාපතිවරයාත් සිය තනතුරු වලින් වහාම ඉල්ලා අස්විය යුතු බවට පෞද්ගලික බස් සංගම් විස්සකට ආසන්න සංඛ්‍යාවක් සඳහන් කරයි.

කදුරුවෙල සිට කල්මුණේ දක්වා ධාවනය වූ පෞද්ගලික බසයක් මනම්පිටිය කොටලීය පාලමෙන් පෙරළීම හේතුවෙන් එහි සිටි මගීන් 11 දෙනකු ජීවිතක්ෂයට පත්වූ අතර, තවත් මගීන් 42 දෙදෙනකු තුවාල ලබා පොලොන්නරුව රෝහල වෙත ඇතුළත් කර තිබිණි.

අන්තර් පළාත් පෞද්ගලික බස් හිමියන්ගේ සංගමය, සමස්ත ලංකා පෞද්ගලික බස් හිමියන්ගේ සංගමය ඇතුළු බස් සංගම් විස්සක පමණ නියෝජිතයන්ගේ සහභාගීත්වයෙන් නාරාහේන්පිට කාන්තා පුහුණු මධ්‍යස්ථානයේදී ඊයේ (11 වැනිද ) මෙම අනතුර සම්බන්ධයෙන් මාධ්‍ය හමුවක් පැවැත්විණි.

මෙහිදී අදහස් දැක්වූ සමස්ත ලංකා පෞද්ගලික බස් හිමියන්ගේ සංගමයේ ලේකම් අංජන ප්‍රියන්ජිත් මෙසේ කීවේය.

''ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ සභාපතිවරයා විළිලැජ්ජා නැතිව කියනවා මේ බස් එකට මාර්ග බලපත්‍ර නැහැ කියලා. මේක දැන්ද කියන්නේ? මේ අනතුරේ වගකීම ජාතික ගමනාගමන කොමිෂන් සභාව භාර ගත යුතුයි වගේම එම කොමිෂන් සභාවේ සභාපති ජාතියෙන් සමාව ගත යුතුයි. 11 දෙනෙක් මියැදුණ මේ අනතුර සෙල්ලම් අනතුරක් නෙවෙයි. ඒකාබද්ධ කාලසටහනක් නිර්මාණය වුණා නම් මේ අනතුර සිදුවන්නේ නැහැ. අවුරුදු 25 ක් තිස්සේ ඒකාබද්ධ කාලසටහනක් නිර්මාණය නොකිරීම නිසයි මේ අනතුර වුණේ. ඊට හේතුව බස් දෙකක් අතර තියෙන රේස් එක. බස් රියැදුරෝ රේස් යන්නේ නැහැ හරි කාලසටහනක් හදලා ඒ අනුව ධාවනය කළා නම්.''

අන්තර් පළාත් පුද්ගලික බස් හිමියන්ගේ සංගමයේ සභාපති සරත් විජිත කුමාර ද මෙසේ අදහස් දැක්වීය.

''මේ අනතුරට ලක්වුණ බස් එක නැගෙනහිර පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය යටතේ ලියාපදිංචි වූ එකක් තමයි. හැබැයි පසුකාලයේ මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිවල නිර්දේශය එක්ක පොඩි ලියුම් කෑල්ලක් දීලා අන්තර් පළාත් ධාවනය කරන්න දුන්නා. හැබැයි මාර්ග බලපත්‍ර දුන්නේ නැහැ. ඒ නිසයි මේ විදිහට බස් ධාවනය වෙන්නේ. මේකෙ සම්පූර්ණ වගකීම ජාතික ගමනාගමන කොමිෂන් සභාව ගන්න ඕනෑ. මේ අස්සේ මුදල් හම්බකරන ජාවාරමක් ක්‍රියාත්මක වෙලා තියෙන්නේ. අනතුර රියැදුරාගේ නොසැලකිල්ල නිසා කියලා කියන්න පුළුවන්. රියැදුරා වරදක් කරනවා නම් ඒ රියැදුරාට ලකුණු ක්‍රමයක් දීලා ලයිසන් කැන්සල් කරන්න''

# සෞදියේ ගස් බිලියන 10ක් වවන්න කොහුබත් සොයා ලංකාවට

■ නිර්මාණී තිලකසිරි

සෞදි අරාබි රාජ්‍යයේ ගස් බිලියන 10ක් වැවීමේ ව්‍යාපෘතියක් සඳහා අවශ්‍ය කොහුබත් උපස්තර පිළිබඳ සොයා බැලීමට සෞදි අරාබියේ පරිසර, ජල හා කෘෂිකර්ම අමාත්‍යාංශයේ තාක්ෂණික කණ්ඩායමක් පසුගියද පොල් සංවර්ධන අධිකාරිය වෙත පැමිණ තිබේ.

මෙම තාක්ෂණික කණ්ඩායම පොල් සංවර්ධන අධිකාරියේ නිලධාරීන් සමග මෙන්ම දේශීය කොහුබත් නිෂ්පාදකයන් හා අපනයනකරුවන් සමග ද සාකච්ඡා කර ඇත.

සෞදි අරාබියේ සිට පැමිණි පිරිස එළැඹෙන 14 වැනිද දක්වා මෙරට රැඳී සිටීමට නියමිත අතර, මෙම කාලයේදී එම තාක්ෂණික කණ්ඩායම මෙරට කොහුබත් පිළිබඳ අධ්‍යනයක් කිරීමට ද නියමිතය.

පසුගිය දිනක පැවැති කෝප් කමිටු හමුවේදී ද සෞදිය වෙත කොහුබත් සැපයීමේ අවශ්‍යතාව පෙන්වාදුන් අතර, එහිදී කෝප් කමිටු නිලධාරීන් පැවසුවේ එම ව්‍යාපෘතිය මගින් ඇමරිකානු ඩොලර් මිලියන ගණනක ආදයමක් මෙරටට හිමිවන බවයි.

එබැවින් මේ වනවිටත් දෙරට අතර ඒ සම්බන්ධ සාකච්ඡා සිදුවන හෙයින් කොහුබත් සැපයීමේ ක්‍රියාවලිය මෙරටට ලබාගැනීම වැදගත් බවත් අදාළ නිලධාරීන් වඩාත් සක්‍රිය ලෙස ක්‍රියාත්මක වියයුතු බවත් කෝප් කමිටුවේදී අවධාරණය කෙරිණි.

# ජල-කාලගුණික විපත්වලින් ලංකාවට වාර්ෂිකව ඩො.මි. 380ක පාඩුවක්

## වැඩමුළුවකදී හෙළිවෙයි

■ සාලිය කුමාර ගුණසේකර

දේශගුණයේ බලපෑමෙන් ඇතිවන ජල - කාලගුණික විපත් හේතුවෙන් ශ්‍රී ලංකාව සෑම වසරකම ආසන්න වශයෙන් ඇමෙරිකානු ඩොලර් මිලියන 380ක පාඩුවක් ලබන බව ආපද අවම කිරීම සහ ප්‍රතිසාධනය සඳහා වූ ගෝලීය පහසුකම (Global Facility for Disaster Reduction and Recovery) සඳහන් කරයි.

දේශගුණය හේතුවෙන් මෙරටට සිදුවන අලාභ හා හානිවලට පිළියම් යෙදීමට අදාළ හිඩැස් සහ අවශ්‍යතා හඳුනාගැනීම උදෙසා කොළඹදී පෙරේද (10 වැනිද) ආරම්භවූ වැඩමුළුවකදී මේ බව අනාවරණය විය. මෙම අවස්ථාවට පරිසර ඇමැති නසීර් අහමඩ් සහ එම අමාත්‍යාංශයේ ලේකම් විශේෂඥ වෛද්‍ය අනිල් ජාසිංහ සහභාගි වූහ.

ගෝලීය දේශගුණික අවදානම් දර්ශකයට අනුව 2019 වසරේ ආන්තික කාලගුණික තත්ත්වයන්ගෙන් වැඩිම බලපෑමක් එල්ල වූ රටවල් අතර ශ්‍රී ලංකාව 30 වැනි ස්ථානයට පත්ව ඇතැයිද, මෙම ශ්‍රේණිගත කිරීම මගින් සුළි කුණාටු, ගංවතුර සහ වෙනත් දේශගුණික විපත්වලට ශ්‍රී ලංකාව ගොදුරුවීමේ හැකියාව පිළිබිඹු කරන බවද පරිසර ඇමැතිවරයා එහිදී පැවසුවේය.

දේශගුණික විපර්යාසවල බලපෑම් හේතුවෙන් 2050 වසර වන විට වාර්ෂික දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට එකයි දශම දෙක (1.2%)ක පාඩුවක් සිදුවිය හැකි බව ආසියානු සංවර්ධන බැංකුව ඇස්තමේන්තු කර ඇති බවද ඔහු කීවේය.

2016 වසරේ මැයි මාසයේ ඇති වූ ගංවතුර හේතුවෙන් දළ වශයෙන් ඇමෙරිකානු ඩොලර් මිලියන 660ක් වැය වූ බවත් 2017 මැයි මාසයේ ඇති වූ ගංවතුර හේතුවෙන් සිදුවූ දේපළ හානිය ඇමෙරිකානු ඩොලර් මිලියන 478ක් ලෙස ගණන් බලා ඇති බවත් ඇමැතිවරයා වැඩිදුරටත් සඳහන් කළේය.

# නීති විරෝධී සංක්‍රමණවලට තිත තියන හැටි

## ඔස්ට්‍රේලියානු මෙහෙයුම් බළකා ප්‍රධානියෙක් කියයි

නීති විරෝධී සංක්‍රමණ වැළැක්වීම සඳහා දේශසීමා සහයෝගීතාව වැදගත් බව ඔස්ට්‍රේලියානු ස්වෛරී දේශසීමා මෙහෙයුම් බළකායේ ප්‍රධාන අණ දෙන නිලධාරී රියර් අද්මිරාල් ජස්ටින් ජෝන්ස් පැවසුවේය.

නීති විරෝධී ලෙස මිනිස් ජාවාරම් සිදුකිරීම වැළැක්වීම සවිමත් කිරීම පිළිබඳව කොළඹදී පැවැති විශේෂ මාධ්‍ය හමුවකදී ඔහු මේ බව කීවේය.

ඉකුත් මැයි මස මුලදී වාලච්චේන ප්‍රදේශයේ සිට නීති විරෝධී ලෙස ඔස්ට්‍රේලියාවට බෝට්ටුවකින් සංක්‍රමණය වීමට උත්සාහ කළ ශ්‍රී ලාංකිකයන් 41 දෙනකු එරට රජය විසින් සිදුකළ ස්වෛරී දේශසීමා මෙහෙයුමකින් පසු මෙරටට හරවා එවා තිබිණි.

රියර් අද්මිරාල් ජෝන්ස් මහතා වැඩිදුරටත් මෙසේද පැවසීය.

“නීති විරෝධී මිනිස් ජාවාරම් මැඩලීම උදෙසා ඇති කරගනු ලැබූ හවුල්කාරීත්වය ඉතා වටිනවා. මෑතකදී දෙපාර්ශ්වය එක්ව සිදුකරන ලද අන්තර් නිරෝධනය එයට කදිම සාක්ෂියක්. මෙම නීති විරෝධී සංචාරවල ඇති අනතුරුදායක බව සහ ප්‍රතිවිපාක පිළිබඳව ජනතාව දැනුවත් කිරීම සඳහා අඛණ්ඩව කටයුතු කිරීමේ වැදගත්කම එම මැඩලීමේ මෙහෙයුම් මගින් අපට අනාවරණය වුණා.''



ඡායාරූපය - සමන් අබේසිරිවර්ධන

ශ්‍රී ලංකා නාවික හමුදපති වයිස් අද්මිරාල් ප්‍රියන්ත පෙරේරා ද එහිදී මෙසේ අදහස් දැක්වීය.

“ජනතාව දුක් මහන්සියෙන් උපයාගත් ඉතුරුම් මෙවැනි නීති විරෝධි මිනිස් සංක්‍රමණ සඳහා යෙදවීමට පෙලඹෙන්නේ මෙම ජාවාරම්කරුවන් විසින් නීති විරෝධී සංක්‍රමණ සාර්ථක වන බවට පවසන බොරු විශ්වාසය නිසායි. එහෙත් ඒවා කිසිසේත්ම සිදු නොවන හුදෙක් වංචාකාරී ක්‍රියාවන් බව අප ජනතාවට අවබෝධ කරවිය යුතුයි. මෙවැනි ප්‍රජා දැනුවත් කිරීම් හරහා අප ඔවුන්ට එහි ඇති අනතුරුදායක බව සහ නෛතික පසුබිම පිළිබඳව සත්‍ය අවබෝධය ලබාදීම ඉතා අත්‍යවශ්‍ය කරුණක්.''

පොලිස් මාධ්‍ය ප්‍රකාශක ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී නිහාල් තල්දූව මෙසේ කීවේය.

“පුද්ගල ජාවාරම් සහ අනෙකුත් ජාත්‍යන්තර සංවිධානාත්මක අපරාධවලට එරෙහිව සටන් කිරීමට ශ්‍රී ලංකා පොලිසිය ඔස්ට්‍රේලියාව සමග ඉතා සමීපව කටයුතු කරනවා. අවදානමට ලක්විය හැකි පුද්ගලයන් මිනිස් ජාවාරම්කරුවන්ගේ ගොදුරු බවට පත්වීම නැවැත්වීම අපගේ අරමුණයි.''

ඔස්ට්‍රේලියාවේ දේශසීමා ආරක්ෂණ ප්‍රතිපත්ති පිළිබඳව වැඩි විස්තර www.australia.gov.au/zerochance වෙබ් අඩවිය ඔස්සේ ලබාගත හැකිය.



# වීසා නැතිව කුවේට් සිටි ලාංකිකයන් 46 දෙනකු පිටුවහල් කරයි

■ ටී.කේ.ජී. කපිල - කටුනායක

කුවේට් රාජ්‍යයේ ගෘහ සේවය සඳහා ගොස් එරට නීති විරෝධී ලෙස රැඳී සිට මෙරටට පැමිණීම සඳහා ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ ලියාපදිංචි වී සිටි ශ්‍රී ලාංකික ගෘහ සේවිකාවන් 46 දෙනකු එරටින් පිටුවහල් කර ඊයේ (11 වැනිද) අලුයම කටුනායක ගුවන් තොටුපොළ වෙත එවා තිබේ.

ඉන් 39දෙනකු ගෘහ සේවිකාවන් වූ අතර, සෙසු පිරිස ගෘහ සේවකයෝය. ඔවුන් දීර්ඝ කාලයක් වීසා නොමැතිව කුවේට් රාජ්‍යයේ නීතිවිරෝධී ලෙස රැඳී සිට සිට ඇති අතර, පසුව විවිධ අසනීප වලට ගොදුරු වීම, පෞද්ගලික ගැටලු සහ ශ්‍රී ලංකාවේ ඔවුන්ගේ පවුල්වල ගැටලු හේතුවෙන් ශ්‍රී ලංකාවට පැමිණීම සඳහා ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ ලියාපදිංචි වී තිබේ.

මෙසේ ශ්‍රී ලංකාවට පැමිණීම සඳහා ශ්‍රී ලාංකික ගෘහ සේවිකාවන් දෙදහසකට අධික පිරිසක් කුවේට් රාජ්‍යයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ ලියාපදිංචි වී ඇති බව තානාපති කාන්දීපන් බාලසුබ්‍රමනියම් පැවසීය.

මෙසේ ලියාපදිංචි වී සිටින ශ්‍රී ලාංකිකයන් මෙරටට එවීම පිළිබඳව කුවේට් රාජ්‍යයේ අභ්‍යන්තර කටයුතු අමාත්‍යවරයා සමග පසුගියද සිදු කළ සාකච්ඡාවකින් අනතුරුව එරට පොලිසිය, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව සහ අධිකරණය සමග එක්ව ගත් කඩිනම් පියවර හේතුවෙන් තාවකාලික ගුවන් ගමන් බලපත්‍ර මත මෙම ශ්‍රී ලාංකිකයන් පිරිස එවා තිබේ.

ඇඟිලි සලකුණු ලබා ගැනීමෙන් අනතුරුව එම පිරිස එරටින් පිටුවහල් කර ඇති අතර, ඔවුන්ට යළි කුවේට් රාජ්‍යය වෙත පිවිසීම සපුරා තහනම් කර ඇත.

ඔවුන් අල් ජසීරා ගුවන් සේවයට අයත් ජේ- 9551 දරන ගුවන් යානයෙන් කටුනායක ගුවන් තොටුපොළ වෙත පැමිණ තිබිණි.

# අර්ථ සාධකයට අත නොතබන්නැයි ඉල්ලා කම්කරුවෝ උද්ඝෝෂණයක




අර්ථ සාධකයට අත නොතබන්නැයි ඉල්ලමින් කම්කරු අරගල මධ්‍යස්ථානය සහ පෞද්ගලික සේවක මධ්‍යස්ථානය එක්ව ඊයේ (11 වැනිද) කොළඹ නාරාහේන්පිට පිහිටි කම්කරු දෙපාර්තමේන්තුව ඉදිරිපිටදී උද්ඝෝෂණයක් පැවැත්වීය.

ඡායාරූපය - ඒෂාන් දසනායක

# 12 වියැති සිසුවියට අතවර කළ විදුහල්පතිට සිර දඬුවම්

■ උපාලි ආනන්ද කරුණාදාස - අනුරාධපුර/ ටී.එම්. ධර්මරත්න - පදවිය

විද්‍යා විෂයය උගන්වමින් සිටින අතරතුර 12 හැවිරිදි පාසල් සිසුවියකට ලිංගික අතවරයක් සිදු කළ බවට වරද පිළිගත් දැනට සක්‍රීය රාජකාරියේ නිතර විදුහල්පතිවරයකුට වසරක බරපතළ වැඩ සහිත සිර දඬුවමක් නියම කළ අනුරාධපුර ප්‍රධාන මහෙස්ත්‍රාත් සහ අතිරේක දිසා විනිසුරු නාලක සංජීව ජයසූරිය එම සිර දඬුවම වසර පහකට අත් හිටුවීමට ද නියෝග කළේය.

ඊට අමතරව පැමිණිලිකාර වින්දිත බාල වයස්කාර පාසල් සිසුවියට මුදලින් රුපියල් පනස් දහසක වන්දියක් ගෙවන ලෙසද ප්‍රධාන මහෙස්ත්‍රාත්වරයා විත්තිකාර විදුහල්පතිවරයාට තවදුරටත් නියෝග කළේය.

මෙසේ දඬුවම් නියම වූයේ තඹුත්තේගම අධ්‍යාපන කලාපයේ විද්‍යාලයක විදුහල්පතිවරයකු ලෙස සේවය කරන සෝමරත්නගේ ගාමිණී සෝමරත්න නමැත්තෙකුටය.

2016 වසරේ අගෝස්තු 15 වැනිද හෝ ඊට ආසන්න දිනයක අනුරාධපුරයේදී 12 හැවිරිදි දැරියකට ලිංගික අතවරයක් සිදු කරමින් මෙම අපරාධමය වරද සිදු කර ඇති බවට අනුරාධපුර මූලස්ථාන පොලිසියේ ළමා හා කාන්තා කාර්යංශය විසින් ලංකා දණ්ඩ නීති සංග්‍රහයේ 345 වැනි වගන්තිය ප්‍රකාරව විත්තිකාර විදුහල්පතිවරයාට එරෙහිව අනුරාධපුර ප්‍රධාන මහෙස්ත්‍රාත් අධිකරණය හමුවේ නඩු පවරා තිබිණි.

මෙම නඩු විභාගය ආරම්භ කරමින් සාක්ෂි කැඳවීමට පෙරම විත්තිකාර විදුහල්පතිවරයා අදාළ චෝදනාවට වරද පිළිගැනීම විශේෂත්වයකි.

පැමිණිල්ල වෙනුවෙන් අනුරාධපුර මූලස්ථාන පොලිසියේ ළමා හා කාන්තා කාර්යංශයේ ස්ථානාධිපති පොලිස් පරීක්ෂිකා යමුනා කාන්තිගේ උපදෙස් මත එම කාර්යංශයේ නිලධාරීන් පෙනී සිටි අතර, විත්තිකාර විදුහල්පතිවරයා වෙනුවෙන් නීතිඥ සුසිල් සිරිවර්ධන පෙනී සිටියේය.

# මුලතිව්හි වැසිකිළි වළකින් පුපුරන ද්‍රව්‍ය හමුවෙයි

■ මාධව කුලසූරිය - වවුනියාව

මුලතිව්, අලම්පිල් ප්‍රදේශයේ ගෙවත්තක පැරණි වැසිකිළි වළක තිබී පුපුරන ද්‍රව්‍ය තොගයක් ඊයේ (10 වැනිද) සොයාගත් බව මුලතිව් පොලිසිය පැවසීය.

පොලිසිය පැවසුවේ ඉඩම් අයිතිකරුවෙකු විසින් සිය ගෙවත්තේ පැවැති පැරණි වැසිකිළි වළක කොන්ක්‍රීට් ආවරණයක් ඉවත් කිරීමට යාමේදී අදාළ පුපුරන ද්‍රව්‍ය දැක ඇති බවයි.අනතුරුව ඉඩම් අයිතිකරු ඒ බව පොලිසියට දැනුම් දී ඇති අතර, මුලතිව් මහේස්ත්‍රාත් අධිකරණ නියෝග යටතේ අදාළ ස්ථානය පරීක්ෂා කෙරිණි.

කිලිනොච්චිය පොලිස් විශේෂ කාර්ය බළකා බෝම්බ නිශ්ක්‍රීය අංශ නිලධාරීන් හා මුලතිව් පොලිස් නිලධාරීන් විසින් අදාළ ස්ථානය පරීක්ෂා කිරීමේදී පැරණි වැසිකිළි වළ තුළ තිබී අත්බෝම්බ 56ක්, මිලිමීටර 82 වර්ගයේ මෝටාර් උණ්ඩ 49ක්, මිලිමීටර 60 වර්ගයේ මෝටාර් උණ්ඩයක්, ෆැරා උණ්ඩ 14ක්, ආර්.පී.ජී උණ්ඩ හයක් ද සොයාගෙන තිබේ.



හමුවූ පුපුරන ද්‍රව්‍ය

## මැණික් පතල්කරුවන්ටත්
# කිව්.ආර්. කේතය ඕනෑ
### - ඉන්ධන බෙදුම්කරුවෝ කියති




■ අශිකා ජයවීර

ඉන්ධන ලබාගැනීමට කිව් ආර් කේතය හඳුන්වා දී වසරකට ආසන්න කාලයක් ගතවුවත් තවමත් මැණික් පතල්කරුවන්ට එම කේතය හඳුන්වා දී නොමැති බව ඉන්ධන බෙදුම්කරුවෝ පවසති.

මේ හේතුවෙන් පතල් පවත්වාගෙන යන්නන්ට ගැටලු රාශියකට මුහුණ දෙන්නට සිදුව ඇති බවත් ඉතාමත් ඉක්මනින් මෙම පිරිසටද විධිමත් ලෙස ඉන්ධන ලබාගැනීමට වැඩපිළිවෙළක් සකස් කර දීමට බලශක්ති අමාත්‍යංශය කටයුතු කළ යුතු බවත් ඔවුහු පවසති.

එමෙන්ම තවමත් විදුලි ජනක යන්ත්‍රවලට සහ තණකොළ කපන යන්ත්‍රවලට ඉන්ධන ලබාගැනීමට කිව්. ආර් කේතයක් හඳුන්වා දී නොමැති බවත් ඔවුහු කියා සිටිති.

නමුත් මෙම යන්ත්‍රවලට ඉන්ධන අත්‍යවශ්‍ය බැවින් ඉන්ධන පිරවුම්හල්වලින් අදාළ කේතය නොමැතිව ඉන්ධන ලබාදෙන බවත් ඉතාමත් ඉක්මනින් මෙම කාණ්ඩ සඳහා ඉන්ධන ලබාගැනීමට ක්‍රමවේදයක් සකස් කරන ලෙස බෙදුම්කරුවෝ රජයෙන් ඉල්ලා සිටිති.

# ‘අධිකරණයට දේශපාලනය එපා’
## උතුරේ නීතිඥවරු විරෝධතාවක



■ මාධව කුලසූරිය-වවුනියාව

අධිකරණයේ ස්වාධීනත්වයට බාධා නොකරන ලෙසට හා අධිකරණ කටයුතු වෙනුවෙන් දේශපාලනය සම්බන්ධ කර නොගන්නා ලෙසට ඉල්ලා උතුරු පළාතේ නීතිඥවරු ඊයේ (11) විරෝධතාවයක නිරත වූහ.

මුලතිව්,කුරුඳුමලෙයි විහාරය සම්බන්ධ නඩු කටයුත්තකට අදාළ ස්ථානීය නිරීක්ෂණයකට එක්වූ මුලතිව් මහේස්ත්‍රාත්වරයා හා නීතිඥවරුන් පිරිසකගේ කටයුතු වෙනුවෙන් දේශපාලන නියෝජිතයින් පිරිසක් මැදිහත්වීමක් කළ බව කියන සිද්ධියකට විරුද්ධව උතුරු පළාතේ නීතිඥවරුන් එලෙස විරෝධතාවයේ නිරතවිණ.

මුලතිව් කුරුඳුමලෙයි විහාරස්ථාන ගැටලුව නිරීක්ෂණයට පසුගිය 05 වැනිද මුලතිව් මහේස්ත්‍රාත්වරයා ඇතුළු නීතිඥ පිරිසක් එක් වූහ.

මුලතිව්,මන්නාරම,යාපනය හා පේදුරුතුඩුව මහේස්ත්‍රාත් අධිකරණයන්හි නීතිඥවරුන් මෙලෙස විරෝධතාවයේ නිරත වූ අතර එහිදී අධිකරණ ස්වාධීනත්වයට බාධා නොකරන ලෙසට හා අධිකරණ කටයුතු වෙනුවෙන් දේශපාලනය සම්බන්ධ කර නොගන්නා ලෙසට ඉල්ලා පෝස්ටර සහ බැනර් ප්‍රදර්ශනය කරමින් විරෝධතාවයේ නිරතවූහ.

# රට බිත්තරේ පිට වික්කොත් බලාගෙනයි
## රාජ්‍ය වාණිජ (විවිධ) නීතිගත සංස්ථාවෙන් රතු එළියක්

■ චාමර පල්ලේගෙදර

ආනයනික බිත්තර, මුද්‍රා ඉවත් කර වෙළෙඳපොලේ අලෙවි කරන්නේද නැද්ද යන්න සොයා බැලීමක් සිදු කරන බව ශ්‍රී ලංකා රාජ්‍ය වාණිජ (විවිධ) නීතිගත සංස්ථාවේ සභාපති ආසිරි වලිසුන්දර පැවසිය.

එම සොයා බැලීමේදී කිසියම් පාර්ශ්වයක් විසින් ආනයනික බිත්තර අලෙවි කරන බවට අනාවරණය වුවහොත් ඊට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා බවද සභාපතිවරයා සඳහන් කළේය.

දැනට මෙම ආනයනික බිත්තර කිසියම් පාර්ශ්වයක් විසින් අලෙවි කරන බවට තොරතුරු වාර්තා වී නොමැති බවත් එම නිසා එලෙස අලෙවි කිරීම සම්බන්ධයෙන් සිය සංස්ථාවට විවිධ පාර්ශව විසින් එල්ල කරන චෝදනා ප්‍රතික්ෂේප කරන බවත් සභාපතිවරයා කියයි.

කෙසේ වෙතත් ආපනශාලා හිමියන්ගේ සංගමයේ සභාපති අසේල සම්පත් ඊයේ (11) පැවැති මාධ්‍ය හමුවකදී කියා සිටියේ ආනයනික බිත්තර වෙළෙඳපොලේ අලෙවි වන බවය.

සිය සංස්ථාව මගින් කිසිදු අවස්ථාවක ආනයනික බිත්තර වෙළෙඳපොළට නිකුත් කර නොමැති අතර කිසියම් පාර්ශ්වයක් විසින් මෙය සිදුකරන්නේද යන්න සම්බන්ධයෙන් තමා දැනුවත්වී නොමැති බවද සභාපතිවරයා සඳහන් කළේය.

අනායනික බිත්තර හෝටල් සහ බේකරි සඳහා පමණක් ලබාදී ඇති බවද හෙතෙම කීවේය.



# ජීවිත එකොළහක් බිලිගත් කොටලීය පාලමට පැලැස්තර එපා
## දිඹුලාගලින් සාමකාමී විරෝධයක්

■ නිමල් ජයරත්න -මනම්පිටිය
■ ලයනල්ද සොයිසා - ලංකාපුර

ජීවිත එකොළහක් බිලිගනිමින්, හතළිස් එක්දෙනෙකු රෝහල් ගත කළ මනම්පිටිය කොටලීය පටු පාලමට පැලැස්තර නොගසා එම පාලම පුළුල් කරදෙන ලෙසට බලකරමින් දිඹුලාගල උතුරු ශාසනාරක්ෂක බල මණ්ඩලයේ ලේඛකාධිකාරී අත්තනකඩවල ජනතාලංකාර නාහිමියන් ප්‍රමුඛ දිඹුලාගල ප්‍රදේශයේ සමාජ ක්‍රියාකාරීන් සහ ප්‍රදේශවාසීන් පිරිසක් එම පාලම අසල ඊයේ (11ද) සාමකාමී විරෝධතාවක නිරත වූහ.

මාර්ග අනතුරුවලින් ජනතාවගේ ජීවිත ආරක්ෂා කිරීමට නොහැකි නම් බන්දුල ගුණවර්ධන ඇමතිවරයා සිය අමාත්‍යාංශය වෙනත් අයකුට ලබාදී ගෙදර යන ලෙසද එහිදී විරෝධතාකරුවෝ පැවැසූහ.

මෙම බස්රථ අනතුර සිදුවීමත් සමග එම පටු පාලමේ ආරක්ෂිත යකඩ වැට කැඩී ගිය අතර ඊට ආරක්ෂිත යකඩ වැටක් වෙනුවට බැරල් තොගයක් අටවාගොස් ඇති බවත්, එය ස්ථිර පිළියමක් නොවන බවත්, මෙම, ස්ථානයේ තවදුරටත් ජීවිත බිලිගැනීමට පෙර ස්ථිරව පාලම පුළුල් කිරීමේ වැඩපිළිවෙළක් වහාම ක්‍රියාත්මක කරන ලෙසද විරෝධතාකරුවන් මෙහිදී සඳහන් කළහ.

කොළඹ ඇතුළු විවිධ පළාත්වල ගුවන් පාලම් සහ වෙනත් සංවර්ධන මාර්ග ඉදිකරන පසුබිමක පොළොන්නරුව මඩකළපුව ප්‍රධාන මාර්ගයේ වසර සියයකට වඩා අබලන් මාරක සහ අනාරක්ෂිත පාලම් දෙක පුළුල් නොකිරීම හේතුවෙන් ඉදිරියේදී මීට වඩා මාරක අනතුරු සිදුවිය හැකි බවද උද්ඝෝෂකයන් සඳහන් කළහ. මෙම පාලම ඉදිකිරීමට මුදල් නොමැති බවට ප්‍රවාහන හා මහාමාර්ග ඇමති බන්දුල ගුණවර්ධන ප්‍රකාශ කළද මීට වඩා කෝටි ප්‍රකෝටි ගණන් රජයේ මුදල් යොදවා ව්‍යාපෘති ආරම්භ කරන යුගයක මෙම කුඩාපාලම් දෙක ඉදිනොකිරීම කනගාටුවට කරුණක් බවද ඔවුහු පැවසූහ.

# ආපදා නිලධාරින්ටත් හොරෙන්
## රත්මලාන-හෝමාගම ඇළ මාර්ග ලක්ෂ හතහාමාරක් ගිලලා

■ සාලිය කුමාර ගුණසේකර

රත්මලාන සහ හෝමාගම යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල ඇළ මාර්ග පිළිසකර කිරීම සඳහා ආපද කළමනාකරණ මධ්‍යස්ථානය විසින් රුපියල් ලක්ෂ හත හමාරකට අධික මුදලක් වැය කරනු ලැබුවේ කුමන පදනමකින්ද යන්න කොළඹ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ සම සභාපති පාර්ලිමේන්තු මන්ත්‍රී ප්‍රදීප් උඳුගොඩ ආපද නිලධාරීන්ගෙන් විමසීමේදී ඔවුන් කියා සිටියේ ඒ පිළිබඳ නොදන්නා බවය.

රත්මලාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ එක ඇළ මාර්ගයක්ද,හෝමාගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ඇළ මාර්ග තුනක්ද පිළිසකර කිරීමට අදාළව ආපද කළමනාකරණ මධ්‍යස්ථානය විසින් රුපියල් 777,000 ක මුදලක් වෙන්කර ඇත.

කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ඊයේ (11 වැනිද) පැවැති දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේදී එහි සම සභාපති ප්‍රදීප් උඳුගොඩ කියා සිටියේ කොළොන්නාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ආපද තත්ත්වයන් නිතර ඇති වන ප්‍රදේශවල ඇළ මාර්ග නඩත්තුවට මෙම මුදල් වැය නොකර වෙනත් ස්ථානවලට මුදල් යෙදවීමෙන් සිදුවන්නේ මුදල් නාස්තියක් පමණක් බවය.

අදළ ඇළ මාර්ග නඩත්තුව සඳහා මුදල් වෙන් කරනු ලැබුවේ කුමන පදනමකින්ද යන්න පිළිබඳ සම සභාපතිවරයා ආපද කළමනාකරණ මධ්‍යස්ථානයේ නිලධාරීන්ගෙන් විමසීමේදී ඔවුන් කියා සිටියේ ඊට අදළවූ පදනම නොදන්නා බවය. ගංවතුර තත්ත්වය නිසා වැඩිපුර ආපදවට ලක්වන ප්‍රදේශ පිළිබඳව ආපද කළමනාකරණ මධ්‍යස්ථානය අවධානය යොමු කළ යුතු බවද සම සභාපතිවරයා කීවේය.


DLB සංවර්ධන ලොතරැයි මණ්ඩලය www.dlb.lk 2023.07.10 වන සඳුදා නිල ප්‍රතිඵල

අද කෝටිපති ADA KOTIPATHI — දිනය 2023.07.10 | දිනුම් වාරය 1971 | වර්ණය රතු
ජයග්‍රාහී අංක 02 07 26 38 ඉංග්‍රීසි අක්ෂරය L
මිළඟ සුපිරි ජයමල්ල රු. 56,357,214/-
අද කෝටිපති "දෙවෙනි වරම" ජයග්‍රාහී අංක 45 50 51 75 E

කප්රුක — දිනය 2023.07.10 | දිනුම් වාරය 1321 | වර්ණය කොළ
ඉංග්‍රීසි අක්ෂරය, සුපිරි අංකය සහ ජයග්‍රාහී අංක N 07 04 26 58 64
මිළඟ සුපිරි ජයමල්ල රු. 415,139,154.20
කප්රුක "දෙවෙනි වරම" ජයග්‍රාහී අංක 14 25 36 54 H

ලග්න වාසනාව — දිනය 2023.07.10 | දිනුම් වාරය 3857 | වර්ණය කහ
ජයග්‍රාහී අංක 06 08 28 45 වෘෂභ
මිළඟ සුපිරි ජයමල්ල රු. 3,378,268/-
ලග්න වාසනාව "දෙවෙනි වරම" ජයග්‍රාහී අංක 11 19 41 50 මේෂ

ජයෝදා Jayoda — දිනය 2023.07.10 | දිනුම් වාරය 1937 | වර්ණය තැඹිලි
ජයග්‍රාහී අංක 02 10 12 40 E
මිළඟ සුපිරි ජයමල්ල රු. 44,740,219.20
ජයෝදා "දෙවෙනි වරම" ජයග්‍රාහී අංක: 11 25 33 54 M

ශනිදා Shanida — දිනය 2023.07.10 | දිනුම් වාරය 4306 | වර්ණය ලා නිල්
ජයග්‍රාහී අංක 13 34 65 67 V
මිළඟ සුපිරි ජයමල්ල රු. 50,540,468.00
ශනිදා "දෙවෙනි වරම" ජයග්‍රාහී අංක: 02 24 48 74 U

SUPER BALL — දිනය 2023.07.10 | දිනුම් වාරය 2145 | වර්ණය දම්
ජයග්‍රාහී අංක 23 26 47 73 T
මිළඟ සුපිරි ජයමල්ල රු. 54,319,180.40
සුපර් බෝල් "දෙවෙනි වරම" ජයග්‍රාහී අංක 08 10 68 76 W

සංවර්ධන ලොතරැයි මණ්ඩලය
ජයග්‍රාහී ටිකට්පත් මාස 6ක් වලංගු වේ.




කාලි මෑණියන්ගේ හැඩ රුවින් යුතු රූමතියක් නිකවැරටියේ





නිවසේදීම අත්බෙහෙත් හදාගන්න ක්‍රම සමඟින් හොරිවිල වෙද මහත්තයා මේ සතියේ සිට ධරණී පිටු අතරට

පිරිමි වැඩිපුර කැමති ගෙම්බියන් වැනි ගැහැණුන්ටලු

සමහර ආච්චිලාට දොස්තර දැක්ක ගමන් ලෙඩ හොඳ වෙන්නේ මෙහෙමයි

ගැහැනු ගෙට කර හොරකමේ යන අලි ඉලන්දාරියෝ

ධරණී
සතුටින් ජීවිතය දරන්නී
සෙනසුරාදා සිට වෙළෙඳපොලේ


වියදම් නොකර කන හැකි මව්කිරි වඩන දේශීය කෑම


නැකැත් බලා එල්ලුම් ගස් ගිය කඩුගන්නාවේ තැපැල් බෝම්බකරුගේ කතාව

කිරි අම්මාවරුන්ගේ කිරි වඩවන අඩු වියදම් කෑම ඇතුළත් අතිරේකයක් නොමිලේ

ධරණී නිවසටම ගෙන්වාගන්න අමතන්න 076 136 76 23




# සංක්‍රමණිකයන් 300ක් සති දෙකක් පුරා අත්ලාන්තික් සාගරයේ අතුරුදන්






අතුරුදන් වූවන් සොයා කරන මෙහෙයුම්




■ නිහාල් පීරිස්

සංක්‍රමණිකයන් 300කට ආසන්න පිරිසක් රැගෙන යාත්‍රා කරමින් තිබූ බෝට්ටු තුනක් සති දෙකක කාලයක සිට අත්ලාන්තික් සාගර කලාපයේ අතුරුදන්ව ඇති බව විදෙස් මාධ්‍ය වාර්තා කරයි. ස්පාඤ්ඤයට ළඟා වීම සඳහා මෙම යාත්‍රා පිටත් වී තිබුණේ අප්‍රිකානු රටක් වන සෙනෙගාලයෙනි. දින කිහිපයකට පෙර පළ වී තිබූ වාර්තාවල සඳහන්ව තිබුණේ මෙම එක් යාත්‍රාවක සංක්‍රමණිකයන් 200කට ආසන්න සංඛ්‍යාවක් සිටි බවය. අනෙක් යාත්‍රා දෙකෙන් එකක සංක්‍රමණිකයන් 65දෙනකු සිටි බවද, අනෙකෙහි 50ත් 60ත් අතර සංඛ්‍යාවක් සිටි බවද වාර්තා වී තිබිණි.



සංක්‍රමණිකයන් රැගත් යාත්‍රාවක්

## එක් යාත්‍රාවක් සොයාගනී

මෙම යාත්‍රා අතුරුදන්ව ඇති බව මුලින්ම දැනුම් දී තිබුණේ සංක්‍රමණිකයන්ට ආධාර කිරීමේ සංවිධානයක් වන Walking Borders නමැති සංවිධානයය. ඉහත කී යාත්‍රාවල ගමන් කළ අය ඔවුන්ගේ ඥාතීන්ට කිසිදු සන්නිවේදනයක් දින ගණනාවක සිට කර නොමැති බව ඉහත සංවිධානයේ නිලධාරිනියක් මාධ්‍ය සමග පවසා තිබුණාය. මෙම යාත්‍රා සොයා ගැනීම සඳහා පුළුල් මෙහෙයුමක් දියත් කිරීමට ස්පාඤ්ඤයේ වෙරළාරක්ෂක කණ්ඩායම් පියවර ගෙන ඇත. ඒ සඳහා නැව් සහ ගුවන් යානා යොදවා ඇත.

කෙසේ හෝ වේවා මෙම යාත්‍රා තුනෙන් එක් යාත්‍රාවක් සොයා ගන්නට වෙරළාරක්ෂක කණ්ඩායම් සමත්ව ඇති බව ඊයේ (11 වැනිදා) සවස විදෙස් මාධ්‍ය වාර්තා කර තිබිණි. එහි සිටි සංක්‍රමණිකයන් 86 දෙනෙකු මුදගෙන ඇති බවද සඳහන් වේ. යාත්‍රාව සොයාගන්නට ලැබී තිබුණේ කැනරි දූපත්වලට කිලෝ මීටර් 130ක් පමණ නිරිත දෙසින් අත්ලාන්තික් සාගරයේ පාවෙමින් තිබියදීය. සෙනෙගාලයේ සිට කැනරි දූපත්වලට කි. මී. 1,700ක පමණ දුරක් තිබේ. කැනරි දූපත් අයත් වන්නේ ස්පාඤ්ඤයටය.

## 200ක් සිටි යාත්‍රාවේ දැන් ඉන්නෙ 86යි

සොයාගත් යාත්‍රාව ග්‍රාන් කැනේරියා දූපත වෙත ඇදගෙන යෑමට වෙරළාරක්ෂකයන්ගේ යාත්‍රාව පියවර ගෙන තිබිණි. සංක්‍රමණිකයන් 200ක් සිටි බව පැවසුණු යාත්‍රාව මෙය විය හැකි යැයි විශ්වාස කෙරේ. පිරිමින් 80 දෙනකු සහ කාන්තාවන් 6 දෙනකු මුදගෙන ඇති පිරිසට අයත් වේ. යාත්‍රාවේ සිටි සියලු දෙනා මුදගන්නට හැකි වී ඇත්ද යන්න ගැන නිශ්චිතව වාර්තා නොවේ. අතුරුදන්ව ඇති සෙසු යාත්‍රා දෙක ගැන ඊයේ රාත්‍රිය වනවිටත් කිසිවක් දැනගන්නට තිබුණේ නැත.

මෙම යාත්‍රා ගමන් කළ මාර්ගය බටහිර අප්‍රිකානු රටවල සංක්‍රමණිකයන් ස්පාඤ්ඤයට ළඟා වීම සඳහා බහුලවම භාවිත කරන මුහුදු මාර්ගයය. එසේ නමුත් මෙම මාර්ගය ඔස්සේ කරන ගමන අතිශයින් අනතුරුදායක බව සඳහන් වේ. මෙම රටවල සංක්‍රමණිකයන් ගමන් කරන්නේද ඉතා අනාරක්ෂිත යාත්‍රාවලය. අත්ලාන්තික් සාගරයේ දරුණු රළ පහරවලට ඔරොත්තු දීමට ඒවාට එතරම් හැකියාවක් නැති බව මුහුදු ගමන් පිළිබඳ විශේෂඥයෝ පෙන්වා දෙති. එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සංඛ්‍යා ලේඛනවලට අනුව පසුගිය වසරේ මෙම මාර්ගයේ ගමන් කරද්දී මරණයට පත් වූ සංක්‍රමණිකයන් ගණන 559කි. 2021 වසරේ එම ගණන 1,126ක් විය.

## ග්‍රීසිය ආසන්න මුහුදේ වූ ඛේදවාචකයෙන් 500ක් මැරිලා

මේ ආකාරයෙන් බටහිර රටවලට සංක්‍රමණය වීමට උත්සාහ දරන සංක්‍රමණිකයන් මෙම ගමන්වල නියැළෙන්නේ සිය ගමනාන්තයට ළඟා වීමට පෙර මරණයට ගොදුරු වීමට ඇති ඉඩ ගැන නොදැන නොවේ. වරක් මාධ්‍ය සමග අදහස් දක්වා තිබූ මෙවැනි සංක්‍රමණිකයකු පවසා තිබුණේ තමා යුරෝපයට ළඟා වීම සඳහා සත් වතාවක් උත්සාහ කළ බවකි. ඒ ඇතැම් අවස්ථාවල මරණය ආසන්නයටම පැමිණි බවද ඔහු පවසා තිබිණි. මෙයට පෙර අවස්ථාවක මුහුදේදී බේරා ගන්නා ලද සංක්‍රමණිකයන් පිරිසක් සමග කතා කළ මාධ්‍යවේදිනියක මෙසේ ලියා තිබුණාය. “මට කතා කරන්නට ලැබුණු සෑම සංක්‍රමණිකයකුටම මේ වගේ ගමන්වලදී මරණයට පත් වූ මිතුරන් සිටියා.’

මරණයෙන් කෙළවර විය හැකි බව මේ තරම් දැන සිටියදීත් මෙම සංක්‍රමණිකයන් මෙවැනි ගමන්වල නිරත වීම තුළින් පෙන්වා දෙන්නේ ඔවුන්ගේ ජීවිත අර්බුදවල ඇති ඛේදනීය බවය. තම රටවලදී අත්විඳින්නට සිදුවන දරුණු ආර්ථික සමාජයීය පීඩාවන් නිසා වඩාත් සැප පහසු ජීවිත සොයමින් දියුණු රටවල් වෙත සේන්දු වීමට උත්සාහ කරන නීති විරෝධී සංක්‍රමණිකයන් මුහුණ දෙන ඛේදවාචක පිළිබඳව නිරන්තරයෙන් මාධ්‍ය ඔස්සේ අනාවරණය කරන්නකි. මෙයට සති කිහිපයකට පෙර ග්‍රීසිය ආසන්න මුහුදේ දී ගිලී ගිය යාත්‍රාව පිළිබඳ සිද්ධියද ඊට හොඳම නිදසුනකි. එම යාත්‍රාවේ ගමන් කළ අයගෙන් 82කගේ මළ සිරුරු සොයා ගන්නට හැකි වූ අතර 104 දෙනකු නිරුපද්‍රිතව බේරා ගන්නට ගලවා ගැනීමේ කණ්ඩායම්වලට හැකි විය. නමුත් 500කට ආසන්න පිරිසක් පිළිබඳව කිසිදු හෝඩුවාවක් දැන ගන්නට නොලැබුණු අතර ඔවුන් මිය යන්නට ඇතැයි විශ්වාස කෙරේ.

# චීනයට ගිය ඇමැති කුක්කු කූක් කූ .... කියමින් මස් ඉල්ලලා



■ හේෂාර සේනාල් සෝමරත්න - අනුරාධපුරය

මේ කියන්නට යන කතාව රජරට ඇමැතිවරු පිරිසකට විදේශ සංචාරයක දී මුහුණ පෑමට වූ සිදුවීමකි. ඒ එකල පැවැති රජයේ අනුග්‍රහයෙන් පළාත් සභාවේ ඇමැතිවරු පිරිසකට අධ්‍යාපන චාරිකාවක් සඳහා චීනයේ යෑමට අවස්ථාවක් හිමි වූහ. මෙය අධ්‍යාපන චාරිකාවක් කියූවට අධ්‍යාපන චාරිකාවක් ම නොවිණි. පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍යවරයා ඇතුළු ඇමැතිවරු දහතරක් මේ ගමනට එද එක් වූහ. මෙම අමාත්‍යවරු අතර ඉතා අධ්‍යාපන මට්ටමින් ඉහළ ඇමැතිවරු මෙන්ම නූගත් හෙළ ගැමිකම ඇති සහ ඉංග්‍රීසි වචනයක්වත් කතා කිරීමට නොහැකි ඇමැතිවරයකු ද විය. මෙම ඇමැතිවරයා චාරිකාව ආරම්භ කළ අවස්ථාවේ සිටම මත්පැන් පානය කරමින් විනෝද වූවේය.

නමට අධ්‍යාපන කියා පිරිස පැමිණියද එක් දිනක් පමණක් නිරීක්ෂණ චාරිකාව සඳහා එක්වූහ. ගැමිකමට බර නූගත් ඇමැතිවරයා පසුදිනය පුරාම කළේ බස්රථයේ සිට විදේශීය මත්පැන් පානය කරමින් විනෝද වීමයි.

“හැමදම මෙහෙම ඒවා බොන්න නැනේ මල්ලී’’ යැයි කියමින් මත්පැන් පානය කරමින් ඔහු විනෝද වූවේය. චීනයේ පැවැති එක් දින දේශනයෙන් සහ නිරීක්ෂණ චාරිකාවෙන් පසුව දින දෙක තුනක් මෙම ඇමැතිවරු පිරිස සඳහා නිවාඩුවක් ලැබී තිබිණි.

එසේ නිවාඩුව ගත කිරීමට වෙනත් ප්‍රදේශයකට යෑමට පිටත්වූ ඇමැතිවරු පිරිසට එකවර බඩගින්නක් පැමිණ එක් ඇමැතිවරයකු මෙසේ කියා ඇත්තේය. දැන් නම් හොඳටම බඩගිනී ළඟම තැනක නවත්තන්න. කියාය එසේ කීවද ළඟපාතක නම් කඩයක් තිබී නැත. ඔවුන්ගේ බඩගින්න ද උපරිමයට පැමිණ තිබිණි. පසුව ටික දුරක් යද්දීම චීන කෑම සඳහාම වෙන්වූ හෝටලයක් දැක. “අන්න අන්න හෝටලක් නවත්තන්න නවත්තන්න.. යකෙක් කන්න බඩගිනි..... කියා ඇමැතිවරු පිරිස චීන හෝටලය වෙත ගොස් තිබිණි. එහෙත් කතාවේ නායකයා වූ හෙළ ගැමි ඇමැතිවරයා ගමන් කළ බසයේම රැඳී සිට තිබුණේ නව මත්පැන් පානයට අවශ්‍ය වූ නිසාය.

අවන්හල වෙත ගිය ඇමැතිවරුන්ට සිදුවී ඇත්තේ මාර වැඩකි. අවන්හලේ සේවකයන් ඉංග්‍රීසි බස නොදත් නිසා සහ එහි ගිය ඇමැතිවරුන් චීන බස නොදත්කමත් පරහට හිට තිබිණි. එවිට ඒ අය කියා තිබුණේ “චිකන් කෑම ඉල්ලුවහම මේ අය අපිව කන්න වගේ අපේ මූණු බලන් ඉන්නවා. පෝක් කෑම කිව්වහම ඒ අයම මූණට මූණ බලා ගන්නවා අපි යමු වෙනතැනකට කියා කට්ටිය නැවත බස් රථය වෙත ආහ.

එවිට බස් රථයේ නැවතී සූර් පිට සිටි හෙළ ගැමි ඇමැතිවරයා සිනා සෙමින් “හා උඹලා කෑවද බඩ පිරෙන්න මෙච්චර ඉක්මනට මොනවාද කාපු කෑම මල්ලී. ගිය පයින්ම ආයේ ආවේ යැයි කියා අනෙක් ඇමැති පිරිසගෙන් අසා තිබිණි.

ආපසු පැමිණි පිරිස අතරින් උගත් ඇමැතිවරයකු කතාව පැහැදිලි කර දුණි. ගැමි දේශපාලකයා කොක් හඬලා සිනාසෙමින් මෙසේ පැවසීය. “අයියෝ බන් ඕක ඔච්චර දෙයක් ද? දැන් උඹලට කන්නනෙ ඕන. බඩගින්නේ පැලෙන්න යමන් මං අරන් දෙන්න යැයි කියමින් හෙළ ගැමි ඇමැතිවරයා ආපසු පැමිණි පිරිසද කැටුව නැවත අවන්හල කරා රැගෙන ගියහ. අදාළ පිරිස වාඩි කරවා තම තමන්ට අවශ්‍ය කෑම වර්ග කියන ලෙස කතා නායකයා පිරිසට පැවසීය.

දැන් උගත් පිරිස බිරාන්ත වී බලා සිටින්නේ සහෝදර දේශපාලනඥයා කරන්නේ කුමක්දැයි බලාගෙනය.

පසුව ඕනෑකරන කෑම වර්ග අසාගෙන අවන්හලේ සේවකයෙක් අසලට ගිය ගැමි දේශපාලකයා කුකුළු මස් කෑම එකක් ඉල්ලුවේ කුකුළෙකු සේ හැසිරෙමින් කටින් කුක්කු කූ යැයි ශබ්ද නගමිනි. සියල්ලෝම පුදුම කරවමින් අදාළ සේවකයා මස් කෑම එකක් අදාළ ගැමි දේශපාලනඥයා වෙත ගෙනැත් දුන්නේය.

පසුව ඌරු මස් අවශ්‍ය වූ ඇමැතිවරයකු වෙත හෙළ ගැමි ඇමැතිවරයා කෑම ලබා ගෙන ඇත්තේ ඌරාගේ හඬ නංවා පෙන්වමිනි.

කතා නායකයා වූ නූගත් ගැමි දේශපාලනඥයා කෑම රස බලන ගමන් “මල්ලිලා උගත්කම තිබ්බට මදි තැනට සුදුසු නුවණත් පොඩ්ඩක් පාවිච්චි කරපල්ලා යැයි කීවේය. සිටි පිරිස සිනහ සාගරයක ගිල්වමිනි.

